# වාර්ෂික වාර්තාව 2024



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

# අන්තර්ගතය


1 අප ගැන
දැක්ම
මෙහෙවර
පාලක මණ්ඩලය

2 සභාපතිතුමියගේ පණිවිඩය

3 විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

5 අපගේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වල විෂය පථය

7 පර්යේෂණ ක්‍රියාකාරකම්

8 සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය

13 ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය

18 සංක්‍රමණය සහ නාගරීකරණය

21 දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය

24 කෘෂිකර්මාන්තය සහ කෘෂිකාර්මික ව්‍යාපාර සංවර්ධනය

27 පරිසරය, ස්වභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස

29 පර්යේෂණ කාර්ය මණ්ඩලය

31 සහාය කාර්යමණ්ඩලය

32 උපකාරක සේවා

32 මුදල් සහ පරිපාලනය

35 මූල්‍ය විශේෂ අවස්ථා - 2015 - 2025

36 සන්නිවේදන සහ මහජන සම්බන්ධතා තොරතුරු පද්ධති සහ පුස්තකාලය

37 2024 වර්ෂයේ ප්‍රකාශන

38 අභ්‍යන්තර සම්මන්ත්‍රණ

40 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සීමාවාසික වැඩසටහන 2024

41 මූල්‍ය වාර්තාව

# අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ තිබෙන ඉහළම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය වේ. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි සපයා දීම පිණිස ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අපගේ මෙහෙවර වේ.

දශක තුනකට අධික කාලයක් පුරා ස්වකීය ආයතනය විසින් සිදු කරන ලද විශිෂ්ඨ, ස්වාධීන පර්යේෂණ රාශිය නිසා ප්‍රතිපත්ති අධ්‍යයන අයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානයක් ලෙස පිළිගැනීමට ලක්වී තිබේ. මෙම ආයතනයෙහි පර්යේෂණ වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ සහ ආසියානු කලාපයේ වර්තමාන සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙයි. වාර්තා, පර්යේෂණ පත්‍රිකා, සඟරා ලිපි සහ ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් හරහා පුළුල්ව ප්‍රචාරණය කරනු ලබන ආනුභවික-පාදක පර්යේෂණ මගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට සහාය දීමේ ස්වකීය ජයග්‍රාහී වාර්තාව බිහි කිරීමට මූලික වූයේ මෙම ආයතනයේ ප්‍රබල අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි පරිපූර්ණ නිපුණත්වය යි.

## දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන, ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම.

## මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, තියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මගින් අපගේ පාර්ශවකරුවන්ව දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැස්වීම සහ එමගින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම.

# පාලක මණ්ඩලය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනෝමා අභයරත්න මහත්මිය**
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,

**ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා**
අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය,
භාණ්ඩාගාර ලේකම් වෙනුවට (නිල බලයෙන්)

**ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා**
අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය (නිල බලයෙන්)

**ආචාර්ය සී. අමරසේකර මහතා**
සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙනුවට (නිල බලයෙන්)

**මහාචාර්ය ආර්.එම්. අබේරත්න මහතා**
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,

**ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය**
විධායක අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

# සභාපතිතුමියගේ පණිවිඩය



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනෝමා අභයරත්න මහත්මිය**
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2024 වර්ෂයේ ජයග්‍රහණ ඉස්මතු කරමින් පළකරනු ලබන එහි වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ලිවීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි. ඵලදායී ප්‍රතිපත්ති තීරණ සකස් කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රබල, විශ්ලේෂණාත්මක සාක්ෂි සපයාදීම පිණිස උසස් තත්ත්වයේ, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙවර වේ. විවිධ ප්‍රතිපත්ති විකල්පවල ඇඟවීම් අවබෝධ කර ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින්ට උපකාර කිරීම සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණ සිදු කිරීමෙහි අභිප්‍රායය වේ.

2024 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය පර්යේෂණ ක්‍රියාකාරකම් හරහා ආයතනයේ මෙහෙවර අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් ඇති අතර, එම පර්යේෂණ මෙරට අනාගතය හැඩගස්වන සංකීර්ණ ගැටළු අවබෝධ කර ගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට මග පෙන්වීම පිණිස අත්‍යාවශ්‍ය වේ.

මෙම වසර තුළ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ න්‍යාය පත්‍රය මගින් ප්‍රතිපත්ති නොගැළපීම්, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සෞඛ්‍ය හා අධ්‍යාපනය යන අංශවල දුර්වල රාජ්‍ය සේවා සැපයීම, කුසලතා හිඟය, බලශක්ති පිරිවැය ඉහළ යාම සහ මූල්‍ය හා ඉඩම් වෙත ප්‍රවේශ වීම සම්බන්ධ බාධක සහ රටේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාළ අනෙකුත් ගැටළු වැනි වර්ධනයට බාධාකාරී වන තීරණාත්මක ගැටළු කෙරෙහි අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් දිනාගෙන තිබෙන බුද්ධි මණ්ඩලයක් වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ පාදක යෙදවුම් සපයා දීමේ සහ ස්වකීය පර්යේෂණ ප්‍රතිඵල සාමාන්‍ය ජනතාව අතර සහ ජාත්‍යන්තර ප්‍රජාව වෙත බෙදා දීමේ කාර්යභාරය අඛණ්ඩව සිදු කළේ ය. මෙම වසරේ සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල විවිධ වාර්තා, පොත්වල පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි ප්‍රකාශනවල මූලාශ්‍ර වී ඇත.

2022 වර්ෂයේ දී ඇති වූ මූල්‍ය අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2024 වර්ෂයේ දී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළේ ය. එම යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය මන්දගාමී වුවද, උද්ධමනය පහළ මට්ටමක පැවතීම සහ විනිමය අනුපාත ස්ථාවරව පැවතීම ඇතුළු ශක්තිමත් සාර්ව ආර්ථික මූලධර්ම මගින් මෙහෙයවනු ලබන ආර්ථික වර්ධනයෙහි සැලකිය යුතු වැඩිදියුණු වීමක් සිදු විය. 2023 වර්ෂයේ තුන්වන කාර්තුවේ දී මෙරට දළ දේශීය නිෂ්පාදිතය 1.6% ක වර්ධනයක් අත්කර ගත් අතර, එය අඛණ්ඩව කාර්තු හයක් පුරා සෘණ වර්ධනයක් වාර්තා වීමෙන් පසුව ධනාත්මක වෙනසක් සනිටුහන් කළේ ය. කෙසේ වෙතත්, දීර්ඝ කාලයක් පුරා පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් කුටුම්භ ආදායම සැලකිය යුතු ලෙස අඩු වූ බැවින්, පවුල්වලට ඔවුන්ගේ වියදම් පාලනය කර ගැනීමට, විශේෂයෙන් ම ආහාර සහ සෞඛ්‍ය සේවා වැනි අත්‍යාවශ්‍ය අවශ්‍යතා සඳහා දැරීමට සිදු වන වියදම් පාලනය කර ගැනීමට ඔවුන්ට සිදු විය. එමෙන්ම, ශ්‍රම වෙළඳපොළෙහි ඇතිවූ පසුබෑමත් සමග සිසුන් වැඩි සංඛ්‍යාවක් ශ්‍රම බලකායට ඇතුල් වනවාට වඩා අධ්‍යාපනයෙහි රැඳී සිටීමට තෝරා ගැනීම හේතුවෙන් රැකියා සෙවීමට ඇති අකමැත්ත සහ විදේශගත වීම ඉහළ ගියේ ය. මෙවැනි වර්ධනයන් ශ්‍රී ලංකාවේ ආර්ථික උපාය මාර්ගය සකස්වී ඇති පුළුල් සන්දර්භය, විශේෂයෙන් ම එහි ගෝලීය තරගකාරිත්වය සහ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීමේ ඉලක්ක සම්බන්ධ සංදර්භය නැවත හැඩගස්වනු ඇත.

මෙම අභියෝග සැලකිල්ලට ගනිමින් මෙම වර්ෂයේ දී "බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට" යන තේමාව යටතේ පළ කරන ලද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024" නැමති වාර්තාව මගින් රටේ වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයා දෙයි. ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝගවල පරිමාණය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට සහ රට ස්ථාවරත්වයේ සිට තිරසාර වර්ධනයක් සහ සමෘද්ධිමත් භාවයක් දක්වා වැඩිදියුණු කළ හැකි ආර්ථික උපාය මාර්ගයක් පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම මෙම වාර්තාවේ අරමුණ වේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2024 වර්ෂයේ දී අත්කර ගත් වැදගත් ජයග්‍රහණ සම්බන්ධයෙන් සුභපැතුම් එක්කිරීමටත්, ඒ සඳහා ආයතනයට නායකත්වය ලබා දුන්, ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මියට, දැඩි කැපවීමෙන් කටයුතු කරන පර්යේෂණ කණ්ඩායමට සහ පාලක මණ්ඩලයට, සහ අඛණ්ඩව සහයෝගය ලබා දෙමින් කැපවී කටයුතු කරන කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාට මාගේ කෘතඥතාවය පළ කිරීමටත් මම මෙය අවස්ථාව කර ගනිමි. අපි එකට එක්ව ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන් මගට අර්ථවත් ලෙස අපගේ දායකත්වය අඛණ්ඩව සපයා දෙන්නෙමු.

**අනෝමා අභයරත්න**
සභාපති, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

# විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව



ආචාර්ය දුෂ්නි වීරකෝන්

ශ්‍රී ලංකාවේ ආර්ථිකය පසුගිය වසර කිහිපය තුළ ඇති වූ බහුවිධ කම්පනයන් ගෙන් මිදීමට ප්‍රයත්න දරමින් සිටින මෙම අවස්ථාවේ, ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ළඟාකර ගැනීම සඳහා දරනු ලබන ප්‍රයත්නයන් මගින් විදේශ විනිමය ඉපැයීම් ඉහළ නංවා ගැනීම කෙරෙහි සහ දැනට සිදු කෙරෙමින් තිබෙන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ ප්‍රයත්නයන් කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කළ යුතු වේ. ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ළඟාකර ගැනීම සඳහා දරනු ලබන ප්‍රයත්නයන් ඉලක්ක කිරීම යන්නෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩි දියුණු කිරීම සඳහා අපනයන ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත සංක්‍රමණය සහ සංචාරක ව්‍යාපාරය සඳහා පහසුකම් සැලසීම අදහස් කෙරෙයි. වඩාත් වගකීමෙන් යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පසුබිමක් යන්නෙන් ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා සහ වියදම් සීමාකර ගැනීම සඳහා දරනු ලබන ප්‍රයත්නයන් අවදානමට ලක්වීමේ වැඩි හැකියාවක් සහිත අය ආරක්ෂා කර ගැනීම සහ අසමානාත්මතාවයන් නිරාකරණය කිරීම සඳහා වන ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළ කළමනාකරණය කර ගත යුතු ය යන්න අදහස් කෙරෙයි. වහාම ප්‍රමුඛතාවය ලබා දිය යුතු එම අංශ වලින් ඔබ්බට යමින්, සෞඛ්‍ය හා අධ්‍යාපනය යන අංශවල ගුණාත්මකභාවය සහ ප්‍රවේශය වැඩිදියුණු කළ යුතු බව සහ තාක්ෂණික දියුණුව හමුවේ රාජ්‍ය සේවාවන්හි ප්‍රමිතීන් ඉහළ නැංවිය යුතු බව ද එයින් අදහස් වෙයි. ජාතික ප්‍රතිපත්ති ප්‍රතිචාර වලට දේශගුණික විපර්යාස සහ අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් මෙහෙයවා ගැනීමට කටයුතු කරන අතර ම, අස්ථාවර ගෝලීය ආර්ථිකය සහ බාහිර අවිනිශ්චිතතා ඉහළ යාම සහ උත්සන්න වෙමින් පවතින භූ දේශපාලනික තරගකාරීත්වයවන් යන සාධක ද ඇතුළත් විය යුතු ය.

මෙම පද්ධතික සහ ව්‍යුහාත්මක අභියෝග ආමන්ත්‍රණය කිරීම පිණිස, ප්‍රතිපත්ති සම්පාදනයට මග පෙන්වන තියුණු සාක්ෂි සැපයීම සඳහා වූ ස්වාධීන, අපක්ෂපාතී සහ ශක්තිමත් අධ්‍යයන පර්යේෂණ සඳහා වැඩි අවශ්‍යතාවයක් තිබී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය තේමාත්මක ක්ෂේත්‍ර හයක් ඔස්සේ ගොඩනගා ඇති ස්වකීය මධ්‍ය කාලීන පර්යේෂණ න්‍යාය පත්‍රය මගින් ආවරණය කරනු ලබන පරිදි ආයතනයේ පර්යේෂණ මගින් මෙම අතිශය වැදගත් කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත. සාර්ව ආර්ථික සන්දර්භය, ආර්ථික වර්ධනය සහ ඵලදායිතාවය, ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ ක්‍රියාකාරිත්වය, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා සැපයීම සහ කුටුම්භ සහ නිෂ්පාදන අංශ පුරා පවතින විෂමතා වඩාත් හොඳින් කළමනාකරණය කර ගත හැකි ආකාරය පිළිබඳ ප්‍රතිපත්ති ගැටළු විශ්ලේෂණය කිරීමේ සිට පසුගිය වසර පුරා ඉටු කරන ලද අපගේ කාර්ය භාරය ක්ෂේත්‍ර ගණනාවක විවෘත සංවාදවල ඉතා වැදගත් වෙනසක් ඇති කර තිබේ.

- අපගේ පර්යේෂණ මගින් බදු ක්‍රමය විවිධ ආදායම් කාණ්ඩ වලට අයත් කුටුම්භ වලට ඇතිකරන බලපෑම සහ දුම්කොළ පරිභෝජනය සහ සීනි යොදන ලද පැණිබීම වර්ග මත බදු පැනවීම ඇතුළුව චක්‍රීය ප්‍රකෘතිමත් වීමක් උත්තේජනය කිරීමේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා මුදල් ප්‍රතිපත්තිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. කාර්මික ප්‍රතිපත්ති අනුගත කර ගැනීම ඉහළ යාමත් සමග, ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ හවුල්කාරිත්වයන්හි වෙළඳ බලපෑම් තක්සේරු කරමින්, ශ්‍රී ලංකාව විදුලි වාහන සැපයුම් ජාලවලට සම්බන්ධ වීමේ විභවය ද විමසා බලන ලදී.
- ශ්‍රම බලකායට කාන්තාවන් වැඩිවශයෙන් සහභාගීවීම දිරිමත් කිරීම කෙරෙහි බලපෑමක් ඇතිකරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් බාධක මැඩපවත්වා ගැනීමේ අතිශය වැදගත් කරුණ ඇතුළුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොළට සහ ශ්‍රම ඵලදායිතාවයට බලපාන බාධක කෙරෙහි ප්‍රධාන අවධානයක් යොමු කරන ලදී. සේවකයින් විදේස් රටවලට සංක්‍රමණය වීම ඉහළ යාමත් සමග ශ්‍රම වෙළඳපොළ තත්වයන් දැඩි වන විට, ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන අවශ්‍යතා කෙරෙහි ඇතිවන බලපෑම අවබෝධ කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී.
- දරිද්‍රතාවය දෙගුණයක් වී ඇති බවට ඇස්තමේන්තු කර තිබෙන තත්ත්වය සැලකීමේ දී, සමාජ ආරක්ෂණය ඵලදායී ලෙස ලබා දීම අන් කිසිදු දිනෙක මෙතරම් වැදගත් වී නැත. අපගේ පර්යේෂණ මගින් පෞද්ගලික අංශයේ සමාජ ආරක්ෂණ පද්ධති ද නැවත හැඩගස්වීමට අපේක්ෂා කරන ලද අනෙකුත් අධ්‍යයන සමග රජයේ වැඩිදියුණු කරන ලද සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ වන අස්වැසුම වැඩසටහනෙහි කාර්යක්ෂමතාවය තක්සේරු කරන ලදී.
- දේශගුණික විපර්යාසවල යථාර්ථයන් සහ ජනගහනයේ විවිධ කණ්ඩායම් අතර එයින් ඇතිකරන අති මහත් බලපෑම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතින පර්යේෂණ පරාසය තුළින් පිළිබිඹු වෙයි. දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා ගොවීන් විසින් ගනු ලබන තීරණවලට බලපාන සාධක, සෞඛ්‍ය ප්‍රතිඵල සහ සෞඛ්‍ය සේවා භාවිතය කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම මෙන්ම දේශගුණික විපර්යාස වලට අදාළව සිදුකරනු ලබන වියපැහැදම් පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචනයක් සිදු කිරීම ආයතනයේ ප්‍රධාන විශ්ලේෂණ ක්ෂේත්‍ර කිහිපයක් වේ.


මෙම මාතෘකා සහ අනෙකුත් මාතෘකා පිළිබඳ සියුම් අවබෝධයන් සපයා දෙන විශ්ලේෂණ සපයා දීමේ අපගේ වාර්තාව පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා වන අපගේ මූලික කැපවීම තුළ මුල් බැස ගෙන ඇත. අපගේ ප්‍රකාශන බාහිර සමාලෝචකයින් ද ඇතුළුව සමානයින් විසින් සිදු කරනු ලබන සමාලෝචන ඇතුළත් දැඩි සමාලෝචන ක්‍රියාවලියකට භාජනය වෙයි.

එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් 'ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වය' වැනි ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ හවුල්කරුවන් සමග එක්ව ප්‍රකාශන පළ කරන ලදී. 'ෆොරීන් පොලිසි', 'ප්‍රොජෙක්ට් සින්ඩිකේට්' සහ 'ඊස්ට් ඒසියා ෆෝරම්' වැනි ප්‍රමුඛතම ගෝලීය සහ කලාපීය ප්‍රතිපත්ති වේදිකා විසින් අපගේ අදහස් ලබා ගන්නා ලදී. දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද පවත්වන බොහෝ සම්මන්ත්‍රණ සහ සමුළුවල ඉදිරිපත් කරන්නන් සහ විද්වත් මණ්ඩල සාමාජිකයන් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින්ගේ සහභාගීත්වය ලබා දෙන ලෙස බොහෝ ඉල්ලීම් ලැබුණි.

එයට අමතරව, ලොව පුරා තිබෙන පර්යේෂණ සංවිධාන සමග හවුල්කාරිත්වයන් ගොඩනගා ගනිමින්, පර්යේෂණ සිදු කිරීමේ දී සහයෝගීත්වයෙන් යුතුව කටයුතු කිරීම මගින් මෙන්ම ඒකාබද්ධ ප්‍රතිපත්ති නියැළීම් ඉදිරියට ගෙන යාම මගින් අපි සාර්ථක ප්‍රගතියක් අත්කර ගෙන ඇත්තෙමු. ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටු ගණනාවකට සම්බන්ධ වීම තුළින් අපට ශ්‍රී ලංකා රජය සඳහා විශ්ලේෂණාත්මක සහාය සහ සියුම් පර්යේෂණ අවබෝධයන් ලබා දීමට හැකි වීම වඩාත්ම වැදගත් කරුණ වේ. ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම් වලට සම්බන්ධවීම පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජිත වැඩපිළිවෙළ විශ්ලේෂණය කිරීම සඳහා වෙළඳ කටයුතු සාකච්ඡා කිරීමේ කමිටුවට සහභාගී වීම, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සඳහා රාජ්‍ය වියදම් සමාලෝචනය සපයා දීම, රැකියා ප්‍රතිපත්තිය සඳහා සංක්‍රමණය වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්මට යෙදවුම් සපයා දීම, සහ ආහාර සහ පෝෂණ ආරක්ෂණ කමිටුවට නියාමන මැදිහත්වීම් සපයා දීම මෙයට ඇතුළත් විය. එයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වැනි ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල ද අපව නියෝජනය කරන ලදී. සමාලෝචිත වර්ෂයේ අපගේ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ ඉතිරි කොටසේ ඉදිරිපත් කර ඇත.

2024 වර්ෂයේ තුන්වන කාර්තුව වන විට නව රජයක් ක්‍රියාත්මක වීමත් සමග ශ්‍රී ලංකාව රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ කැපවීම් ඉටුකිරීම සඳහා නැවත වරක් නව ගමන් පථයක් සකස් කරනු ඇති අතර, එයට අනුකූල වන ලෙස අපගේ පර්යේෂණ න්‍යාය පත්‍රය නැවත සකස් කරනු ලැබේ. 2025 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය මෙහෙයුම් සිදු කිරීමේ 35 වන වර්ෂයට පියවර තබන අතර, ශ්‍රී ලංකාවේ වඩාත්ම හදිසි සමාජ ආර්ථික අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා අදහස් සහ සාක්ෂි ජනනය කිරීමේ ප්‍රමුඛයා ලෙස අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

සත්‍ය වශයෙන් ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශක්තිමත් හා කැපවීමෙන් යුතු කණ්ඩායමෙහි කැපවීම නිසා මෙම සියලු කාර්යයන් ඉටු කිරීම හැකිවී තබේ. ඔවුන් සියලු දෙනාට ස්තූතිය පුද කිරීමටත්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපති මහාචාර්ය අනෝමා අභයරත්න මහත්මිය සහ අනෙකුත් සියලුම සාමාජිකයින් ලබා දෙන සහයෝගය සහ ක්‍රියාකාරී දායකත්වය වෙනුවෙන් එම සියලු දෙනාට මාගේ කෘතඥතාවය පළ කිරීමටත් මම මෙය අවස්ථාව කර ගනිමි.



**දුෂ්නි වීරකෝන්**
විධායක අධ්‍යක්ෂ

# අපගේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වල විෂය පථය


*සංවර්ධන අභියෝග සඳහා වන නිර්මාණාත්මක සහ තිරසාර විසඳුම් වැඩිදියුණු කිරීම සඳහා අපි කලාපීය හවුල්කරුවන් සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය චිරන්දතී පතිරාජ,** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ඒකාබද්ධ කඳුවැටි සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, සහ සංවර්ධන හා පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ දකුණු ආසියානු ජාලය විසින් පවත්වන ලද "දකුණු ආසියාවේ කාබන් අවම කිරීමේ සහ ස්වභාව ධර්මය පදනම් කරගත් විසඳුමක් ලෙස වනාන්තර ප්‍රතිසංස්කරණය කිරීමේ ආර්ථිකය: නේපාලය, බංග්ලාදේශය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල සාක්ෂි" යන මාතෘකාව යටතේ වූ අධ්‍යයනයක් සඳහා පර්යේෂකයින් කණ්ඩායමක් මෙහෙයවූවාය.



*සාම්ප්‍රදායික නොවන දත්ත මූලාශ්‍ර ග්‍රහණය කර ගැනීම සඳහා වන අපගේ පර්යේෂණ ප්‍රවේශයන් තුළ අපි සක්‍රීය වන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය බිලේෂා වීරරත්න** 2024 අගෝස්තු මාසයේ දී පකිස්තානයේ ලාහෝර් ආර්ථික විද්‍යා පාසලේ මහාචාර්ය නස්රා ෂා විසින් සංස්කරණය කරන ලද "සමාජ ප්‍රේෂණ සහ සමාජ පරිවර්තනය: ආසියාව සහ මැද පෙරදිග කලාපය කෙරෙහි අවධානය යොමු කිරීම" නැමති මාතෘකාව යටතේ පළ කරන ලද ප්‍රකාශනයක් සඳහා "සමාජ ප්‍රේෂණ සහ සමාජ මාධ්‍ය: ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුද අතරතුර සාක්ෂි" යන මාතෘකාව යටතේ පරිච්ඡේදයක් රචනා කළාය.






*ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා සාධාරණ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම පිණිස කාලීන විශ්ලේෂණ සහ උපදේශන සපයාදීම සඳහා වන පර්යේෂණවලට අපි අරමුදල් සපයන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියංකා ජයවර්ධන**, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අරමුදල් සපයන ලද "ශ්‍රී ලංකාවේ ආදායමට සාපේක්ෂව බදු අනුපාත වැඩිවීම සහ බදු තුළින් දරිද්‍රතාවය අඩුවීම සහ සුභසාධන වියදම්" පිළිබඳ විශ්ලේෂණයක් සිදු කළාය. මෙම විශ්ලේෂණය පදනම් කර ගෙන 2024 දෙසැම්බර් මාසයේ දී Development Asia නැමති වේදිකාවෙහි "ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප්වල මූල්‍ය බර" පිළිබඳ ලිපියක් පළ කරන ලදී.







*අපගේ පර්යේෂණය මගින් සාම්ප්‍රදායික ගැටළු සඳහා නවීන විසඳුම් ගවේෂණය කරන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය ලක්මිණී ප්‍රනාන්දු** 2024 ඔක්තෝබර් මාසයේ පැවති 'ආසියානු බුද්ධි මණ්ඩල ජාල සංසදයේ' දී භූගෝලීය කලාප සහ ආදායම් මට්ටම් පුරා ශ්‍රම ඵලදායිතාවය කෙරෙහි ඩිජිටල් ක්‍රම අන්තර්ගත කිරීමෙහි බලපෑම් ගවේෂණය කළාය.






*සංවර්ධනයේ හිදැස් පියවීම සඳහා තාක්ෂණයේ දියුණුව උපයෝගී කර ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස අපි කලාපීය සහයෝගීතා ගොඩනගන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය නිශා අරුණතිලක**, "ආසියාවේ සහ මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගැනීමෙහි තත්ත්වය සහ අභියෝග" ඇගයීම සඳහා සහ අධ්‍යාපන සංවර්ධනයේ අඛණ්ඩව පවතින අඩුපාඩු වලට තාක්ෂණය පදනම් කරගත් විසඳුම් සොයා ගැනීම සඳහා සිදු කරන ලද කලාපීය අධ්‍යයනයක් මෙහෙයවූවාය.





*දේශගුණික විපර්යාස හේතුවෙන් මතුවන ප්‍රතිපත්ති අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීමට සහ එමගින් සොයාගන්නා කරුණු බෙදා හැරීමට අපි විශාල දත්ත භාවිතා කරන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය පුලස්ති අමරසිංහ** පෙබරවාරි 15 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පැවති "කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස" නැමති වැඩමුළුවේදී "දේශගුණික විපර්යාස, අනුවර්තනය සහ ග්‍රාමීය ශ්‍රී ලංකාවේ ජීවනෝපායයන්" පිළිබඳ ඒ මහතාගේ සොයාගැනීම් ඉදිරිපත් කළේය. 'ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතා සහ බලපෑම්' නැමති වැඩසටහන යටතේ මෙම පර්යේෂණය සිදු කරන ලදී.





# අපගේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම්වල විෂය පථය

*සංවර්ධනයට බාධා කරන අඛණ්ඩ ප්‍රතිපත්ති ගැටළු අපි ආමන්ත්‍රණය කරන්නෙමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ සුනිමලී මධුරාවල** 2024 ජුනි මාසයේ දී නේපාලයේ පැවති එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදලේ (යුනිසෙෆ්) කලාපීය රැස්වීමේ දී ජනගහනයේ සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා යහපත් ආහාර පරිසරයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ දැනට සිදුකෙරෙමින් පවතින අධ්‍යයනයක් පදනම් කරගෙන කුඩා ළමයින් සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර රටා ප්‍රවර්ධනය කිරීමේදී ඇතිවන ප්‍රධාන අභියෝග ඉස්මතු කළා ය.






*විවිධ අර්බුද නිසා ඇති වන පොදු ගැටළු විසඳීමේ ක්‍රම සාකච්ඡා කිරීම සඳහා අපි ගෝලීය හවුල්කාරිත්වයන් ස්ථාපනය කරන්නෙමු*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය ගංගා තිලකරත්න** මානව සංවර්ධනය පිළිබඳ ආයතනය සහ 'සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති' නැමති සංවිධානය ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ඉන්දියානු රජයේ NITI Aayog සමග හවුල්කාරිත්වයෙන් යුතුව සංවිධානය කරන ලද 'ගෝලීය දකුණේ මානව සංවර්ධනය දියුණු කිරීම' පිළිබඳ ගෝලීය සමුළුවේදී 'ශ්‍රී ලංකාවේ බහුවිධ අර්බුද මධ්‍යයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳ හා තිබෙන අභියෝග සහ අවස්ථා පිළිබඳව සාකච්ඡා කළා ය.






*ඉතාමත් තීරණාත්මක කරුණු පිළිබඳ අපගේ සාක්ෂි මත පදනම් වූ 'අදහස් ලිපි' ඉහළ පෙළේ ගෝලීය සහ කලාපීය වේදිකා විසින් අගය කරනු ලැබේ.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන්** 2024 නොවැම්බර් මාසයේ දී "ෆොරීන් පොලිසි" සඟරාව සඳහා "ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයේ සිට සාමකාමී සංක්‍රාන්තියක් වෙත ගමන් කළ ආකාරය" පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළා ය. 2024 අප්‍රේල් මාසයේ දී "ඊස්ට් ඒසියා ෆෝරම්" සඳහා ලියන ලද ලිපියක් මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන නිර්දේශ ඉදිරිපත් කළා ය.









*ග්‍රාමීය ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා අපි නව්‍ය ගොවිතැන් ක්‍රම ප්‍රවර්ධනය කරමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව** 2024 මාර්තු මාසයේ දී 'පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ අඹ සහ තක්කාලි අගය දාමවල සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා ආහාර පාඩු අඩු කිරීමේ මාර්ග සකස් කිරීම' පිළිබඳ ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ ව්‍යාපෘතිය මෙහෙයවූයේය.





*අපි නව ගෝලීය අවස්ථාවලින් ප්‍රයෝජන ගන්නා වෙළඳ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරමු.*

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය අසංක විජේසිංහ** 2024 මාර්තු මාසයේ දී 'විදුලි වාහන සැපයුම් දාමවල වෙළඳ යුද්ධ: ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වාසියක්ද?' නැමති ප්‍රකාශනය එළිදැක්වීමේ උත්සවයේ දී, රජයේ සහ පෞද්ගලික අංශයේ විවිධ පාර්ශ්වකරුවන් කණ්ඩායමක් සමග විද්‍යුත් වාහන භාවිතය සහ එක්සත් ජනපදයේ හරිත කාර්මික ප්‍රතිපත්තිය මගින් මෙහෙයවනු ලබන මිනිරන් සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුමෙන් ශ්‍රී ලංකාවට ප්‍රයෝජන ගත හැකි ආකාරය සාකච්ඡා කළේය.






*අපි අපගේ උරුමය ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටින්නෙමු.*

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ඩිලනි හිරිමුතුගොඩගේ, 2024 පෙබරවාරි මාසයේ දී 'එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය - ශ්‍රී ලංකාව' විසින් සංවිධානය කරන ලද "කුළුබඩු දිගන්තයන්: ශ්‍රී ලංකා කුරුඳුවල ආරක්ෂිත භූගෝලීය දර්ශක සහ අපනයන සංවර්ධනය සඳහා අනෙකුත් ආරක්ෂිත භූගෝලීය දර්ශක නිෂ්පාදනවල අනාගතය" නැමති සැසියේ විද්වත් මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළා ය.






# පර්යේෂණ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රතිපත්ති පසුබිම තුළ ප්‍රතිපත්ති තීරණ සඳහා වැදගත් වන ප්‍රබල විශ්ලේෂණාත්මක සාක්ෂි සපයා දීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විවිධ ප්‍රතිපත්ති විකල්පවල ඇඟවීම් අවබෝධ කර ගැනීම සඳහා උපකාර කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කාර්ය භාරය වේ. අනෙකුත් ගැටළු අතර, ප්‍රතිපත්ති අනනුකූලතාවයන්, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම, සෞඛ්‍ය හා අධ්‍යාපනය අංශවල දුර්වල රාජ්‍ය සේවා සැපයීම, කුසලතා හිඟය, ඉහළ යමින් පවතින බලශක්ති පිරිවැය සහ මූල්‍ය හා ඉඩම් වෙත ප්‍රවේශ වීමේ බාධක වැනි වර්ධනය කෙරෙහි බලපාන ඉතාමත් තීරණාත්මක අවහිරතා පිළිබඳ දැඩි විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණ ඇතිව, ආදායමෙහි සහ ධනයෙහි නිරන්තර අසමානතාවයන්, පරිසර හානිය සහ ස්වභාවික සම්පත් හායනය වීම, වැඩිහිටියන්ගේ සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි ජනගහනයේ යහපැවැත්ම යනාදියට අදාළව ප්‍රධාන ආර්ථික සංකල්ප, ආකෘති සහ දර්ශක අඛණ්ඩව සමාලෝචනය කළ යුතු වේ.

ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රය රටේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මෙම ගැටලු ආමන්ත්‍රණය කරයි. ආයතනයේ ක්‍රියාකාරම් වැඩසටහන මගින් විවිධ පර්යේෂණ මාතෘකා පිළිබඳ ගවේෂණය කරන මූලික තේමා ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. එම තේමා ක්ෂේත්‍ර හයෙන් එක් එක් තේමා ක්ෂේත්‍රය යටතේ 2024 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ අප විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත සාරාංශ කර ඇත.

# සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය

තිරසාර ආර්ථික ප්‍රකෘතිමත්වීමට සහාය වීම අරමුණු කරගත් ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා, බාහිර ණය කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය අංශයේ සම්පත් උපයෝජනය වැඩි දියුණු කිරීම ඉතා වැදගත් වේ. රාජ්‍ය ආයෝජන සහ රජය සතු ව්‍යවසායන්හි කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම මෙයට ඇතුළත් වේ. එයට අමතරව, වෙළඳ ප්‍රතිසංස්කරණ සහ කෘෂිකර්මාන්තයේ සහ විදුලිය වැනි රාජ්‍ය උපයෝගිතා වල වඩා හොඳ මිලකරණ පද්ධති හරහා ආර්ථික දිරිගැන්වීම් වැඩිදියුණු කිරීම තිරසාර වර්ධනයක් පෝෂණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. 2024 වර්ෂයේ දී, සාර්ව ආර්ථික විද්‍යාව, වෙළඳාම සහ තරඟකාරිත්වය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන මගින් මෙම ප්‍රධාන ධාවක කෙරෙහි අවධානය යොමු කරන ලදී.

## සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

ලෝක ආර්ථික සංසදය (WEF) විසින් පළකරනු ලබන වාර්ෂික ප්‍රකාශනයක් වන **විධායක අදහස් සමීක්ෂණය: ගෝලීය තරගකාරීත්ව වාර්තාව** සම්පාදනය කිරීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එය සම්පූර්ණ කර සහයෝගීත්වය දැක්වූ අතර, රටක ආර්ථික ඵලදායිතාවයට සහ කාර්යක්ෂමතාවයට බලපාන ආයතන, ප්‍රතිපත්ති සහ අනෙකුත් සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික මූලිකාංග පිළිබඳ ඇගයීමක් සිදු කළේය. 2012 වර්ෂයේ සිට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම දර්ශකය සකස් කිරීමට දායක වීම සඳහා ලෝක ආර්ථික සංසදය සමග හවුල්කාරීත්වයෙන් කටයුතු කර ඇත. 'බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට' යන තේමාව යටතේ පළ කරන ලද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික ප්‍රකාශනය වන '**ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024**' වාර්තාව මගින්, ආර්ථික වර්ධනයෙහි මන්දගාමී, එහෙත් ස්ථාවර වර්ධනයක් සිදුවන බවට සලකුණු පෙන්නුම් කරන අතර ම, ඉදිරි අභියෝගවල පරිමාණය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රමය, අධ්‍යාපනය, සංක්‍රමණය සහ සමාජ ආරක්ෂණය ඇතුළු අනෙකුත් ගැටළු සවිස්තරාත්මකව විමසා බලන ලදී.

ආසියා පදනම විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රී ලංකාවේ පළාත් නවය පුරා දිස්ත්‍රික්ක 25 තුළ ආර්ථික පාලන දර්ශකය ක්‍රියාත්මක කිරීම** පිළිබඳ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ උපජාතික මට්ටමේ පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය, අන්තර්කරණය, ඔරොත්තු දීමේ හැකියාව සහ වගවීම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එය ආසියා පදනම විසින් අරමුදල් සපයනු ලබන "ශ්‍රී ලංකාවේ පාලනය ශක්තිමත් කිරීම" නැමති වැඩසටහනට ද අනුකූල වේ.

ගාමණී කොරෙයා පදනම විසින් අරමුදල් සපයන ලද "**ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ආර්ථිකයේ ආර්ථික සැලසුම්කරණය: යහ පාලනය සහ ජීවන තත්ත්වය**" නැමති තවත් අධ්‍යයනයක් මගින් "ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි දේශපාලන නායකත්වයේ සහ පාලනයේ ගුණාත්මකභාවයේ බලපෑම කුමක්ද?" යන ප්‍රශ්නයට පිළිතුරු දීම පිණිස ආර්ථික සැලසුම්කරණය සහ සංවර්ධන ගමන් පථය අතර සම්බන්ධතාවය ගවේෂණය කළේ ය. එක්සත් රාජධානයේ කැන්සර් රිසර්ච් / එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සමග එක්ව සිදු කරන ලද ශ්‍රී ලංකාවේ දුම්කොළ ජාවාරම: විෂය පථය හඳුනා ගැනීමේ අධ්‍යයනයක් නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ දුම්කොළ ජාවාරම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීමට සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පෝෂණය කිරීම සඳහා එම ජාවාරම නියාමනය කිරීමේ ඵලදායී ක්‍රම හඳුනා ගැනීමට අරමුණු කරන ලදී.

## වෙළඳාම සහ කලාපීය ඒකාබද්ධතාවය

අධ්‍යයන දෙකක් සම්පූර්ණ කරන ලදී. පූර්ව බලපෑම් තක්සේරුවක් හරහා සිදු කරන ලද ව**රණීය වෙළඳ ගිවිසුම්වල ප්‍රාක්-සිද්ධික ආර්ථික ඇගයීම** මගින් පාර්ශ්වකරුවන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට වරණීය වෙළඳ ගිවිසුම් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වටිනා තොරතුරු සපයා දෙන ලදී. සම්පූර්ණ කරන ලද තවත් අධ්‍යයනයක් වූ **ශ්‍රී ලංකාව යුරෝපා සංගමය වෙත සිදු කරන අපනයනය සඳහා GSP+ සහනය ඉවත් කිරීම මගින් ඇතිවන බලපෑම** නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාව යුරෝපා සංගමය වෙත සිදු කරන අපනයනය සඳහා GSP+ සහනය ඉවත් කිරීමේ කල්පිත තත්ත්වයක් තුළ ඇති විය හැකි බලපෑම පිළිබඳ පූර්ව බලපෑම් ඇගයීමක් සහ දළ අපනයන සහ ගෝලීය අගය දාමයට සහභාගීවීම කෙරෙහි GSP+ යෝජනා ක්‍රමයෙන් ඇතිවන බලපෑම් ඇගයීම කිරීම සඳහා පශ්චාත්-සිද්ධික බලපෑම් ඇගයීමක් සිදු කරන ලදී.

ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන **දකුණු ආසියාවේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ කලාපීය ඒකාබද්ධතාවය** නැමති අධ්‍යයනය මගින් දකුණු ආසියාවේ සමාන ප්‍රතිලාභ බෙදා ගැනීම සහතික කරන වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනයක් සඳහා කලාපීය ඒකාබද්ධතාවයෙහි තිබෙන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මානය විමර්ශනය කරයි.

## ආයෝජන සහ මූල්‍යය

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන **තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරගෙන යාම** පිළිබඳ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වන විවිධ අවස්ථා විමසා බලනු ලබන අතර, අරමුදල් පරතරය පියවා ගැනීම සඳහා ඇති විභව මූල්‍යකරණ උපකරණ සහ විකල්ප ගවේෂණය කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සමුළුව සමග සිදු කරනු ලබන **හරිත නව ගනුදෙනුවක් සඳහා සම්පත් ඒකරාශි කිරීම: කොරෝනා වයිරස යුගයේ ක්‍රියාකාරී දශකයක් සඳහා ආසියාවේ හවුල්කාරිත්වයන්** නැමති තවත් අධ්‍යයනයක් මගින් රෙදිපිළි කර්මාන්තය වඩාත් තිරසාර පරිචයයන් වෙත, විශේෂයෙන් කෘතිම අමුද්‍රව්‍ය භාවිතය සඳහා මාරු කරන්නේ කෙසේද යන්න ගවේෂණය කරයි.

සංවර්ධනය විශ්ලේෂණය කිරීමේ කණ්ඩායම සඳහා සිදු කරන ලද **අන්තර්කරණය වූ සංවර්ධනය සඳහා තිරසාර ණය ගැනීම** පිළිබඳ ව්‍යාපෘතිය මගින් ගෝලීය දකුණේ තිරසාර ණය ගැනීම සහ අන්තර්කරණය වූ සංවර්ධනයට සහාය වන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ සැපයීමට අරමුණු කරයි. හොංකොං නුවර පිහිටි "පරිත්‍යාගශීලීත්වය සහ සමාජය පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය" සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන "**යහපත කිරීමේ දර්ශකය 2024**" නැමති තවත් ව්‍යාපෘතියක් මගින් පරිත්‍යාගශීලීත්වය සහ සමාජය පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන 'යහපත කිරීමේ දර්ශකය 2024' නැමති අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමට අරමුණු කරයි. පරිත්‍යාගශීලීත්වය සහ සමාජය පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය යනු ආසියාවේ පුද්ගලික සමාජ ආයෝජනවල ප්‍රමාණය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කැපවී සිටින, ක්‍රියාමාර්ග ඉලක්ක කර ගත් පර්යේෂණ සහ උපදේශන සංවිධානයක් වේ.

## කර්මාන්ත සහ ව්‍යවසායකත්වය

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් අරමුදල් සපයන ලද ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආරම්භක ව්‍යාපාර සඳහා සහාය දක්වන ආයතන සිතියම්ගත කිරීම නැමති අධ්‍යයනයක් මගින් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආරම්භක ව්‍යාපාර සඳහා සේවා සපයන්නන් පිළිබඳව විමර්ශනයක් සිදු කරන ලදී. එමගින් මෙම ආයතන විසින් සපයා දෙනු ලබන බුද්ධිමය දේපළ සේවාවන් කෙරෙහි අවධානය යොමු කරන ලද අතර, ශ්‍රී ලංකාවේ නව්‍ය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ආරම්භක ව්‍යාපාර සඳහා තිබෙන බුද්ධිමය දේපළ සහාය සේවාවල ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව සොයා බලන ලදී.

### ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.







- **ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024 - බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට**, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2024 ඔක්තෝබර්.
- **විදුලි වාහන සැපයුම් දාමවල වෙළඳ යුද්ධ: ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වාසියක්ද?**, ජාත්‍යන්තර පර්යේෂණ මාලා අංක 17, අසංක විජේසිංහ, මලීෂා වීරසිංහ සහ චායා දිසානායක, මාර්තු, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- **ශ්‍රී ලංකාව: 1948 සිට ආර්ථිකයේ ප්‍රධාන වර්ධනයන්**, ඩී. ජයසූරිය (සංස්.) '75 දී ශ්‍රී ලංකාව: දුර්වල ජාතියක තෘප්තියෙහි උවදුරු', හර්-ආනන්ද් ප්‍රකාශන, නවදිල්ලිය (දුෂ්නි වීරකෝන්).







- **ශ්‍රී ලංකාවේ භූගෝලීය දර්ශක පද්ධතිය සඳහා අත්පොත** (පරිච්ඡේද තුනක්), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රකාශනයක්, නොවැම්බර් (ඩිලනි හිරිමුතුගොඩගේ).
- **ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙහි සිට සාමකාමී සංක්‍රාන්තියක් වෙත ගමන් කළ ආකාරය**. ෆොරින් පොලිසි, වොෂින්ටන්, ඩී.සී., නොවැම්බර්, (දුෂ්නි වීරකෝන්).
- **මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකාවේ කඩාවැටුණු ආර්ථිකය කොහේටද**. ඊසියාලින්ක්, මෙල්බර්න් විශ්වවිද්‍යාලය, ඔක්තෝබර් (දුෂ්නි වීරකෝන්).
- **"GSP+ නොමැතිව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කුමක් සිදුවේවිද?**, ශ්‍රී ලංකාවේ යුරෝපා වාණිජ මණ්ඩලයේ යුරෝලින්ක් සඟරාව, ජූලි. (අසංක විජේසිංහ, චායා දිසානායක සහ රශ්මි අනුපමා)
- **ශ්‍රී ලංකාවට ප්‍රවේශම් සහගත වර්ධන ගමන් මගක් අවශ්‍යයි.** ඊස්ට් ඒසියා ෆෝරම්, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය, අප්‍රේල්, දුෂ්නි වීරකෝන්.
- **මැතිවරණ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය කෙරෙහි අවිනිශ්චිතතාවයේ සෙවනැල්ලක් ඇතිකරයි**, ඊස්ට් ඒසියා ෆෝරම්, ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය, ජනවාරි, (දුෂ්නි වීරකෝන්).

### ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගීවීම හරහා යෙදවුම් සපයා දෙන ලදී:

- සංඛ්‍යාලේඛන සකස් කිරීම සඳහා වන ශ්‍රී ලංකා උපාය මාර්ගය පිළිබඳ මෙහෙයුම් කමිටුව, මුදල් අමාත්‍යාංශය.
- ජාතික එලදායිතා කොමිෂන් සභාව පිළිබඳ විශේෂඥ කමිටුව, ජනාධිපති ලේකම් කාර්යාලය.
- කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය පිළිබඳ විශේෂඥ කණ්ඩායම, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ශ්‍රී ලංකාව සඳහා කෘතිම බුද්ධිය සම්බන්ධ උපාය මාර්ගයක් සකස් කිරීමේ කමිටුව 2023-2028, ජනාධිපති ලේකම් කාර්යාලය.
- පර්යේෂණ අධීක්ෂණ කමිටුව, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.

- දෙසැම්බර් 17-18 දිනවල තායිලන්තයේ බැංකොක් නුවර පැවති 'එක්සත් ජාතීන්ගේ ආසියා පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසම' විසින් සංවිධානය කරන ලද "හතර වන සංවර්ධනය සඳහා ජාත්‍යන්තර මූල්‍යකරණය පිළිබඳසමුළුව සඳහා ඉහළ මට්ටමේ කලාපීය උපදේශනය" නැමති සමුළුවේ **සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ බහු පාර්ශ්වකරුවන්ගේ සංවාදය** පිළිබඳ සැසියකදී කථිකයෙකු ලෙස කටයුතු කිරීම (දුෂ්නි වීරකෝන්).
- දෙසැම්බර් 16 වන දින තායිලන්තයේ බැංකොක් නුවර පැවති එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධනය පිළිබඳසමුළුව සහ එක්සත් ජාතීන්ගේ ආසියා පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසම විසින් සංවිධානය කරන ලද "හරිත සංක්‍රාන්තිය සඳහා මූල්‍යය සැපයීම සහ ක්‍රියාත්මක කිරීම: ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති අත්‍යාවශ්‍යතා" නැමති වැඩමුළුවේදී **හරිත සංක්‍රාන්තියට සහාය දීම සඳහා කාර්මික ප්‍රතිපත්ති** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).
- දෙසැම්බර් 16 වන දින තායිලන්තයේ බැංකොක් නුවර පැවති එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධනය පිළිබඳසමුළුව සහ එක්සත් ජාතීන්ගේ ආසියා පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසම විසින් සංවිධානය කරන ලද "හරිත සංක්‍රාන්තිය සඳහා මූල්‍යය සැපයීම සහ ක්‍රියාත්මක කිරීම: ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති අත්‍යාවශ්‍යතා" නැමති වැඩමුළුවේදී **හරිත සංක්‍රාන්තියට සහාය දීම සඳහා කාර්මික ප්‍රතිපත්ති** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).
- දෙසැම්බර් 11-13 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති, 'වෙළඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය පිළිබඳ දකුණු ආසියානු නිරීක්ෂණය' ආයතනය විසින් සංවිධානය කරන ලද 'පහළොස්වන දකුණු ආසියානු ආර්ථික සමුළුව: දකුණු ආසියාවේ සාධාරණ හරිත පරිවර්තනයකට ඉඩ සැලසීම' නැමති සමුළුවේ '**දේශගුණික ක්‍රියාකාරී කාලයක වෙළඳ සහ කර්මාන්ත ප්‍රතිපත්ති**' පිළිබඳ සැසියක විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).
- 'ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කොරියානු ආයතනයේ දිල්ලි නුවර කාර්යාලය' විසින් සංවිධානය කර, "දකුණු ආසියාවේ ආර්ථික සහ ව්‍යාපාරික අවස්ථා වෙනස්වීම: කොරියාවේ කලාපීය සම්බන්ධතා ශක්තිමත් කිරීම" යන තේමාව යටතේ නොවැම්බර් 22 වෙනි දින ඉන්දියාවේ පවත්වන ලද 'ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳකොරියානු ආයතනයේ' 2024 සංචාරක විද්වතුන්ගේ වැඩමුළුවේ දී "**ශ්‍රී ලංකාවේ ආර්ථික සහ ව්‍යාපාරික අවස්ථා වෙනස්වීම**" පිළිබඳ ඉදිරිපත් කිරීම, (අසංක විජේසිංහ).
- නොවැම්බර් 22 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කර බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද 'බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථාන අදහස් උළෙල්දී' **ගාමිණී කොරෙයා අතීතාවර්ජනය** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).



- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර, **දැනුම බෙදාගැනීම සහ සිදුවීම් ජාලකරණය: බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට**' නැමති මාතෘකාව යටතේ ඔක්තෝබර් 8 වෙනි දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආචාර්ය සමන් කැලේගම ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024' වාර්තාව එළිදැක්වීමේ අවස්ථාව. (දුෂ්නි වීරකෝන්).
- අගෝස්තු 30 වන දින Zoom තාක්ෂණය ඔස්සේ ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ සේවා ආයතනයේ දකුණු සහ මධ්‍යම ආසියානු කලාප අධ්‍යයන වැඩසටහන විසින් සත්කාරකත්වය දරන ලද **ශ්‍රී ලංකාවේ ආර්ථිකය, යටිතල පහසුකම් සහ බලශක්තිය** පිළිබඳ ආරාධිත දේශනය (අසංක විජේසිංහ).

- අගෝස්තු 21 වන දින ගෝල් ෆේස් හෝටලයේ පැවති, එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සංවිධානය විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග එක්ව සංවිධානය කරන ලද **ශ්‍රී ලංකාවේ විදුලි වාහන සහ ඇඟළුම් අංශවල හරිත කාර්මික පරිවර්තනය**: මූල්‍ය, කාර්මික සහ වෙළඳ ප්‍රතිපත්තිවල කාර්ය භාරය (අසංක විජේසිංහ).

- අගෝස්තු 15 වන දින කොළඹ ෂැංග්‍රි-ලා හෝටලයේ පැවති ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද **ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල අන්තර්කරණය වූ වර්ධනය සඳහා ඩිජිටල් වෙළඳාම** පිළිබඳ වටමේස සාකච්ඡාවේ සාකච්ඡාකරුවෙක් ලෙස සහභාගී වීම (අසංක විජේසිංහ).



- අගෝස්තු 14 වන දින පරිත්‍යාගශීලීත්වය සහ සමාජය පිළිබඳ ආසියානු මධ්‍යස්ථානය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද "**යහපත කිරීමේ දර්ශකය 2024**" නැමති සමීක්ෂණ මගින් සොයාගන්නා ලද කරුණු සාකච්ඡා කිරීම සඳහා පවත්වන ලද ප්‍රචාරණය කිරීමේ උත්සවය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව (අසංක විජේසිංහ).
- අගෝස්තු 2 වන දින 'දදප තාක්ෂණය ඔස්සේ පවත්වන ලද, තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනය සහ පකිස්තානයේ ෆ්‍රෙඩ්රික් නවුමාන් පදනම විසින් සංවිධානය කරන ලද, **වෙළඳාමේ දී කාන්තාවන් සවිබල ගැන්වීම - දකුණු ආසියානු දෘෂ්ටිකෝණයක්** පිළිබඳ දියත් කිරීමේ උත්සවය සහ විද්වත් මණ්ඩල සාකච්ඡාව අවස්ථාවේ විද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස සහභාගී වීම (අසංක විජේසිංහ)



- ජූලි 15 වන දින රාජකීය තායි කාර්යාලය විසින් සංවිධානය කර, 'සියම් නිවස' මධ්‍යස්ථානයේ දී පවත්වන ලද, **තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුම සහ එය ශ්‍රී ලංකාවේ තායි ව්‍යාපාර වලට වාසිදායක වන ආකාරය** පිළිබඳ සාකච්ඡාවක විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).

- ජූලි 3 වන දින කෝට්යාර්ඩ් මැරියට් හෝටලයේ පැවති, ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද 'වෙළඳාම: ජාතික තනි කවුළුව පද්ධතිය' පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවේදී **ජාතික තනි කවුළු පද්ධතිය පිළිබඳ පුද්ගලික අංශයේ දෘෂ්ටි කෝණයන්: ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ සහ අවස්ථා** නැමති සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).
- ජූනි 13 වන දින හිල්ටන් හෝටලයේ පැවති, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද 'හතළිස් පස්වැනි SAARCFINANCE අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණයේ' දී **සාර්ක් රටවල මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවලීන් සහ ආකෘති නැවත විමසා බැලීම** පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවීම (දුෂ්නි වීරකෝන්).
- ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ සේවා ආයතනයේ දකුණු සහ මධ්‍යම ආසියානු කලාප අධ්‍යයන වැඩසටහන සඳහා ජූනි 13 වන දින 'දුරස්ථ තාක්ෂණය ඔස්සේ පැවත්වන ලද **ශ්‍රී ලංකාවේ ආර්ථිකය, යටිතල පහසුකම් සහ බලශක්තිය** පිළිබඳ ආරාධිත දේශනය (අසංක විජේසිංහ).
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කර ජූනි 11-20 දින වල කළුතර (අතුකෝරල තේ කර්මාන්ත ශාලාව), ගාල්ල (බටුවන්ගල තේ කර්මාන්ත ශාලාව) සහ මාතර (ලුම්බිණි තේ කර්මාන්ත ශාලාව) යන ස්ථානවල පවතවන ලද ප්‍රාදේශීය වැඩමුළු හතක දී **ශ්‍රී ලංකා තේ සඳහා භූගෝලීය දර්ශකය: පාලන සැලැස්ම සහ පාලන යාන්ත්‍රණය** පිළිබඳ ඉදිරිපත් කිරීම් (ඩිලනි හිරිමුතුගොඩගේ).
- ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කර, ජූනි 6 වන දින ටාජ් සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලද **ප්‍රතිපත්ති පාදක ණය දීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම: ඇගයීම් වලින් ලබාගත් සියුම් අවබෝධයන්** නැමති වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).
- ජූනි 3 වන දින ලොෆ්බරෝ විශ්වවිද්‍යාලයේ සාමාජික රඩාබේ ෂාහිඩ් විසින් 'දුරස්ථ තාක්ෂණය ඔස්සේ සංවිධානය කරන ලද **දකුණු ආසියාවේ න්‍යෂ්ටික නොවන පස්දෙනාගේ භූ දේශපාලනය** පිළිබඳ වැඩමුළුවේ විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).
- අප්‍රේල් 25 වන දින Zoom තාක්ෂණය ඔස්සේ ශ්‍රී ලංකා ආර්ථික සංගමය විසින් සංවිධානය කරන ලද **සමකාලීන ආර්ථික ගැටළු පිළිබඳ ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ ත්‍රෛමාසික සමාලෝචනය** සඳහා විද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස සහභාගී වීම (අසංක විජේසිංහ).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් මාර්තු 12 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාවේ දී සංවිධානය කරන ලද **විදුලි වාහන සැපයුම් දාමවල වෙළඳ යුද්ධ: ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වාසියක්ද?** යන මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම (අසංක විජේසිංහ).
- ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පූනේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සමග එක්ව මාර්තු 2 වන දින ඉන්දියාවේ පූනේ නගරයේ දී සංවිධානය කරන ලද "අටවන ආසියානු ආර්ථික සංවාදය 2024" සම්මන්ත්‍රණයේ දී **ලෝක වෙළඳ සංවිධානය නැවත සැලසුම් කිරීම සහ පුනර්ජීවනය කිරීම** යන මාතෘකාව යටතේ පැවති සැසියක විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).





- පෙබරවාරි 16 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පැවති "කෘෂිකර්මය සහ දේශගුණිකවිපර්යාස: විශ්ලේෂණාත්මක ක්‍රම සහ ප්‍රතිපත්ති සන්නිවේදනය" නැමති වැඩමුළුවේ දී **දකුණු ආසියාවේ කෘෂිකාර්මික වෙළඳ ප්‍රතිපත්තිය සහ ගෝලීය අගය දාමය** යන මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම(අසංක විජේසිංහ).

- ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර පෙබරවාරි 1 වන දින එම ආයතනයේ දී පවත්වන ලද **ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියානු සම්බන්ධතාවල සහභාගීත්වය ශක්තිමත් කිරීම** පිළිබඳ වටමේස සාකච්ඡාවක සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම (ලක්මිණි ප්‍රනාන්දු).

- අගෝස්තු 27 වන දින අරලියගහ මන්දිරයේ පැවති, තිරසාර සංවර්ධන සභාව විසින් සංවිධානය කරන ලද **තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාතික සංසදයේ** විද්වත් මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම (දුෂ්නි වීරකෝන්).

## ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය / මාධ්‍ය සමග සමග සම්බන්ධවීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- **GSP+: එයට ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ වර්ධනයක් ඇති කළ හැකිද?** රශ්මි අනුපමා, චායා දිසානායක සහ අසංක විජේසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 26.
- **එක්සත් ජනපදයේ මැතිවරණ ප්‍රතිඵලය සහ වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්: ශ්‍රී ලංකාවට එය බපාන්නේ කෙසේද?**, අසංක විජේසිංහ සහ මජිතා සෙල්වලිංගම්, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 18.
- **ගෝලීය තරඟකාරිත්වය සඳහා ශ්‍රී ලංකාවේ මාවත: වෙළඳ, බලශක්ති සහ කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ සියුම් අවබෝධයන්**, චන්දුල ඉදිරිසිංහ සහ නිෂාමිනි ඉහළගෙදර, ටෝකිං ඉකොනොමික්ස්, 2024 ඔක්තෝබර් 21.
- **ශ්‍රී ලංකාවේ වැට් බදු වැඩිවීම: සත්‍ය වශයෙන් ම මිල ගෙවන්නේ කවුද?** ප්‍රියංකා ජයවර්ධන, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 14.
- **2024 ජනාධිපතිවරණයේ ආර්ථික අවදානම්**, දුෂ්නි වීරකෝන්, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 18.
- **ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය බර ලිහිල් කිරීම: රජයේ විශ්‍රාම වැටුපක් අවශ්‍ය වන්නේ කාටද?** ප්‍රියංකා ජයවර්ධන, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 30.
- **සංකල්පවේදයට සාපේක්ෂව ප්‍රායෝගිකත්වය: ආර්ථිකයේ අනාගතය හැඩගැස්වීම සඳහා අතිශය වැදගත් තේරීමක්**, දුෂ්නි වීරකෝන්, - එච්ලොන්, අප්‍රේල් 10.
- **ශ්‍රී ලංකාවේ මිනිරන් සහ ජාත්‍යන්තර විදුලි වාහන අගය දාමවල වෙනස්වීම්**, චායා දිසානායක සහ රශ්මි අනුපමා, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 28.
- **ඔරොත්තු දීමේ හැකියාවේ විවිධ පැතිකඩ: ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශය X රෝගකාරකයට මුහුණ දීමට සූදානම්ද?**, චායා දිසානායක, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 12.
- **වෙළඳ විභවය විවර කිරීම: ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම වැඩිදියුණු වූ ද්විපාර්ශ්වික වෙළඳාමකට මග පාදන ආකාරය**, අසංක විජේසිංහ, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 28.
- **ආර්ථික ප්‍රතිසාධනය සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ**, අසංක විජේසිංහ, TV1 රූපවාහිනී නාලිකාවේ නිව්ස් ෆර්ස්ට් වැඩසටහනේ ද පීපල්ස් ප්ලැට්ෆෝර්ම්, 'ටෝක් ඔෆ් ද ටවුන්', ජනවාරි 24.
- **මැතිවරණ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිමත්වීම මත අවිනිශ්චිතතාවයේ සෙවනැල්ලක් හෙළයි**, දුෂ්නි වීරකෝන්, ඊස්ට් ඒසියා ෆෝරම්, බංග්ලාදේශ් ෆෝරම්, ද මෝනිං, අයිලන්ඩ්, ජනවාරි 16.
- **අර්බුදයෙන් මිදීමට වේදනාකාරී නොවන මාර්ගයක් නැත**, අසංක විජේසිංහ, ද මෝනිං, ජනවාරි 6.

# ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය

පුද්ගලයන්ට තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා සහ ඵලදායී ලෙස ශ්‍රම වෙළඳපොළට සහභාගී වීම සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීම පිණිස ගුණාත්මක සෞඛ්‍ය සේවා සහ ගුණාත්මක අධ්‍යාපනයක් වෙත ප්‍රවේශය අවශ්‍ය වේ. කෙසේ වෙතත්, විශේෂයෙන් ම මූල්‍ය, මානව සහ භෞතික සම්පත් සම්බන්ධ සීමාවීම් සැලකිල්ලට ගැනීමේ දී, නව වර්ධනයන් සමග ඉදිරියට ගමන් කිරීම සහ සියලු දෙනාට ගුණාත්මක ප්‍රවේශයක් ලබා දීම වඩාත් අභියෝගාත්මක වී ඇති බැවින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සපයා දීමේ සාම්ප්‍රදායික ආකෘතීන් පරීක්ෂාවට ලක් වෙමින් පවතියි. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ශ්‍රමය යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති දිශානත වූ දැනුම සම්බන්ධ අඩුපාඩු ආමන්ත්‍රණය කිරීම මගින් සහ එම අංශවල අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා උපකාර කිරීම මගින් රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය වීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණවල අරමුණ වේ.

## සෞඛ්‍යය

2024 වර්ෂයේ දී අධ්‍යයන කිහිපයක් සම්පූර්ණ කරන ලදී. වයිටල් ස්ට්‍රැටජීස් සහ චිකාගෝ හි ඉලිනොයි විශ්වවිද්‍යාලය විසින් අරමුදල් සපයන ලද '**RESET ඇල්කොහොල් - මිල සහ ආදායම් සංවේදීතා විශ්ලේෂණය**' මගින් රජයට දැනුවත්භාවයෙන් යුතුව ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවේ මධ්‍යසාර බදු ප්‍රතිසංස්කරණ සිදුකිරීමට සහාය වීම සඳහා මධ්‍යසාර නිෂ්පාදනවල මිල නම්‍යතා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දීමට අරමුණු කරයි.

එමෙන්ම, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් අරමුදල් සපයන ලද, **ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සහ සෞඛ්‍යය** නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය සහ දේශගුණික විපර්යාස අතර ඇති සම්බන්ධතාවය පරීක්ෂා කරන ලදී. එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනයේ සහ සීමාසහිත KIVU ඉන්ටර්නැෂනල් ආයතනයේ අරමුදල් සැපයීම මත සිදු කරන ලද, **කැන්සර් රිසර්ච් යූ.කේ. / KIVU ඉන්ටර්නැෂනල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන KIVU දුම්කොළ පාලන ව්‍යාප්ති වැඩසටහන** පිළිබඳ අධ්‍යයනයෙහි අරමුණු වූයේ දුම්කොළ පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ මහජන සෞඛ්‍ය ප්‍රතිඵල වැඩිදියුණු කිරීම මගින් දැනුවත්භාවය වැඩි කිරීම සහ සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලංකාවක් සඳහා දායක වීමයි. KIVU දුම්කොළ පාලන ව්‍යාප්ති වැඩසටහන මගින් දුම්කොළ පරිභෝජනයට බලපෑම් කළ හැකි ප්‍රතිපත්ති බලපෑම් සඳහා ඉලක්ක හඳුනාගන්නා ලද අතර එය දුම්කොළ පරිභෝජනය කෙරෙහි සහ බලපෑමක් ඇති කිරීමේ විභවය ඇති තැන්හි ද ඉහළ බලපෑමක් ඇති කරයි. එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනය සහ සීමාසහිත KIVU ඉන්ටර්නැෂනල් ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලදී. වයිටල් ස්ට්‍රැටජීස් සහ චිකාගෝ හි ඉලිනොයි විශ්වවිද්‍යාලය විසින් අරමුදල් සපයන ලද **ශ්‍රී ලංකාවේ මධ්‍යසාර කර්මාන්තයේ දේශපාලන ආර්ථික විශ්ලේෂණය** මගින් නාගරික/ග්‍රාමීය අංශවල විවිධ ආදායම් කාණ්ඩ විසින් මත්පැන් පරිභෝජනය කිරීමෙහි සහ විවිධ වර්ගයේ මත්පැන් සඳහා ආදේශක භාවිතා කිරීමෙහි මිල සහ ආදායම් සංවේදීතාවය විමර්ශනය කරන ලදී.

ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ අරමුදල් සැපයීම යටතේ ක්‍රියාත්මක කරනු ලබන **සීනි යොදන ලද පැණිබීම පරිභෝජනය අඩු කිරීම සඳහා වන දකුණු ආසියානු සන්ධානයෙහි** ප්‍රධාන අරමුණ වන්නේ දකුණු ආසියානු කලාපය තුළ සීනි යොදන ලද පැණිබීම පරිභෝජනය අඩු කිරීමයි. මෙම අධ්‍යයනය මගින් දකුණු ආසියාවේ ප්‍රධාන රටවල් හතරක් වන බංග්ලාදේශය, පකිස්තානය, නේපාලය සහ ශ්‍රී ලංකාව පිළිබඳ ගැඹුරු විමර්ශනයක් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. **SHAPE-Asia: පිළිවෙත් ගොඩනැගීමේ ප්‍රජාව හරහා සෞඛ්‍ය සම්පන්න ආහාර පද්ධති සහ ප්‍රතිපත්ති පරිසරයන් සඳහා ආසියානු ජාතීන් එක්සත් කිරීම** නැමති ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය විසින් අරමුදල් සපයනු ලැබේ. මෙම ව්‍යාපෘතිය තිරසාර සංවර්ධන ඉලක්ක 2, 3 සහ 17 ඇතුළු ගෝලීය ප්‍රමුඛතා වලට සමගාමී වේ.

## ශ්‍රම වෙළඳපොළ

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුදල් සැපයීම යටතේ සම්පූර්ණ කරන ලද **සමාජ ආරක්ෂණය පිළිබඳ සේවායෝජකයන්ගේ ජාලය** පිළිබඳ අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා වඩාත්ම අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ පිළිබඳ විමසා බලන අතර ම, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලවල සේවායෝජකයින් නියෝජනය නොවීමේ ගැටළුව විශ්ලේෂණය කරන ලදී.

## කාන්තාව සහ ශ්‍රම බලකාය


'දරිද්‍රතාවය සහ ආර්ථික ප්‍රතිපත්තිය' විසින් අරමුදල් සපයන ලද, **ගුණාත්මක රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය කෙරෙහි සමාජ, සංස්කෘතික සහ නෛතික සන්දර්භයන්හි බලපෑම ගවේෂණය කිරීම** පිළිබඳව නිම කරන ලද ව්‍යාපෘතියෙහි අරමුණ වූයේ රටවල් හයක සිද්ධි අධ්‍යයනවල සොයාගැනීම් පදනම් කර ගනිමින් ගුණාත්මක වැඩ ප්‍රමාණනය කිරීමේදී ප්‍රවේශයට බලපෑම් ඇතිකරන සමාජ, නෛතික සහ ආර්ථික සාධක සහ අභියෝග, සහ ඵලදායී ප්‍රතිපත්ති සකස් කිරීමට බාධා කරන එම සාධක සහ අභියෝග ඇගයීම මගින් කාන්තාවන්ට ගුණාත්මක රැකියා සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් වන, **විද්‍යාව, තාක්ෂණය, ගණිතය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකික කාන්තා මානව ප්‍රාග්ධනය එක්රැස්වීමට ඇති බාධක පිළිබඳ විශ්ලේෂණයක්** නැමති අධ්‍යයනය මගින් STEM විෂය තෝරා ගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා විට පාසල් මට්ටමේ දී සහ තෘතීයික අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ශ්‍රම වෙළඳපොළට ඇතුළුවීමේ දී යන මට්ටම් දෙකෙහි දී ම ඇති බාධක ගවේෂණය කරන ලදී. එක්සත් ජාතීන්ගේ කාන්තාවෝ (UN Women) සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල කාන්තා දේශපාලන නායකත්වය සඳහා 25% ක කෝටාවෙහි බලපෑම නැමති තවත් ව්‍යාපෘතියක් මගින් **ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව කාන්තාවන් සඳහා වෙන් කර ඇති 25% ක කෝටාවෙහි බලපෑම** අවබෝධ කර ගැනීමට අරමුණු කරන අතර, මෙම කෝටාව මගින් කාන්තාවන්ට අර්ථවත් නායකත්ව තනතුරු ලබා ගැනීමට, දේශපාලන කතිකාවන්ට ක්‍රියාකාරීව සහභාගී වීමට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකියාව ලබා දී තිබේද යන්න ඇගයීමට අපේක්ෂා කරනු ලැබේ. **ශ්‍රී ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් රැකියා වෙන් කිරීම: සාර්ව විශ්ලේෂණයක්** නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ සාර්ව ආර්ථික සාධක සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් රැකියා වෙන් කිරීම අතර පවතින සංකීර්ණ අන්තර්-ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කරනු ලැබේ. ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය විසින් අරමුදල් සපයනු ලබන, **ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සේවිකාවන්ට ඇති වන අහිතකර සෞඛ්‍ය බලපෑම් අඩු කිරීම සඳහා වසංගත ප්‍රතිචාර වැඩිදියුණු කිරීම පිළිබඳ සහභාගීත්ව අධ්‍යයනයක් නැමති** අධ්‍යයනය සෞඛ්‍ය බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ ක්‍රමයක් ලෙස වසංගත ප්‍රතිචාර කාර්ය පටිපාටියක් සැලසුම් කිරීමට සහ සේවා ස්ථානයේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා නියාමන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම අරමුණු කරගත්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින තවත් අඛණ්ඩ අධ්‍යයනයක් වේ.

## ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.




- **ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම**, අරාර්, ඒ., නිශා අරුණතිලක, ලක්මිනි ප්‍රනාන්දු, සුනිමලී මධුරාවල, කිමුතු කිරින්ගොඩ, සහ හිමානි විතානගේ, ක්‍රියාකාරී පත්‍රිකා මාලාව, ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය, ක්විබෙක්. ISSN 27. (නිශා අරුණතිලක, ලක්මිනි ප්‍රනාන්දු, සුනිමලී මධුරාවල, කිමුතු කිරින්ගොඩ, සහ හිමානි විතානගේ)
- **ගුණාත්මක රැකියා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය කෙරෙහි සමාජ, සංස්කෘතික සහ නීතිමය සන්දර්භවල බලපෑම ගවේෂණය කිරීම**, අරුණතිලක, නිශා., අරාර්, අබ්දෙල්ක්‍රිම්., සහ ෆොන්ටානා, මාර්සියා, ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වය, 2024 (නිශා අරුණතිලක).
- **ශ්‍රී ලංකාවේ මධ්‍යසාර බදුකරණයේ ආදායම් ඇඟවීම් නිරූපණය කිරීම**, නිශා අරුණතිලක, ලක්මිණී ප්‍රනාන්දු සහ සුලෝචනා සිල්වා, කොළඹ: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ සෘජු ඇල්කොහොල්, (නිශා අරුණතිලක, ලක්මිණී ප්‍රනාන්දු සහ සුලෝචනා සිල්වා).
- **ශ්‍රී ලංකාවේ අරක්කු සහ බියර් භාවිතයේ මිල නම්‍යතාවය**, ටුබැකොනොමික්ස්, අගෝස්තු (ප්‍රියංකා ජයවර්ධන).
- **ශ්‍රී ලංකාවේ බීඩි සහ දුම් රහිත දුම්කොළ පරිභෝජනය මැඩපැවැත්වීමේ උපාය මාර්ග,** ප්‍රියංකා ජයවර්ධන, චිරන්දතී පතිරාජ සහ නිමේෂා දිසානායක, සෞඛ්‍ය සහ අධ්‍යාපන පර්යේෂණ මාලා අංක 22, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ජුනි (ප්‍රියංකා ජයවර්ධන, චිරන්දතී පතිරාජ සහ නිමේෂා දිසානායක).
- **කලාපීය ඒකාබද්ධතාවය තුළින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අන්තර්කරණය වූ වර්ධනය ප්‍රවර්ධනය කිරීම**, ඩිවලොප්මන්ට් ඒසියා, සැප්තැම්බර් 26 (ලක්මිණී ප්‍රනාන්දු සහ සුලෝචනා සිල්වා).

- **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ පවතින අඩුපාඩු පියවීම සඳහා අධ්‍යාපන තාක්ෂණය උපයෝගී කර ගැනීම**, ඩිවලොප්මන්ට් ඒසියා, මැයි 31 (හිමානි විතානගේ).
- **ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශයේ සේවිකාවන්ට කොවිඩ්-19 වසංගතයෙන් ඇතිවූ බලපෑම ඇගයීම**, ඩිවලොප්මන්ට් ඒසියා, ආසියානු සංවර්ධන බැංකුව, අප්‍රේල් (චායා දිසානායක).
- **විශේෂඥ මතය: ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සහ සෞඛ්‍ය අංශයේ මූල්‍යකරණ පියවර,** විදේශීය ආර්ථික ප්‍රතිපත්ති වීළිබඳ කොරියානු ආයතනය, අප්‍රේල් (සුනිමලී මධුරාවල).
- **ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම වැඩිහිටි කාන්තාවන්ට පීඩා ගෙනදෙයි**, ප්‍රොජෙක්ට් සින්ඩිකේට්, ජනවාරි, (නිශා අරුණතිලක).

## ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගීත්වය ලබා දී ඇත:

- අවදානම් සහ සම්පත් සංචිත කිරීම පිළිබඳ විශේෂඥ කණ්ඩායම ශ්‍රී ලංකාව සඳහා සෞඛ්‍ය මූල්‍යකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා තාක්ෂණික කමිටුව, සෞඛ්‍ය අමාත්‍යාංශය.
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිසම.
- උසස් අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිසම.
- සාමාන්‍ය අධ්‍යාපනය සහ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිසම.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.

- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කර, දෙසැම්බර් 5 වන දින ෂැංග්‍රි-ලා හෝටලයේ දී පවත්වන ලද D4N සමුළුවේදී "පෝෂණ ප්‍රතිඵල වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග, විවිධ කරුණු අතර සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම" නැමති සැසියේ දී **නාගරික දුප්පතුන්ගේ ආහාර පරිසරයන් සහ ආරක්ෂාව කෙරෙහි ආපදාවන් මගින් ඇතිකරන බලපෑම** පිළිබඳ ඉදිරිපත් කිරීම (නිශා අරුණතිලක).
- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කර, දෙසැම්බර් 3 වන දින ෂැංග්‍රි-ලා හෝටලයේ දී පවත්වන ලද "දකුණු ආසියාවේ පෝෂණ ප්‍රතිඵල වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග, පද්ධතිය පුරා විවිධ කරුණු අතර සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම" නැමති සමුළුවේදී **ප්‍රතිපත්තියෙන් පිළිවෙතට: ශ්‍රී ලංකාවේ වඩාත් සෞඛ්‍ය සම්පන්න ආහාර පරිසරයක් සඳහා මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි කර්මාන්තවල බලපෑම පරීක්ෂා කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම (සුනිමලී මදුරාවල).
- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කර, දෙසැම්බර් 2 වන දින ෂැංග්‍රි-ලා හෝටලයේ දී පවත්වන ලද D4N සමුළුවේදී **තිරසාර කෘෂිකර්මාන්තය තුළින් පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රම සහ මිතික** පිළිබඳ සැසියේ සම-සභාපතිත්වය දැරීම (නිශා අරුණතිලක).
- නොවැම්බර් 26 වන දින ආසියානු සංවර්ධන බැංකු ආයතනය විසින් මාර්ගගතව සංවිධානය කරන ලද 'ආසියානු සංවර්ධන බැංකු ආයතන වාර්ෂික සමුළුවේ' **ආසියානු ඉහළ ආදායම් සංක්‍රාන්තිය සඳහා SAGE ප්‍රවේශයක්** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (නිශා අරුණතිලක).
- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සහ ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා වූ උපදේශක කණ්ඩායම විසින් නොවැම්බර් 21 වන දින මාර්ගගතව සංවිධානය කරන ලද දරිද්‍රතාවය අඩු කිරීම, ජීවනෝපාය සහ රැකියා පිළිබඳ බලපෑම් ක්ෂේත්‍ර වේදිකාවේ **ශ්‍රී ලංකාවේ ඔරොත්තු දීමේ හැකියාව, අන්තර්කරණය වූ වර්ධනය සහ සාකල්‍ය පරිවර්තනය ගොඩනැගීම** නැමති වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික (නිශා අරුණතිලක).
- ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය සහ අප්‍රිකානු ජනගහන සහ සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කර, Women Rise වෙබ් සම්මන්ත්‍රණ මාලාවේ දී නොවැම්බර් 19 වන දින 'දදප තාක්ෂණය ඔස්සේ පවත්වන ලද **දේශීය අභියෝගකරුවන් මෙහෙයවා ගැනීම සහ පරිවර්තනයට මුලපිරීම: ස්ත්‍රී-පුරුෂ සමාජභාව අසමානාත්මතාවය සහ පර්යේෂණවල දී අන්තර්කරණය පිළිබඳ සියුම් අවබෝධයන්** නැමති සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).
- එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනය විසින් සංවිධානය කරන ලද, **නැගෙනහිර අප්‍රිකාවේ දුම්කොළ පාලනය හරහා පිළිකා පාලනය කිරීම පිළිබඳ** මාර්ගගත සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික, නොවැම්බර් 13 වන දින (නිශා අරුණතිලක).
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය විසින් නොවැම්බර් 13 වන දින මාර්ගගතව සංවිධානය කරන ලද දකුණු ආසියානු ජාල රැස්වීමේදී **ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන අර්බුද සහ සමාජ අංශය කෙරෙහි ඉන් ඇතිකරන ඇඟවීම් පිළිබඳ ඉදිරිපත් කිරීම**, (නිශා අරුණතිලක).
- 'ආර්ථික ප්‍රතිපත්ති සඳහා වන හවුල්කාරිත්වය' විසින් නොවැම්බර් 5 වන දින මාර්ගගතව සංවිධානය කරන ලද **සංවර්ධන පර්යේෂණවල උතුරු දකුණු සහයෝගීතාවය වැඩිදියුණු කිරීම** පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව මෙහෙයවීම (නිශා අරුණතිලක).
- ඔක්තෝබර් 25 - 27 දිනවල කැනඩාවේ වැන්කුවර් නුවර සයිමන් ෆ්‍රේසර් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "ගෝලීය සෞඛ්‍යය පිළිබඳ තිස්වන වාර්ෂික කැනේඩියානු සමුළුවේ දී" **අර්බුද හමුවේ කාන්තාවන්ට සහාය වීම: කොවිඩ්-19 වසංගතයෙන් පාඩම්** යන මාතෘකාව යටතේ පැවති සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (අසංක විජේසිංහ).









- සැප්තැම්බර් 24 - 26 දිනවල ඉන්දියාවේ කොල්කටා නුවර පැවති ප්‍රටිච් (ඉන්දියා) භාරය, සංවර්ධන අධ්‍යයන ආයතනය, කොල්කටා සහ සෞඛ්‍ය තොරතුරු පද්ධති වැඩසටහන විසින් සත්කාරකත්වය දරන ලද "අර්බුද, හැකියා සහ කැපවීම" යන මාතෘකාව යටතේ පැවති මානව සංවර්ධන සහ සක්‍යතා සංගම් සමුළුවේ දී, **කොවිඩ්-19 වසංගතයට ඇඟලුම් කර්මාන්තයේ ප්‍රතිචාරය: කාන්තාවන්ට සිදුවන අසමානුපාතික බලපෑම අවම කිරීමේ පියවර** පිළිබඳ ඉදිරිපත් කිරීම (වායා දිසානායක).
- සැප්තැම්බර් 24 - 26 දිනවල ඉන්දියාවේ කොල්කටා නුවර පැවති ප්‍රටිච් (ඉන්දියා) භාරය, සංවර්ධන අධ්‍යයන ආයතනය, කොල්කටා සහ සෞඛ්‍ය තොරතුරු පද්ධති වැඩසටහන විසින් සත්කාරකත්වය දරන ලද "අර්බුද, හැකියා සහ කැපවීම" යන මාතෘකාව යටතේ පැවති මානව සංවර්ධන සහ සක්‍යතා සංගම් සමුළුවේ දී, **කොවිඩ්-19 වසංගතයට ඇඟලුම් කර්මාන්තයේ ප්‍රතිචාරය: බහුතරය වන සේවිකාවන්ට ඇතිවන බලපෑම අවම කිරීමේ පියවර: ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශයක්** පිළිබඳ ඉදිරිපත් කිරීම (සුලෝචනා සිල්වා).
- සැප්තැම්බර් 17 වන දින ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පිහිටි ජාත්‍යන්තර පිළිකා පාලන සංගමය විසින් සංවිධානය කර එම ආයතනයේ දී පවත්වන ලද **තිරසාර හා බලපෑම් සහගත දුම්කොළ පාලන වැඩසටහන් සඳහා වඩා හොඳ පරිසරයක් ගොඩනැගීම** පිළිබඳ ලෝක පිළිකා සම්මේලනයේ විද්වත් මණ්ඩල සාකච්ඡාව (නිශා අරුණතිලක).
- ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අගෝස්තු 16 වන දින ගලදාරි හෝටලයේ දී සංවිධානය කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සංගම් සම්මේලනයේ "**සෞඛ්‍යයෙහි වාණිජ නිර්ණායක පිළිබඳ සම්මන්ත්‍රණයෙහි**", සෞඛ්‍යයෙහි වාණිජ නිර්ණායක පිළිබඳ සාකච්ඡාව (නිශා අරුණතිලක).
- ජුනි 28 - 29 දිනවල රැඩිසන් හෝටලයේ පැවති Industry All විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ජීවත් වීමට සරිලන වැටුප්" පිළිබඳවැඩමුළුවේදී **ජීවත් වීමට සරිලන වැටුප් ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රමවේදය: ශ්‍රී ලංකාවේ තේ වැවිලි අංශය** නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීම (ප්‍රියංකා ජයවර්ධන).
- ජුනි 10 - 12 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර පිහිටි දකුණු ආසියාවේ යුනිසෙෆ් කලාපීය කාර්යාලය විසින් සංවිධානය කරන ලද "දකුණු ආසියාව පෝෂණය කිරීම | දකුණු ආසියාවේ මුල් ළමාවියේ ආහාර වේල් වැඩිදියුණු කිරීම සහ ක්ෂුද්‍ර පෝෂක ඌනතාවයන් සහ රක්තහීනතාවය අඩු කිරීම" යන මාතෘකාව යටතේ පැවති කලාපීය රැස්වීමේ දී **ළමයින්ගේ ආහාර වේල් ආරක්ෂා කිරීම: රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති සහ නියමයන් ශක්තිමත් කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම (සුනිමලී මධුරාවල).

- මැයි 16 වන දින දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ අසමානාත්මතා** පිළිබඳ වටමේස සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (නිශා අරුණතිලක).
- මැයි 7 වන දින 'ආර්ථික කටයුතු ආයතනය' සහ 'ආර්ථික විද්‍යාව සහ ප්‍රතිපත්ති පිළිබඳ කාන්තාවෝ' විසින් මාර්ගගතව සංවිධානය කරන ලද **ECON-ON-MICS පොඩ්කාස්ට්: විද්වත් මණ්ඩල සාකච්ඡාවේ** විද්වත් මණ්ඩල සාමාජික (නිශා අරුණතිලක).
- ආසියානු සංවර්ධන බැංකු ආයතනය විසින් අප්‍රේල් 23 වන දින මාර්ගගතව සංවිධානය කරන ලද **ThinkAsia - තිරසාර සංවර්ධනය සඳහා නව ගෝලීය දැනුම මධ්‍යස්ථානයක්** දියත් කිරීමේ අවස්ථාවේ විද්වත් මණ්ඩල සාමාජික (නිශා අරුණතිලක).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර, අප්‍රේල් 4 වන දින එම ආයතනයේ සමන් කැලේගම ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද "වඩාත් සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලංකාවක් සඳහා මධ්‍යසාර පාලනය" පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ දී, **මධ්‍යසාර බදුකරණය හිතකර ප්‍රතිපත්ති විකල්පයකි** නැමති මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම, (ප්‍රියංකා ජයවර්ධන).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර, අප්‍රේල් 4 වන දින එම ආයතනයේ සමන් කැලේගම ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද "වඩාත් සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලංකාවක් සඳහා මධ්‍යසාර පාලනය" පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ දී, **ශ්‍රී ලංකාවේ මත්වතුර සටන: මධ්‍යසාර පාලනයේ දේශපාලන ආර්ථික ගතිකය** පිළිබඳ ඉදිරිපත් කිරීම (සුනිමලී මධුරාවල).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර, මාර්තු 27 වන දින එම ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද **දුම්කොළ රහිත හෙටක් සඳහා: ශ්‍රී ලංකාවේ ඵලදායී පාලන පියවර සඳහා ප්‍රතිපත්ති මාර්ග** පිළිබඳ ප්‍රතිපත්ති සාකච්ඡාව සහ පාර්ශවකරුවන්ගේ රැස්වීම, (නිශා අරුණතිලක සහ සුනිමලී මධුරාවල).





- **ඔබින රැකියා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම** පිළිබඳ ඉදිරිපත් කිරීම, Echelon Media, මාර්තු 26 (නිශා අරුණතිලක).
- පෙබරවාරි 27 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර එම ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන තාක්ෂණය පිළිබඳ දෙමුහුන් වටමේස සාකච්ඡාවේ දී **ආසියාවේ සහ, මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාවේ අධාපන තාක්ෂණය** පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම. (නිශා අරුණතිලක)
- පෙබරවාරි 27 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර එම ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන තාක්ෂණය පිළිබඳ දෙමුහුන් වටමේස සාකච්ඡාවේ දී **ආසියාවේ සහ, මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාවේ අධාපන තාක්ෂණය** සම්බන්ධ සොයාගැනීම් පිළිබඳ සම ඉදිරිපත් කිරීම (ලක්ෂිලා වනිගසිංහ සහ හිමානි විතානගේ)
- ජනවාරි 22 - 23 දිනවල තායිලන්තයේ මහිඩොල් විශ්වවිද්‍යාලය, සෙන්ටාරා ග්‍රෑන්ඩ් සහ බැංකොක් සම්මේලන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "2024 ප්‍රින්ස් මහිඩොල් සම්මාන සමුළුවේදී", **බහු අර්බුද යුගයක හූ දේශපාලනය, මානව ආරක්ෂාව සහ සෞඛ්‍ය සමානාත්මතාවය** පිළිබඳ ඉදිරිපත් කිරීම (නිශා අරුණතිලක).

## ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය / මාධ්‍ය සමග සමග සම්බන්ධවීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- **අඩු ඵලදායිතා උගුලක්? ශ්‍රී ලංකාවේ කුසලතා, රැකියා සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම**, හිමානි විතානගේ - ටෝකිං ඉකොනොමික්ස්, ඩේලි නිව්ස්, බ්‍රීඩ්, ඉකොනොමි නෙක්ස්ට්, ද මෝර්නිං, සන්ඩේ ඔබ්සර්වර්, සිලෝන් ටයිම්ස්, ඔක්තෝබර් 15.
- **ඇත්තටම ප්‍රතිලාභ ලබන්නේ කවුද? ශ්‍රී ලංකාවේ අසමානාත්මතාවය, සුභසාධනය සහ සෞඛ්‍ය සේවා අභියෝගවලට මුහුණ දීම,** සුලෝචනා සිල්වා සහ රශ්මි අනුපමා - ටෝකිං ඉකොනොමික්ස්, බ්‍රීඩ්, සිලෝන් ටයිම්ස්, සන්ඩේ ඔබ්සර්වර්, අද දෙරණ, ඔක්තෝබර් 10.
- "**අහිමි වූ සංවර්ධන අවස්ථාවක්: ශ්‍රී ලාංකික කාන්තාවන් සවිබලගැන්වීම සඳහා කලාපීය ඒකාබද්ධතාවය**", ලක්මිණි ප්‍රනාන්දු සහ සුලෝචනා සිල්වා - ටෝකිං ඉකොනොමික්ස්, ඩේලි මිරර්, ඉකොනොමි නෙක්ස්ට්, ඩේලි නිවුස්, ද මෝනිං, සන්ඩේ ඔබ්සර්වර්, ටයිම්ස් ඔන්ලයින්, අප්‍රේල් 4.
- **ඉහළ කාන්තා සහභාගීත්වයක් නිර්මාණය කරන සේවා නියුක්ති නීති සැලසුම් කිරීම**, නිශා අරුණතිලක, එච්ලන් - SheSlays, මාර්තු 22.
- **ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා හවුල්කාරිත්වයන්, සහයෝගීතා සහ කෘතිම බුද්ධිය හරහා අධ්‍යාපන තාක්ෂණය පුළුල් කිරීම: ශ්‍රී ලංකාව සඳහා සියුම් අවබෝධයන්**, හිමානි විතානගේ - ටෝකිං ඉකොනොමික්ස්, අද දෙරණ, ඩේලි නිවුස්, ඉකොනොමි නෙක්ස්ට්, ෆයිනෑන්ෂල් ටයිම්ස්, අයිලන්ඩ්, මාර්තු 7.
- **කාන්තාවන් ආර්ථික වශයෙන් බලගැන්වීම තීරණාත්මක වේ**, සුනිමලී මධුරාවල, ද මෝනිං, මාර්තු 2.
- **ශ්‍රී ලංකාවේ ආන්තිකකරණය වූ ළමයින් සඳහා අධ්‍යාපන තාක්ෂණය: මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාප සහ අනෙකුත් ආසියානු රටවල සියුම් අවබෝධයන්**, හිමානි විතානගේ - ටෝකිං ඉකොනොමික්ස්, අද දෙරණ, ද මෝනිං, ෆයිනෑන්ෂල් ටයිම්ස්, සිලෝන් ටයිම්ස්, ඩේලි මිරර්, ඉකොනොමි නෙක්ස්ට්, සන්ඩේ ඔබ්සර්වර්, අයිලන්ඩ්, ජනවාරි 24.
- **ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම වැඩිහිටි කාන්තාවන්ට පීඩාකාරී වේ**, නිශා අරුණතිලක - ප්‍රොජෙක්ට් සින්ඩිකේට්, qoshe.com, ජනවාරි 10; ද කත්මණ්ඩු පෝස්ට්, ජනවාරි 12; ද සන්ඩේ ටයිම්ස්, ජනවාරි 14; ද ජෝර්දාන් ටයිම්ස්, පෙබරවාරි 9.

# සංක්‍රමණය සහ නාගරීකරණය

ගෝලීයකරණය වැඩිවෙමින් පවතින බැවින් සහ රටවල් අතර ආදායම් විෂමතා පුළුල් වෙමින් පවතින බැවින් බොහෝ ශ්‍රී ලාංකිකයන් රැකියා, අධ්‍යාපනය සහ පවුල් හේතූන් මත විදේශ රටවලට සංක්‍රමණය වෙමින් සිටිති. ඒ හා සමානව ම, සංචාරකයින් සහ සේවකයින් ශ්‍රී ලංකාවට ද පැමිණෙන අතර, වඩා හොඳ ආර්ථික අවස්ථා අපේක්ෂා කරමින් අභ්‍යන්තර සංක්‍රමණය නාගරික ප්‍රදේශ වෙත මාරු වෙමින් පවතියි. නාගරීකරණ විෂමතා ආමන්ත්‍රණය කිරීම සහ නිවාස, ප්‍රවාහනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙමගින් හරිත, සුහුරු සහ ඔරොත්තු දෙන නගර සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. එයට අමතරව, පශ්චාත් වසංගත ලෝකයක ජාත්‍යන්තර සංක්‍රමණයේ නව ගතිකත්වයට අනුවර්තනය වීම පිණිස විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් සමග සම්බන්ධ වීම වැඩි දියුණු කරන අතරම, පාලන රාමු සහ අපසු පැමිණෙන සංක්‍රමනිකයන් සඳහා ඇති සහාය නැවත සලකා බැලීම වීම අත්‍යවශ්‍ය වේ.

## සංක්‍රමණය සහ සංවර්ධනය


ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන **මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි සංක්‍රමණයෙහි සහ ප්‍රේෂණවල බලපෑම පිළිබඳ ව්‍යාපෘතිය: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂි** නැමති ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ නවතම ජාතික නියෝජනය සහිත දත්ත වන 'ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණය 2019' දත්ත කට්ටලය භාවිතා කරමින් සංක්‍රමණිකයන් සිටින නිවෙස්වල ළමයින් අතර මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කර බලනු ලැබේ,

දැනට සිදු කරමින් පවතින තවත් ව්‍යාපෘතියක් වන, සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන **තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා සංක්‍රමණයේ ප්‍රගතිය සහ දායකත්වය මැනීම පිණිස ජාතික රාමුවක් සකස් කිරීම** නැමති ව්‍යාපෘතිය මගින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට සංක්‍රමණය ඇතුළත් කිරීම පිළිබඳව සහ තිරසාර සංවර්ධන ඉලක්ක සන්දර්භය තුළ සංක්‍රමණයෙහි අදාළත්වය පිළිබඳව රජයේ නිලධාරීන්ව සංවේදී කරන අතර, සංක්‍රමණය පිළිබඳ විශ්වාසදායක සහ පරිපූර්ණ දත්ත සකස් කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අරමුදල් සපයනු ලබන **සංක්‍රමණික සේවිකාවන් මුහුණ දෙන ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිළිබඳ ප්‍රායෝගික සාක්ෂි** නැමති අධ්‍යයනය මගින් සංක්‍රමණ චක්‍රය තුළ සංක්‍රමණික සේවිකාවන් මුහුණ දෙන ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය අවම කිරීම සඳහා යෝග්‍ය වන ආරක්ෂක යාන්ත්‍රණ සකස් කරයි.

### ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.







- **සංක්‍රමණය සහ සංවර්ධනය - ප්‍රේෂණවල කාර්යභාරය**, සංක්‍රමණය සහ ගෝලීයකරණය පිළිබඳ රවුට්ලජ් අත්පොත (2 වන සංස්කරණය), ට්‍රයැන්ඩාෆිලිඩෝ, ඒ. එඩ්වඩ් එඩ්ගර් විසින් සංස්කරණය කරන ලදී (බිලේෂා වීරරත්න).
- **සමාජ ප්‍රේෂණ සහ සමාජ මාධ්‍ය: ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන අර්බුද අතරතුර සාක්ෂි,** ආසියාව සහ මැද පෙරදිග පිළිබඳ සමාජ ප්‍රේෂණ සහ සමාජ පරිවර්තන කෙරෙහි අවධානය යොමු කිරීම, සංස්කරණය කිරීම: නුස්රා ෂා, ලාහෝර් ආර්ථික විද්‍යා පාසල (බිලේෂා වීරරත්න).
- **අර්බුදයකදී අවිධිමත් ප්‍රේෂණ පිළිබඳ අවබෝධ කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් අත්දැකීම්** පිළිබඳ ප්‍රතිපත්ති අවබෝධයන්: ජනවාරි 2 (බිලේෂා වීරරත්න, පියුමි රණදේව සහ මනීෂා වීරද්දන).

## ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගී වන ලදී:

- රැකියා සඳහා සංක්‍රමණයවීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය.
- ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුව, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.

- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානය කර, සැප්තැම්බර් 5 වෙනි දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ දී පවත්වන ලද ශ්‍රී ලංකාවේ මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි සංක්‍රමණයෙහි සහ ප්‍රේෂණවල බලපෑම පිළිබඳ ඉදිරිපත් කිරීම, (බිලේෂා වීරරත්න).












- සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් සංවිධානය කර අගෝස්තු 31 වන දින ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ දී පවත්වන ලද **සංක්‍රමණය සහ තිරසාර සංවර්ධන ඉලක්ක අතර පවතිව සහසම්බන්ධය** පිළිබඳඉදිරිපත් කිරීම (බිලේෂා වීරරත්න).
- අගෝස්තු 21 වන දින විදේශීය රටවල ශ්‍රී ලාංකික කටයුතු පිළිබඳ කාර්යාලය විසින් සංවිධානය කර ජාතික තරුණ සේවා සභාවේදී පවත්වන ලද "Clicks to Progress: වඩාත් සුහුරු ශ්‍රී ලංකාවක් සඳ හා තරුණයින්" යන මාතෘකාව යටතේ පැවති **2024 තරුණ සංවාදයේ** විද්වත් මණ්ඩල සාමාජික (බිලේෂා වීරරත්න).
- අගෝස්තු 15 වන දින එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් සංවිධානය කර බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද, **අනාගතය හැඩගැස්වීම: ජනගහන ගතිකයන් පිළිබඳ ප්‍රතිපත්ති සංවාදය** පිළිබඳ වැඩසටහනේ විද්වත් මණ්ඩල සාමාජික (බිලේෂා වීරරත්න).
- ජූලි 9 - 11 දිනවල එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ්හි ගල්ෆ් පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කර කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද "දහහතර වන ගල්ෆ් පර්යේෂණ රැස්වීම" අවස්ථාවේ දී, **එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වීසා නියෝගවල වෙනස්වීම් සහ සංක්‍රමණයේ අවිධිමත් ජාලවල ගතිකයන්: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂි** පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී (බිලේෂා වීරරත්න).
- ජූනි 25 වන දින, කොළඹ 10 පිහිටි තිරසාර සංවර්ධන සභාවේ දී පවත්වන ලද "සංක්‍රමණය සහ තිරසාර සංවර්ධන ඉලක්ක - දෙවන අන්තර්-නියෝජිතායතන කමිටු රැස්වීම" අවස්ථාවේ දී **තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා සංක්‍රමණයෙහි ප්‍රගතිය සහ දායකත්වය මැනීම සඳහා ජාතික රාමුවක් සකස් කිරීම** පිළිබඳ ව්‍යාපෘති සැලැස්ම ඉදිරිපත් කරන ලදී (බිලේෂා වීරරත්න).
- බාලි ක්‍රියාවලියේ කලාපීය සහාය කාර්යාලය, ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයනු ලබන ආසියාන්-ඕස්ට්‍රේලියානු ජාවාරම් මැඩපැවැත්වීමේ වැඩසටහන සහ දේශාන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහි ගෝලීය වැඩසටහන විසින් සංවිධානය කර, ජූනි 4 - 5 දිනවල ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පවත්වන ලද "පුද්ගලයින් ජාවාරම් කිරීමෙන් උපයා ගන්නා මුදල් සොයා ගැනීම" යන මාතෘකාව යටතේ පවත්වන ලද තාක්ෂණ විශේෂඥ රැස්වීමේ දී, **මිනිස් ජාවාරමට සම්බන්ධ අවිධිමත් ප්‍රේෂණ** පිළිබඳඉදිරිපත් කිරීම, (බිලේෂා වීරරත්න).
- මාර්තු 26 වන දින කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කර, කොළඹ විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද **කොළඹ ව්‍යාපාරික ආර්ථික සමුළුවේ** විද්වත් මණ්ඩල සාමාජික (බිලේෂා වීරරත්න).



- මාර්තු 4 - 6 දිනවල තායිලන්තයේ බැංකොක් නුවර පැවති, ඕස්ට්‍රේලියාවේ සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් සංවිධානය කරන ලද, ආපසු පැමිණීම් සහ නැවත සමාජ සංකලනය කිරීම පිළිබඳ බාලි ක්‍රියාවලියේ තාක්ෂණ විශේෂඥ කණ්ඩායමේ හයවන රැස්වීමේ දී, **ආර්ථික වශයෙන් නැවත සංකලනය කිරීම** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (බිලේෂා වීරරත්න).
- ජනවාරි 18 වන දින කොළඹ, මූවන්පික් හෝටලයේ පැවති, ස්ත්‍රී-පුරුෂ සමාජභාව සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආයතනය (UN Women) විසින් සංවිධානය කරන ලද, **ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය සහ කුසලතා සංවර්ධනය සඳහා ඔවුන්ට තිබෙන ප්‍රවේශය** පිළිබඳ වටමේස සාකච්ඡාවක සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම (බිලේෂා වීරරත්න).

## ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය / මාධ්‍ය සමග සමග සම්බන්ධවීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- දේශසීමා ඉක්මවා ඡන්දය දීම: විදේශගත ශ්‍රී ලාංකිකයන්ට අවසානයේ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කළ හැකිද? බිලේෂා වීරරත්න - ටෝකිං ඉකොනොමික්ස්, ඉකොනොමි නෙක්ස්ට්, අද දෙරණ, නොවැම්බර් 5.
- ශ්‍රම සංක්‍රමණයේ වෙනස්වන මුහුණුවර, බිලේෂා වීරරත්න - TV1 රූපවාහිනී නාලිකාවේ නිව්ස් ෆර්ස්ට් වැඩසටහන, ද පීපල්ස් ප්ලැට්ෆෝර්ම්, අප්‍රේල් 2.

# දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය

පසුගිය දශකය තුළ දරිද්‍රතාවය අඩු කිරීම සම්බන්ධ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇතත්, අසමානාත්මතාවය සහ අවදානම්සහගත භාවය පිළිබඳ ගැටළු ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති සාකච්ඡාවල ප්‍රමුඛස්ථානයේ පවතියි. අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය සහ සනීපාරක්ෂාව සහ මූල්‍ය සේවා වැනි අත්‍යවශ්‍ය සේවා සහ යටිතල පහසුකම් වෙත ප්‍රවේශයෙහි පවතින විෂමතා රටෙහි අඛණ්ඩව පවතින ඉහළ මට්ටමේ ආදායම් විෂමතාවයට දායක වෙයි. අවදානම් සහගත තත්ත්වයන්හි සිටින ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතා රේඛාවට යන්තමින් ඉහළින් සිටින බවත්, අහිතකර කම්පනවල බලපෑම අවම කිරීම සඳහා ප්‍රමාණවත් සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග නොමැතිව ඔවුන් දරිද්‍රතාවයට පහත වැටීමේ ඉහළ අවදානමකට මුහුණ දෙන බවත් කොවිඩ්-19 වසංගතය මගින් අවධාරණය කර ඇත.

## දරිද්‍රතාවය සහ අසමානාත්මතාවය

**ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට යුනිසෙෆ් සංවිධානයේ ප්‍රතිචාරය ලේඛනගත කිරීම** පිළිබඳ අධ්‍යයනය 2024 වර්ෂයේ දී අවසන් කරන ලදී. මේවාට යහපරිචයන් ඉස්මතු කිරීම, මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම සහ මෙම අත්දැකීමෙන් වටිනා පාඩම් ඉගෙන ගැනීම අවධාරණය කරන යුනිසෙෆ් ප්‍රතිචාර උපාය මාර්ග,ඇතුළත් විය. **අස්වැසුම වැඩසටහනෙහි ඵලදායීත්වය තක්සේරු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය** මගින් එහි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ විවිධ සුදුසුකම් ලැබීමේ නිර්ණායක යටතේ එම වැඩසටහන හරහා කුටුම්භ වෙත මුදල් ලබාදීමෙහි බලපෑම පෙන්නුම් කරන විශ්ලේෂණාත්මක රාමුවක් සකස් කරයි.

## සමාජ ආරක්ෂණය

ආසියානු සංවර්ධන බැංකුවෙහි අරමුදල් සැපයීම යටතේ දැනට සිදු කෙරෙමින් පවතින **ආසියා පැසිෆික් කලාපයේ අන්තර්කරණය වූ සහ ඔරොත්තු දෙන සමාජ ආරක්ෂණ පද්ධති සකස් කිරීම: ආවරණය සහ ඵලදායීත්වය පිළිබඳ සමාජ ආරක්ෂණ දර්ශක** නැමති අධ්‍යයනය මගින් රටක සමාජ ආරක්ෂණ වැඩසටහන්වල ආවරණය සහ කාර්යක්ෂමතාව අවබෝධ කර ගැනීම සඳහා වන සමාජ ආරක්ෂණ දර්ශකය සකස් කිරීමට අරමුණු කරයි.

## තිරසාර සංවර්ධන ඉලක්ක

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම** පිළිබඳ ව්‍යාපෘතිය මගින්, බාහිර කම්පන ද ඇතුළුව ශ්‍රී ලංකාවේ බහුවිධ අර්බුදවලින් රටේ තිරසාර සංවර්ධන ඉලක්කවල ප්‍රගතියට සහ තෝරාගත් අවදානම්පාත්‍ර කණ්ඩායම්වලට ඇතිකරන බලපෑම පරීක්ෂා කිරීමට සහ අවස්ථා, ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක වලට මූල්‍යය සපයාදීම සඳහා විකල්ප හඳුනා ගැනීමට අරමුණු කරයි.

### ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.

- යහපාලනය තුළින් ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ආයතනවල ප්‍රතිලාභීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම: ස්ථාවරය පිළිබඳ පත්‍රිකාවක් සහ නිර්දේශ, ලෝක කම්කරු සංවිධානය සහ EFC (නිශා අරුණතිලක, සුරේෂ් රණසිංහ සහ හිමානි විතානගේ).
- පවුලේ ආදායම කොවිඩ්-19 වසංගත කාලය තුළ පරිපූර්ණ විද්‍යුත් ඉගෙනුම් අත්දැකීමක් ලබා ගැනීම අවශ්‍යයෙන් ම පාලනය නොකරයි: ශ්‍රී ලංකාවේ අධ්‍යයනයක්, එන්. සෙනරත්, ඩබ්ලිව්. දේදුනුපිටිය, ජී. ඉලංගරත්න, අයි. තිලකසිරි, බී. සමරකෝන්, එල්. රාමනායක, ආර්. ගොඩලියද්ද, පී. ඒකනායක, වී. හේරත්, එම්. පින්නවල, එස්. යටිගම්මන, ජේ. ඒකනායක, එස්. ධර්මරත්න, සහ ගංගා තිලකරත්න, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සන්නිවේදන, 11 වෙනි වෙළුම (ගංගා තිලකරත්න).




- ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් රාජ්‍ය මූල්‍ය හා සමාජ ස්ථාවරත්වය කරා පරිවර්තනය කිරීම, ඩිවලොප්මන්ට් ඒසියා, නොවැම්බර් 28 (ප්‍රියංකා ජයවර්ධන) .
- බංග්ලාදේශයේ SANEM විසින් ප්‍රකාශයට පත් කරන ලද Thinking Aloud 2024 පෙබරවාරි කලාපයේ පළ කරන ලද ශ්‍රී ලංකාවේ බහුවිධ අර්බුද මධ්‍යයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, පෙබරවාරි 1 (ගංගා තිලකරත්න) .
- ප්‍රතිපත්ති-පර්යේෂණ අතුරුමුහුණත් මැදිහත්වීම සහ සක්‍රීය කිරීම: දකුණු ආසියාව සඳහා කෘෂිකර්මාන්ත අංශයේ දේශගුණික අනුවර්තනය සහ අන්තර්කරණය වූ සංවර්ධනය, ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය, කැන්බරා (නිශා අරුණතිලක, මනෝජ් තිබ්බොටුවාව, අසංක විජේසිංහ සහ බිලේෂා වීරරත්න).

## ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගී වෙන ලදී:

- ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සකස් කර අවසන් කිරීම සඳහා වූ තාක්ෂණික කමිටුව, මුදල් අමාත්‍යාංශය.
- සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම පිළිබඳ උප කමිටුව, කම්කරු අමාත්‍යාංශය.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.













- දෙසැම්බර් 14 වන දින නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති, ප්‍රතිපත්ති සංවාද මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද, "නව්‍ය අදහස් සහ දැනුම බෙදාගැනීම පිළිබඳ කලාපීය උපදේශනය" නැමති වැඩසටහනේ **තාක්ෂණය හරහා රැකියා නිර්මාණය** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (ගංගා තිලකරත්න).
- දෙසැම්බර් 11 - 13 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති "දකුණු ආසියාවේ සාධාරණ හරිත පරිවර්තනයක් සඳහා ඉඩහැරීම" යන මාතෘකාව යටතේ පැවති පහළොස්වන දකුණු ආසියානු ආර්ථික සමුළුවේ දී **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සීඝ්‍රතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (ගංගා තිලකරත්න).
- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජර්මානු සංගමය සමග එක්ව ඔක්තෝබර් 22 - 24 දිනවල ඉන්දියාවේ නවදිල්ලි නුවර දී සංවිධානය කරන ලද "ගෝලීය තිරසාර සංවර්ධන වාර්තාවේ ආසියා පැසිෆික් කලාපය සඳහා වූ කලාපීය ප්‍රචාරණ වැඩමුළුවේ" දී **නාගරික සහ අර්ධ නාගරික සංවර්ධනය පිළිබඳ සැසියේ** කථිකයෙකු ලෙස කටයුතු කිරීම (ගංගා තිලකරත්න).
- නොවැම්බර් 7 වන දින යුනිසෙෆ් සංවිධානයේ දකුණු ආසියානු ප්‍රාදේශීය කාර්යාලය විසින් මාර්ගගතව සංවිධානය කරන ලද "හදිසි අවස්ථා වලදී සාක්ෂි ලබා ගැනීම: දකුණු ආසියාවේ ඇගයීම් ක්‍රියාකාරකම් වලින් උගත හැකි පාඩම්" යන මාතෘකාව යටතේ පැවති මාර්ගගත සම්මන්ත්‍රණයේ **ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට යුනිසෙෆ් සංවිධානයේ ප්‍රතිචාරය** පිළිබඳ ඉදිරිපත් කිරීම (ගංගා තිලකරත්න).
- **තිරසාර සංවර්ධන සභාව** විසින් අගෝස්තු 27 වන දින අරලියගහ මන්දිරයේ දී සංවිධානය කරන ලද **තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාතික සංසදයේ** විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).
- ජාතික විද්‍යා පදනම සහ ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභා සංගමය විසින් සංවිධානය කර ජූලි 31 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවර්ධනය පිළිබඳ ජාතික උපදේශනය' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී **සමාජ සංවර්ධනය සහ සමාජ ආරක්ෂාව** පිළිබඳ සැසියක ඉදිරිපත් කිරීම සහ සැසියේ මුලසුන දැරීම (නිශා අරුණතිලක).
- UNESCAP නිරිතදිග ආසියානු කාර්යාලය සහ තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාලය විසින් අප්‍රේල් 3 වන දින අන්තර්ජාලය ඔස්සේ සංවිධානය කරන ලද **දකුණු සහ නිරිතදිග ආසියාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා සහයෝගී ප්‍රවේශය: දේශගුණික විපර්යාස සහ ඉදිරි මාවත** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (ගංගා තිලකරත්න).

- මානව සංවර්ධනය පිළිබඳ ආයතනය සහ 'සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පර්යේෂණ සහ තොරතුරු පද්ධති' නැමති සංවිධානය ජනවාරි 10 - 13 දිනවල ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ඉන්දියානු රජයේ NITI Aayog සමග හවුල්කාරිත්වයෙන් යුතුව සංවිධානය කරන ලද 'ගෝලීය දකුණේ මානව සංවර්ධනය දියුණු කිරීම' පිළිබඳ ගෝලීය සමුළුවේදී '**ශ්‍රී ලංකාවේ බහුවිධ අර්බුද මධ්‍යයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම**' පිළිබඳ ඉදිරිපත් කිරීම (ගංගා තිලකරත්න).

## ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය / මාධ්‍ය සමග සමග සම්බන්ධවීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- **ශ්‍රී ලංකාවේ වර්තමාන පෝෂණ අභියෝග: ඒවා ආමන්ත්‍රණය කළ හැක්කේ කෙසේද?** පුලස්ති අමරසිංහ - ටෝකිං ඉකොනොමික්ස්, ද මෝනිං, ඩේලි නිවුස්, අද දෙරණ, ඛර්ධ, නොවැම්බර් 12.
- **අලුත් අවුරුද්ද, අලුත් වැටි බද්ද: ශ්‍රී ලංකාවේ දුප්පතුන්ට එම ඉහළයාමට මුහුණ දිය හැකිද?**, ලක්ෂිලා වනිගසිංහ - ටෝකිං ඉකොනොමික්ස්, ෆයිනෑන්ෂල් ටයිම්ස්, ඩේලි මිරර්, අයිලන්ඩ්, අද දෙරණ, ඛර්ධ, සිලෝන් ටයිම්ස්, සන්ඩේ ඔබ්සර්වර්, ද මෝනිං, සන්ඩේ ටයිම්ස්, ජනවාරි 10.
- **ලබා දීමට ක්ලික් කරන්න: ශ්‍රී ලංකාවේ ඩිජිටල් අරමුදල් රැස් කිරීමේ අනාගතය**, චායා දිසානායක - ෆයිනෑන්ෂල් ටයිම්ස්, ඩේලි මිරර්, ඩේලි නිව්ස්, ද මෝනිං, සන්ඩේ ඔබ්සර්වර්, සිලෝන් ටයිම්ස්, අද දෙරණ, ඛර්ධ, අගෝස්තු 7.
- **ආහාර තිබෙන්නේ කොහෙද? වසංගතය සහ ආර්ථික අර්බුද ආහාර පරිභෝජනය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ මානව ප්‍රාග්ධනය කෙරෙහි ඇති කරන බලපෑම**, පුලස්ති අමරසිංහ, නිව්ස් ෆස්ට්/ ඔඩ1, ද පීපල්ස් ප්ලැට්ෆෝර්ම්, මාර්තු 14.
- **ආහාර කොහෙද? වසංගතය සහ ආර්ථික අර්බුද ආහාර පරිභෝජනය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ මානව ප්‍රාග්ධනය කෙරෙහි ඇති කරන බලපෑම**, පුලස්ති අමරසිංහ, ද පීපල්ස් ප්ලැට්ෆෝර්ම්, මාර්තු 14.

# කෘෂිකර්මාන්තය සහ කෘෂිකාර්මික ව්‍යාපාර සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය අඩු ඵලදායිතාවය, අකාර්යක්ෂම සම්පත් භාවිතය සහ තිරසාර නොවන ගොවිතැන් ක්‍රම ඇතුළු අභියෝග කිහිපයකට මුහුණ දෙයි. අපනයනය කේන්ද්‍ර කරගත් වැවිලි අංශය ද මෙම ගැටළු මෙන්ම භාණ්ඩ මිල උච්චාවචනය වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් අර්බුදයකට ලක්ව තිබේ. මෙම ගැටළු එකට එක්වී රට තුළ ආහාර අනාරක්ෂිතභාවයට, මන්දපෝෂණයට සහ දරිද්‍රතාවයට දායක වේ. ඒවාට ප්‍රතිචාර වශයෙන්, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව විසින් කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා උසස් තාක්ෂණික නවෝත්පාදන උපයෝගී කර ගැනීමට අරමුණු කරයි. දේශීයව නිෂ්පාදනය කරන ලද මාළු සහ කිරි නිෂ්පාදන ඇතුළත් ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර වෙත ප්‍රවේශය සහතික කිරීම මෙන්ම නව තාක්ෂණයන් හරහා අගය එකතු කළ අපනයන වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත් වේ.

## ආහාර සුරක්ෂිතතාවය

ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් අරමුදල් සපයන ලද සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද **ප්‍රතිපත්ති පර්යේෂණ ධාරිතාව සහ බලපෑම 4 වන වසර** නැමති අධ්‍යයනය මගින් දේශගුණික විපර්යාස සහ අනුවර්තනය සඳහා වන උපාය මාර්ග සහ ඒ සඳහා ඇති බාධක පිළිබඳ ගොවීන්ගේ අවබෝධය විශ්ලේෂණය කරයි.

ග්‍රාමණී කොරෙයා පදනම විසින් අරමුදල් සපයන ලද **ශ්‍රී ලංකාවේ ආහාර මිල ඉහළ යාම, ආහාර සුරක්ෂිතතාව සහ දරිද්‍රතාවය අතර ඇති සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම** නැමති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර භාණ්ඩ සඳහා වන ඉල්ලුමෙහි වියදම් සහ මිල නම්‍යතා ඇස්තමේන්තු කරයි. භාණ්ඩ මිල, සමාජ සුභසාධනය සහ වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළු රජයේ ප්‍රතිපත්ති ප්‍රතිචාර සඳහා සහාය වීම පිණිස මෙම අධ්‍යයනය මගින් සියුම් අවබෝධයන් සපයා දෙයි.

## කෘෂිකර්ම ප්‍රතිපත්ති සහ ආයතන

2024 වර්ෂයේ දී මෙම අංශයේ ව්‍යාපෘති දෙකක් නිම කරන ලදී. ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමග එක්ව සිදු කරන ලද **ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ කෘෂිකාර්මික පරිවර්තනයට අදාළ රාජ්‍ය වියදම් විශ්ලේෂණය** මගින් එම අංශයේ අවධානය යොමු කිරීම උප-අංශ හෝ ආයතන අතර මාරුවී ඇති ආකාරය විමසා බැලීම සඳහා මෙන්ම, අඩුවෙන් අරමුදල් වෙන්කර ඇති උප-අංශ සහ අරමුදල් අධික ලෙස වෙන්කර ඇති උප-අංශ යන දෙක ම අවධාරණය කරමින් වර්තමානයේ අරමුදල් බෙදීගොස් ඇති ආකාරය විමසා බැලීම සඳහා ඓතිහාසික වියදම් ප්‍රවණතා පරීක්ෂා කරන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානය සමග එක්ව සිදු කරන ලද **දුම්කොළ ගොවීන් විකල්ප භෝග ගොවීන් බවට පරිවර්තනය කිරීම: ක්‍රියාකාරී සැලැස්මක්** නැමති ව්‍යාපෘතිය මගින් විකල්ප භෝග හඳුනා ගැනීම හරහා දුම්කොළ වගාවට යොදාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අඩු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අරමුණු කර ඇත.

එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්ත අංශය සඳහා මාර්ග සිතියමක් සහ උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම** නැමති අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්ත අංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ මාර්ග සිතියමක් සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගත් තවත් ව්‍යාපෘතියක් වේ. එමගින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේ ම පාර්ශ්වකරුවන් සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ඉදිරිපත් කරනු ලැබේ.

## කෘෂි ව්‍යාපාර අගය දාම


ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය සමග එක්ව සිදු කරනු ලබන **සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ ආහාර පාඩු අවම කිරීමේ මාර්ග සකස් කිරීම** පිළිබඳ අධ්‍යයනය මගින් අඹ සහ තක්කාලි ප්‍රධාන නිෂ්පාදන රේඛා ලෙස භාවිතා කරමින් ආහාර පාඩුවල ස්වභාවය, විෂය පථය සහ එම පාඩු ඇතිවීමට බලපාන හේතු පරීක්ෂා කිරීමට සහ පාඩු අවම කිරීමට උපකාරී වන චර්යාමය වෙනස්වීම් මෙහෙයවීමේ දී නවෝත්පාදන සමූහයක ඇති ඵලදායීත්වය පෙන්නුම් කිරීමට අරමුණු කරයි.

### ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි, ක්‍රියාකාරී පත්‍රිකා සහ ප්‍රතිපත්ති සංක්ෂිප්ත වැනි පුළුල් පරාසයක ප්‍රකාශන සහ ප්‍රකාශන වේදිකා හරහා කාලීන ගැටළු පිළිබඳ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු ප්‍රචාරණය කරයි.

- **ශ්‍රී ලංකාව ධාන්‍ය වර්ග වලින් ස්වයංපෝෂිත වීමට උත්සාහ කළ යුතුද?**, නටරාජන්, කේ., තිබ්බොටුවාව, එම්., සහ බාබු, එස්., ප්‍රතිපත්ති සටහන, ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය, වොෂින්ටන් ඩී.සී., අප්‍රේල් (මනෝජ් තිබ්බොටුවාව).
- **අඹ නිෂ්පාදනයේ ආහාර පාඩු අවම කිරීම සඳහා දැනුම අඩුපාඩු පියවීම: අඹ ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන**, FLM Briefing අංක 4, ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය, (මනෝජ් තිබ්බොටුවාව සහ චන්දුල ඉදිරිසිංහ).
- **ගෙවතු වල ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන පද්ධතියේ විවිධ තෝරා ගැනීම් කෙරෙහි සමාජ-ආර්ථික සහ ආයතනික සාධකවල බලපෑම: මහකණුමුල්ල ගම්මානයේ එල්ලංගා වැව් පද්ධතිය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්**, පී.එස්.එච්., වීරසූරිය, සහ සිල්වා, එස්.ඒ., නිවර්තන කෘෂිකාර්මික පර්යේෂණ. 35(1):84-93, (සුලෝචන සිල්වා)







- **කාබනික කෘෂිකර්මාන්තය වෙත හදිසියේ ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ ප්‍රතිවිපාකයෙන් පසු ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව**, පුෂ්පා ෂර්මා සහ සයිදුදීන් ෆරීඩ් (සංස්.) විසින් රචිත 'දකුණු ආසියාවේ ආහාර සුරක්ෂිතතාව'. දකුණු ආසියානු අධ්‍යයන ආයතනය, සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය, දෙසැම්බර් (මනෝජ් තිබ්බොටුවාව).

## ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රජයේ ප්‍රතිපත්ති කමිටුවලට සක්‍රීය සහභාගීත්වය ලබා දීම හරහා රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට සාක්ෂි පදනම් කර ගත් යෙදවුම් සපයා දීම මගින් ජාතික ප්‍රතිපත්ති ගැටළු ආමන්ත්‍රණය කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගී වෙන ලදී:

- ආහාර සහ පෝෂණ ආරක්ෂණ කමිටුවේ ප්‍රතිපත්ති සහ නියාමන මැදිහත්වීම් පිළිබඳ විශේෂඥ පර්ෂදය, ජනාධිපති ලේකම් කාර්යාලය.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විසිතුන්වන කෘෂිකර්මාන්ත ආංශික කමිටු රැස්වීම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන, ජූලි 2.
- සුළු අපනයන භෝග සඳහා භූගෝලීය දර්ශකය උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික කමිටුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
- සමාජ-ආර්ථික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ කමිටුව, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, කෘෂිකර්ම අමාත්‍යාංශය.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.







- ෆයිසලාබාද් කෘෂිකර්ම විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ විද්‍යා ආයතනය විසින් පකිස්ථාන කොරියානු පෝෂණ මධ්‍යස්ථානය සමග එක්ව නොවැම්බර් 12 වන දින මාර්ගගතව සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයකදී, **පළතුරු සහ එළවළු අගය දාමවල ආහාර පාඩු අවම කිරීම** පිළිබඳ ආරාධිත දේශනය (මනෝජ් තිබ්බොටුවාව).
- තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනය විසින් නොවැම්බර් 5 - 7 දිනවල පකිස්තානයේ ඉස්ලාමාබාද් නුවර දී සංවිධානය කරන ලද 27 වන **තිරසාර සංවර්ධන සමුළුව: බිඳෙනසුලු බවේ සිට ඔරොත්තු දීමේ හැකියාව දක්වා - තිරසාර සංවර්ධනය වැඩි දියුණු කිරීම** නැමති වැඩමුළුවේ **ණය, යුක්තිය සහ සංවර්ධනය, සහ අන්තර්කරණය වූ බෝග අපද්‍රව්‍ය කළමනාකරණය සහ තිරසාර කෘෂිකර්මාන්තය** පිළිබඳ සැසිවල විද්වත් මණ්ඩල සාමාජික, (දුෂ්නි වීරකෝන්).
- අගෝස්තු 8 - 9 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර දී ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද '2024 ගෝලීය ආහාර ප්‍රතිපත්ති වාර්තාවේ **දකුණු ආසියානු එළිදැක්වීම' අවස්ථාවේ දීදකුණු ආසියාවේ ආහාර පරිසරයන් සහ වෙළඳපොළ** පිළිබඳ සැසියක විද්වත් මණ්ඩල සාමාජික (දුෂ්නි වීරකෝන්).
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන පර්යේෂණ සහ තොරතුරු පද්ධතිය විසින් ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය, මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය සහ ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතා සහ බලපෑම සඳහා වන ෆීඩ් ද ෆියුචර් නවෝත්පාදන රසායනාගාරය සමග එක්ව ජුනි 25 වන දින ඉන්දියාවේ නවදිල්ලි නුවරදී සංවිධානය කරන ලද "කෘෂිකාර්මික වෙළඳාමේ බිම්ස්ටෙක් සහයෝගීතාවයන්: ඉන්දියා හැබිටට් මධ්‍යස්ථානයේ කලාපීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම" නැමති වැඩමුළුවේ දී **BIMSTEC කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනය: කලාපීය සහයෝගීතාවයේ විෂය පථය** පිළිබඳ ඉදිරිපත් කිරීම (මනෝජ් තිබ්බොටුවාව).

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් ජූනි 13 වන දින කොළඹ හිල්ටන් හෝටලයේ දී සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ අන්තර්කරණය වූ කෘෂිකාර්මික පරිවර්තනයක් සඳහා රාජ්‍ය වියදම් ප්‍රමුඛ කිරීම" පිළිබඳ වැඩමුළුවේ දී **ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ රාජ්‍ය වියදම් වෙන් කිරීම: සංයුතිය සහ ප්‍රවණතා** පිළිබඳ ඉදිරිපත් කිරීම (මනෝජ් තිබ්බොටුවාව).
- මාර්තු 21 වන දින, මහනුවර මහවැලි රීච් හෝටලයේ දී "ACIAR FLMP මධ්‍ය කාලීන සමාලෝචන වැඩමුළුවේදී", අපනයනය සඳහා TomEJC **අඹ නිෂ්පාදනය පිළිබඳ දැනුම හුවමාරු කරගැනීම** පිළිබඳ ඉදිරිපත් කිරීම (චන්දුල ඉදිරිසිංහ).












- මාර්තු 21 වන දින, මහනුවර මහවැලි රීච් හෝටලයේ දී "ACIAR FLMP මධ්‍ය කාලීන සමාලෝචන වැඩමුළුවේදී", **පකිස්තානයේ සහ ශ්‍රී ලංකාවේ අඹ සහ තක්කාලි ආගය දාමයන්හි සුහුරු ව්‍යාපාර පිළිවෙත් හරහා ආහාර අලාභය අවම කිරීමේ මාර්ග සකස් කිරීමේ ශ්‍රී ලංකාවේ ගමන** පිළිබඳඉදිරිපත් කිරීම (මනෝජ් තිබ්බොටුවාව).
- මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කර, මාර්තු 8 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි රොනල්ඩ් රේගන් ගොඩනැගිල්ල සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ දී පවත්වන ලද" ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතා සහ බලපෑම සඳහා වන ෆීඩ් ද ෆියුචර් නවෝත්පාදන රසායනාගාරයේ දෙවන ගෝලීය රැස්වීම" වැඩසටහනේ දී, **පසුගිය වසර 4 තුළ දේශගුණික විපර්යාස, කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ 'ප්‍රතිපත්ති, පර්යේෂණ ධාරිතා සහ බලපෑම' විසින් අත්කරගෙන තිබෙන සාර්ථකත්වයන්** පිළිබඳ පෝස්ටර් ඉදිරිපත් කිරීම (ගංගා තිලකරත්න සහ මනෝජ් තිබ්බොටුවාව).
- මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කර, මාර්තු 7 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි දී පවත්වන ලද "ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතා සහ බලපෑම සඳහා වන ෆීඩ් ද ෆියුචර් නවෝත්පාදන රසායනාගාරයේ දෙවන ගෝලීය රැස්වීම" වැඩසටහනේ දී **රසායනික පොහොර තහනමෙන් උගත් පාඩම්: සහල් අගය දාම විශ්ලේෂණය පිළිබඳ ඉදිරිපත් කිරීම** (මනෝජ් තිබ්බොටුවාව).
- 'එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය - ශ්‍රී ලංකාව' විසින් සංවිධානය කර පෙබරවාරි 27 වන දින වෝටර්ස් එජ් හි දී පවත්වන ලද **"කුළුබඩු දිගන්තයන්: ශ්‍රී ලංකා කුරුඳුවල ආරක්ෂිත භූගෝලීය දර්ශක සහ අපනයන සංවර්ධනය සඳහා අනෙකුත් ආරක්ෂිත භූගෝලීය දර්ශක නිෂ්පාදනවල අනාගතය"** නැමති සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (ඩිලානි හිරිමුතුගොඩගේ).
- ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය, ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතා සහ බලපෑම සඳහා වන නවෝත්පාදන රසායනාගාරය සහ දේශගුණික විපර්යාස ක්‍රියාමාර්ග සඳහා වූ විස්තීර්ණ වැඩසටහන සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද **කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස: විශ්ලේෂණාත්මක ක්‍රම සහ ප්‍රතිපත්ති සන්නිවේදනය** පිළිබඳ වැඩමුළුව.

## ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය / මාධ්‍ය සමග සමග සම්බන්ධවීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය හරහා ආයතනයේ නවතම සාක්ෂි පදනම් කරගත් සොයාගැනීම් බෙදා හරියි.

- **ශ්‍රී ලංකාවේ අඹ වෙළඳපොළේ සෘතුමය උච්චාවචනයන්: සියුම් ආර්ථික අවබෝධයන් සමග සමතුලිත කිරීමේ ක්‍රියාකාරකමක්**, චන්දුල ඉදිරිසිංහ - ටෝකිං ඉකොනොමික්ස්, ෆයිනෑන්ෂල් ටයිම්ස්, ද මෝනිං, ඩේලි මිරර්, අයිලන්ඩ්, සිලෝන් ටුඩේ, සන්ඩේ ඔබ්සර්වර්, අද දෙරණ, බ්ර්ඩ, ජූලි 9.
- **මාෂබෝගවල ස්පන්දනය මැනීම: ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම**, කිරුද්කා නටරාජන්, මනෝජ් තිබ්බොටුවාව සහ සුරේෂ් බාබු - ටෝකිං ඉකොනොමික්ස්, ෆයිනෑන්ෂල් ටයිම්ස්, ද මෝනිං, ඉකොනොමි නෙක්ස්ට්, ඩේලි මිරර්, සිලෝන් ටුඩේ, සන්ඩේ ඔබ්සර්වර්, ඩේලි නිව්ස්, අද දෙරණ, ටයිම්ස් ඔන්ලයින්, මැයි 8.
- **ශ්‍රී ලාංකික කුළුබඩු වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම**, ඩිලනි හිරිමුතුගොඩගේ - සන්ඩේ මෝනිං, අප්‍රේල් 13.

# පරිසරය, ස්වභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස

ඉහළ යමින් පවතින ගෝලීය දේශගුණික විපර්යාස තර්ජනය මගින් වර්ධනය කාබන් විමෝචනය අඩු සහ දේශගුණික බලපෑම් වලට ඔරොත්තු දෙන වර්ධනයක් විය යුතු ය යන අවශ්‍යතාවය එකතු කර තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් "තිරසාර පාරිසරික කළමනාකරණය" එහි ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර දහයෙන් එකක් ලෙස පිළිගෙන තිබේ. එයට අමතරව, එමගින් විදුලිබලය හා බලශක්තිය, ජල කළමනාකරණය, ආපදා කළමනාකරණය සහ අලි-මිනිස් ගැටුමට විසඳුම් සෙවීම යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති මැදිහත්වීම් කිහිපයක් ද යෝජනා කර ඇත. පරිසරය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමේ අතිශය වැදගත් අවශ්‍යතාවය ද එම රාමුව මගින් අවධාරණය කරයි.

## පරිසරය සහ ස්වාභාවික සම්පත් ප්‍රතිපත්ති

ඒකාබද්ධ කඳුවැටි සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය සමග එක්ව සිදු කරනු ලබන **වනාන්තර ප්‍රතිසංස්කරණයේ ආර්ථික විද්‍යාව: ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්කවල වනාන්තර භූ දර්ශන ප්‍රතිසංස්කරණය** පිළිබඳ අධ්‍යයනය මගින් වනාන්තර ප්‍රතිසංස්කරණයේ ආර්ථික විද්‍යාව, විශේෂයෙන් ම දකුණු ආසියාවේ හායනය වී ඇති, මෑතකදී අස්වැන්න ලබාගන්නා ලද වනාන්තර (නැවත වන වගා කිරීම) සහ ආන්තික හෝ අතහැර දමා ඇති බෝග ඉඩම් සහ තණබිම් (වන වගා කිරීම) නැවත ස්ථාපනය කිරීම විභව්‍ය, ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම් විකල්පයක් ලෙස අවබෝධ කර ගැනීමට අරමුණු කරයි.

## දේශගුණික විපර්යාස

ඉන්දියාවේ IPE Global ආයතනය සමග එක්ව **ශ්‍රී ලංකාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචනය** නැමති සම්පූර්ණ කරන ලද අධ්‍යයනය මගින් දකුණු ආසියාවේ කෘෂි ආහාර පද්ධති කෙරෙහි අවධානය යොමු කරමින් දේශගුණික අනුවර්තනය සඳහා හවුල්කාරිත්ව සහ ආයෝජන අවස්ථා හඳුනා ගැනීමට අරමුණු කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් අරමුදල් සපයනු ලබන **ශ්‍රී ලංකාවේ දේශගුණය සම්බන්ධ රාජ්‍ය වියදම් සඳහා සහාය සහ ආයතනික සමාලෝචනය** පිළිබඳ ව්‍යාපෘතිය ජාතික සහ උප-ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සම්බන්ධ ආයෝජන පිළිබඳ ඇගයීම පිණිස දේශගුණය සම්බන්ධ රාජ්‍ය වියදම් සහ ආයතනික සමාලෝචනයක් සිදුකරයි.

## හරිත ආර්ථිකය

එක්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය සමග එක්ව සිදු කරනු ලබන **ශ්‍රී ලංකාවේ දේශගුණය සහ ස්වභාව ධර්මය සඳහා ණය හුවමාරු කරගැනීම පිළිබඳ විෂය පථය හඳුනා ගැනීමේ අධ්‍යයනය** මගින් ශ්‍රී ලංකාව සඳහා ණය සහන ලබා දීමේ විකල්ප මූල්‍ය මෙවලමක් ලෙස දේශගුණය සහ ස්වභාව ධර්මය සමග හුවමාරු කර ගැනීම සඳහා ණය භාවිතා කිරීමේ විභවය ගවේෂණය කිරීමට අරමුණු කරයි.

### ප්‍රකාශන: වාර්තා, පොත් පරිච්ඡේද, සඟරා, ක්‍රියාකාරී පත්‍රිකා, ප්‍රතිපත්ති සංක්ෂිප්ත සහ ලිපි




- ශ්‍රී ලංකාවේ දේශගුණික-සුහුරු කෘෂිකර්මාන්තය: ප්‍රතිපත්ති සමාලෝචනයක්, SAWTEE Trade Insight, 20 වෙනි වෙළුම, අංක 1-2, 2024 (එරන්දතී පතිරාජ සහ නිශාමිනි ඉහළගෙදර).

### ශ්‍රී ලංකා රජයේ කමිටු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රතිපත්ති සම්පාදන ප්‍රයත්නයට දායක වෙමින්, රජයේ ප්‍රතිපත්ති කමිටුවලට ආරාධිත සහභාගීත්වය ලබා දීම හරහා ජාතික ප්‍රතිපත්ති ගැටලුවල දී සහාය දීම සඳහා සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ස්වකීය පර්යේෂණ සාක්ෂි භාවිතා කරයි. 2024 වර්ෂයේ දී, පහත සඳහන් කමිටුවලට සහභාගී වෙන ලදී:

- ප්‍රතිපත්ති සහාය තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා කර්මාන්තවල දේශගුණික ප්‍රතිචාර කඩිනම් කිරීම, පරිසර අමාත්‍යාංශය සමග එක්ව එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය, කර්මාන්ත අමාත්‍යාංශය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය.

## පර්යේෂණ ඉදිරිපත් කිරීම්/සාකච්ඡා

දේශීයව සහ ජාත්‍යන්තරව විවිධ සැසි සහ සංසද වලදී කථිකයා, සාකච්ඡාකරු, විද්වත් මණ්ඩල සාමාජික සහ උපදේශක යන භූමිකා ඉටු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ප්‍රතිපත්ති නියැළීම් සහ සාකච්ඡා සඳහා පර්යේෂණ පදනම් කරගත් යෙදවුම් සපයා දෙයි.









- වෙළඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය පිළිබඳ South Asia Watch සංවිධානය විසින් දෙසැම්බර් 11 -13 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවරදී සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ සාධාරණ හරිත පරිවර්තනයක් සඳ හා ඉඩසැලසීම" පිළිබඳ පහළොස්වන දකුණු ආසියානු ආර්ථික සමුළුවේ **ආහාර සුරක්ෂිතතාව සඳහා දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික පද්ධති** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (පුලස්ති අමරසිංහ).
- වෙළඳාම, ආර්ථික විද්‍යාව සහ පරිසරය පිළිබඳ South Asia Watch සංවිධානය විසින් දෙසැම්බර් 11 -13 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවරදී සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ සාධාරණ හරිත පරිවර්තනයක් සඳ හා ඉඩසැලසීම" පිළිබඳ පහළොස්වන දකුණු ආසියානු ආර්ථික සමුළුවේදී, **ආපදා අවදානම් අඩු කිරීම, දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම සහ අවම කිරීම පිළිබඳ ධාරිතා වර්ධනය** යන මාතෘකාව යටතේ පැවති සැසියේ දී සිදු කළ ඉදිරිපත් කිරීම (පුලස්ති අමරසිංහ).
- පරිසරය, සොබාදහම් සංරක්ෂණය, න්‍යෂ්ටික සුරක්ෂිතතාවය සහ පාරිභෝගික ආරක්ෂාව සඳහා වූ ජර්මානු ෆෙඩරල් අමාත්‍යාංශය, සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජර්මානු සංගමය සමග එක්ව එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඔක්තෝබර් 22 - 24 දිනවල ඉන්දියාවේ නවදිල්ලි නුවර දී සංවිධානය කරන ලද ගෝලීය තිරසාර සංවර්ධන වාර්තාවේ ආසියා පැසිෆික් කලාපය සඳහා වන කලාපීය ප්‍රචාරණ වැඩමුළුවේ දී **ගෝලීය පාරිසරික පොදු සම්පත්** පිළිබඳ සැසියේ විද්වත් මණ්ඩල සාමාජික (මනෝජ් තිබොටුවාව).
- ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජර්මානු සංගමය සමග එක්ව එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඔක්තෝබර් 22 - 24 දිනවල ඉන්දියාවේ නවදිල්ලි නුවර දී සංවිධානය කරන ලද **ගෝලීය තිරසාර සංවර්ධන වාර්තාව** (මනෝජ් තිබොටුවාව).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කර මැයි 9 වන දින ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද 'දකුණු ආසියාවේ කාබන් අවම කිරීම සහ සොබාදහම පදනම් කරගත් විසඳුමක් ලෙස වනාන්තර ප්‍රතිසංස්කරණයේ ආර්ථික විද්‍යාව: ශ්‍රී ලංකාවේ කෘෂි වන වගා වැඩසටහන් වලින් ලැබෙන සාක්ෂි' පිළිබඳ දැනට සිදු කෙරෙමින් පවතින පර්යේෂණයක කොටසක් ලෙස **වනාන්තර ප්‍රතිසංස්කරණයේ ආර්ථික විද්‍යාව** පිළිබඳ කමිටු රැස්වීම.

- ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය සහ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමග එක්ව සංවිධානය කර මාර්තු 28 වන දින ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දී පවත්වන ලද **ආපදා අවදානම් කළමනාකරණය සහ දේශගුණික ප්‍රතිචාරය වැඩි දියුණු කිරීම: ඉන්දියානු සාගර වළල්ල සංගමයේ සාමාජික රටවල ජපානය සහ ඕස්ට්‍රේලියාව විසින් දරනු ලබන සහයෝගීතා ප්‍රයත්නයන්** පිළිබඳ සාකච්ඡාවේ විද්වත් මණ්ඩල සාමාජික (පුලස්ති අමරසිංහ).
- මිචිගන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය විසින් මාර්තු 7 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි දී සංවිධානය කරන ලද "ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ, ධාරිතාව සහ බලපෑම සඳහා ෆීඩ් ද ෆියුචර් නවෝත්පාදන රසායනාගාරයේ දෙවන ගෝලීය රැස්වීම" වැඩසටහනේදී, **ග්‍රාමීය ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස, අනුවර්තනය වීම් සහ ජීවනෝපායන්** පිළිබඳ ඉදිරිපත් කිරීම (පුලස්ති අමරසිංහ).

# පර්යේෂණ කාර්ය මණ්ඩලය



**දුෂ්නි වීරකෝන්**
*BSc (ක්වීන්ස් විශ්වවිද්‍යාලය බෙල්ෆාස්ට්), MA, PhD (මැන්චෙස්ටර්)*
*විධායක අධ්‍යක්ෂක*



**නිශා අරුණතිලක**
*BSc (දකුණු ඇ.එ.ජ. විශ්වවිද්‍යාලය),*
*MA, PhD (ඩියුක්)*
*පර්යේෂණ අධ්‍යක්ෂ*



**ගංගා තිලකරත්න**
*BA (මැන්චෙස්ටර්)*
*MPhil (කැන්ටබ්)*
*PhD (මැන්චෙස්ටර්)*
*පර්යේෂණ සාමාජික*



**බිලේෂා වීරරත්න**
*BA (කොළඹ)*
*MA (Rutgers)*
*PhD (CUNY)*
*පර්යේෂණ සාමාජික*



**මනෝජ් තිබ්බොටුවාව**
*BSc, MSc (පේරාදෙණිය)*
*PhD (බටහිර ඕස්ට්‍රේලියාව)*
*පර්යේෂණ සාමාජික*



**අසංක විජේසිංහ**
*BSc (පේරාදෙණිය)*
*MS (උතුරු ඩැකෝටා ප්‍රාන්තය),*
*PhD (ඔහියෝ ප්‍රාන්තය)*
*පර්යේෂණ සාමාජික*



**චිරන්දතී පතිරාජ**
*BSc, MPhil (පේරාදෙණිය)*
*PhD (මෙල්බර්න්)*
*පර්යේෂණ සාමාජික*



**ලක්මිණි ප්‍රනාන්දු**
*BSc (පේරාදෙණිය)*
*MDevEcon (ක්වීන්ස්ලන්තය*,*
*PhD (ඇඩිලේඩ්)*
*පර්යේෂණ සාමාජික*



**පුලස්ති අමරසිංහ**
*BSc (මේරිලන්ඩ්),*
*MSc (අයෝවා),*
*PhD (UNC-Chapel Hill)*
*පර්යේෂණ සාමාජික*

# පර්යේෂණ කාර්ය මණ්ඩලය



**ප්‍රියංකා ජයවර්ධන**
*BSc (කොළඹ)*
*MEcon (කොළඹ)*
*පර්යේෂණ ආර්ථික විද්‍යාඥ*



**සුනිමලී මදුරාවල**
*BA (කොළඹ)*
*MEcon (කොළඹ)*
*පර්යේෂණ ආර්ථික විද්‍යාඥ*



**ඩිලානි හිරිමුතුගොඩගේ**
*BA (කොළඹ)*
*MEcon (කොළඹ)*
*පර්යේෂණ ආර්ථික විද්‍යාඥ*



**ඌෂා පෙරේරා**
*BA (කොළඹ)*
*MSc (ලීඩ්ස්)*
*පර්යේෂණ නිලධාරී*



**සුරේෂ් රණසිංහ**
*BA (කොළඹ)*
*MSc (නොටිංහැම්), LLB (ශ්‍රී.ලං.වි.වි.), AAL*
*පර්යේෂණ නිලධාරී*



**හිමානි විතානගේ**
*BA (කොළඹ), BSc (LSE)*
*පර්යේෂණ නිලධාරී*



**චායා දිසානායක**
*BSc (යාපනය)*
*පර්යේෂණ නිලධාරී*



**සුලෝචනා සිල්වා**
*BSc (පේරාදෙණිය)*
*පර්යේෂණ නිලධාරී*



**චන්දුල ඉදිරිසිංහ**
*BSc (පේරාදෙණිය)*
*පර්යේෂණ සහකාර*



**නිශාමිණී ඉහළගෙදර**
*BSc (පේරාදෙණිය)*
*පර්යේෂණ සහකාර*



**රශ්මි අනුපමා**
*BSc (රජරට)*
*පර්යේෂණ සහකාර*



**යශෝරා ගුණවර්ධන**
*BSc (සබරගමුව)*
*පර්යේෂණ සහකාර*



**කවීශා බටවල**
*BA (කොළඹ)*
*පර්යේෂණ සහකාර*

# සහාය කාර්යමණ්ඩලය



**ගයනි කල්දේරා**
*ACA, BSc (ජයවර්ධනපුර)*
*අධ්‍යක්ෂ මූල්‍ය සහ පරිපාලන*



**නන්දක පොතුවැව**
*BSc (කැලණිය)*
*තොරතුරු පද්ධති ප්‍රධානී*



**ඩිනාලි පෙරේරා**
*කළමනාකරු - ප්‍රකාශන සහ උත්සව*



**දිලිනි ගල්කැටිය**
*BSc (පේරාදෙණිය) MBA (කොළඹ)*
*කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලන*



**චමල් වීරක්කොඩි**
*කළමනාකරු- සන්නිවේදන සහ ක්‍රමෝපායික මහජන සම්බන්ධතා*



**ගයේන්ද්‍රි කරුණාරත්න**
*සංස්කාරක*



**තුවාන් බංසජයා**
*පහසුකම් කළමනාකරණ නිලධාරි*



**සුභාන් පෙරේරා**
*පද්ධති පරිපාලක*



**මධුෂා හෙට්ටිආරච්චි**
*සහකාර ගණකාධිකාරී*



**විශාකා නර්මදා**
*සහකාර පුස්තකාලයාධිපති*



**තාරකා මුදන්නායක**
*රහස්‍ය ලේකම්*



**අමේෂ් තෙන්නකෝන්**
*ප්‍රකාශන නිලධාරි*



**ෂැනින් ඩැනියෙල්**
*සන්නිවේදන නිලධාරි*



**නයෝමි ජයකොඩි**
*පරිපාලන සහාය නිලධාරී*



**බර්නඩෙට් ප්‍රබාලෝජිනි**
*පෙරටු කාර්යාල සම්බන්ධීකාරක*



**දිනිති උපේක්ෂා**
*මුදල් සහ පරිපාලන සහකාර*

# සහාය කාර්යමණ්ඩලය



**හයිඩි ද සිල්වා**
*ගිණුම් සහකාර*



**තිලංකා ප්‍රසාදි**
*පුස්තකාල සහායක*



**ජී.ආර්. වික්‍රමසේන**
*රියදුරු/කාර්යාල සහායක*



**එච්.එස්. උදයකාන්ත**
*රියදුරු/කාර්යාල සහායක*



**නිහාල් වසන්ත**
*රියදුරු/කාර්යාල සහායක*



**පී. යූ. කේ. රාජසිරි**
*රියදුරු/කාර්යාල සහායක*

# උපකාරක සේවා

## මුදල් සහ පරිපාලනය

මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන සහ ප්‍රසම්පාදන සේවා සපයා දීම මගින් පර්යේෂණ ඒකකයන්හි ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට හා සහයෝගය දැක්වීමට මුදල් සහ පරිපාලන ඒකකය ස්ථාපනය කර තිබේ.

සමාලෝචිත වර්ෂයේ දී ආයතනයේ මූල්‍ය කාර්යසාධනය රු. මි. 52.8 ක අතිරික්තයක් වාර්තා කළේ ය. රු. මිලියන 367 ක් වූ සමස්ත ආදායම, ව්‍යාපෘති ආදායම් (42%), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආයෝජන භාර අරමුදලෙන් එකතු වූ මුදල් (27%) සහ පොළී ආදායම් (24%) වලින් සමන්විත විය.

2024 වර්ෂයේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පර්යේෂකයින් පස්දෙනෙකුට (05) සහ සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකුට (02) සමු දුන් අතර, ආයතනය සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයන් හය දෙනෙකු (06)බඳවා ගන්නා ලදී.

## ආයතනික පාලනය

ඔප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලන ව්‍යුහය පාලක මණ්ඩලයකින් ("ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන අධ්‍යක්ෂ මණ්ඩලය"), විධායක අධ්‍යක්ෂවරයාගෙන් සහ කළමනාකරණ කමිටු වලින් සමන්විත වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගේ පත්කිරීම් සහ වගකීම් 1988 අංක 53 දරණ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන (IPS) පනත තුළ නිර්වචනය කොට ඇත. ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීමේ සහ කාර්යසාධනය පිළිබඳ කටයුතු මෙහෙයවීමේ වගකීම විධායක අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ කමිටු විසින් දරනු ලබයි.

සෑම වර්ෂයක් ආරම්භයේ දී ම අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් පැවැත්වීමේ වැඩසටහනක් පිළිබඳ එකඟතාවයකට එළඹෙන අතර, අවම වශයෙන් වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වයි. එසේ ම අවශ්‍ය අවස්ථා වලදී අතිරේක රැස්වීම් ද කැඳ වනු ලැබේ.

වාර්ෂික සැලසුම් පළිබඳව සාකච්ඡා කර එකඟතාවයකට එළඹීම සඳහා සෑම වර්ෂයක් ආරම්භයේදී ම විධායක අධ්‍යක්ෂකවරයා විසින් සියලු කමිටු රැස්වීම් කැඳවනු ලබන අතර, එක් එක් කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා කාර්තුමය වශයෙන් රැස්වීම් කැඳවීමේ වගකීම දරයි.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ත්‍රෛවාර්ෂික ආයතනික සැලැස්මක් පිළියෙල කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මන්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. අයවැයගත පිරිවැයට සාපේක්ෂව අත් කර ගනු ලබන ප්‍රගතිය කාර්තුමය පදනමෙන් සමාලෝචනය කර වාර්තා කරනු ලැබේ.

## විගණන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විගණන කමිටුව ආයතනික කළමනාකරණය, රාජ්‍ය ගිණුම්කරණය සහ මූල්‍යය යන ක්ෂේත්‍ර යන්හි වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුව කාර්තුමය වශයෙන් රැස් වේ. අභ්‍යන්තර විගණන අඛණ්ඩ පදනමකින් සිදු කරනු ලබන අතර, විගණන ඔස්සේ අනාවරණය වන සියලු ම කරුණු කාර්තුමය පදනමකින් සාකච්ඡාවට ලක් කර, ඇති විය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම සඳහාත්, එවන් අවදානම් තත්ත්වයන් අවම කර ගැනීම සඳහාත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

විගණන කමිටුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, විගණන කමිටු රැස්වීම් වල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කරනු ලැබේ.

## ආයෝජන කමිටුව

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආයෝජන කමිටුවේ සභාපතිත්වය මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තියවේදියෙකු වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් දරනු ලැබේ. එමෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කළමනාකාරීත්වයේ සාමාජිකයන් සමග ආයෝජන විෂයය පිළිබඳ ප්‍රවීණයෙකු වන ස්වාධීන සාමාජිකයෙක් ද මෙම කමිටුවෙහි කටයුතු කරනු ලැබේ. කමිටුව වර්ෂයකට දෙවරක් රැස් වන අතර අවශ්‍ය අවස්ථාවලදී අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ.

## අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය අභ්‍යන්තර සහ බාහිර වටපිටාවන් තුළ පැනනැගීමේ විභවවයක් තිබෙන අවදානම් තත්ත්වයන් ගණනාවක් පිලිබඳව කරුණු සොයා බලන අතර, ව්‍යුහාත්මක සහ පූර්ව ක්‍රියාකාරී ආකාරයකින් මෙම අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමේ, මැන බැලීමේ සහ කළමනාකරණය කිරීමේ වැදගත්කම අවබෝධ කරගනියි. ආයතනික ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි එම අවිනිශ්චිතතාවයන්ගෙන් බාධාවක් ඇති නොවන බවට වග බලා ගැනීම ආයතනයේ අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටියේ අභිමතාර්ථය වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණය පිලිබඳ අවසන් වගකීම දරමින් අධීක්ෂණ කාර්යභාරය ඉටු කරයි. සමස්ත අවදානම් පිළිබඳ ස්වකීය රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ සඳහා ම වෙන් වූ කළමනාකරණ කමිටුවක සහයෝගය ලබා දෙනු ලැබේ.

## විභව්‍ය අවදානම් වර්ග සහ ප්‍රධාන අවදානම් අවම කිරීම සඳහා වන ප්‍රවේශ


ආයතනය විසින් මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම, මූල්‍ය අවදානම, අනුකූලතා අවදානම සහ තරඟකාරීත්ව අවදානම පොදුවේ ආයතනයෙහි ප්‍රධාන විභව අවදානම් තත්ත්වයන් වශයෙන් හඳුනාගෙන ඇත.

| අවදානම් වර්ගය | අවදානම අවම කිරීම සඳහා වන ප්‍රවේශ |
|---|---|
| මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම | • ඉලක්කගත සන්නිවේදන ක්‍රමෝපාය සහ මෙවලම් ඔස්සේ ස්වකීය ප්‍රධාන පාර්ශ්වකරුවන්ට සමීප වීම<br>• තොරතුරු තාක්ෂණ සහ අනෙකුත් ආශ්‍රිත සහාය සේවාවන්හි ඵලදායීත්වය ඇගයීමට ලක් කිරීම<br>• අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන පැවැත්වීම සහ කාර්තුමය පදනමකින් විගණන වලින් අනාවරණය කරගනු ලබන කාරණු සමාලෝචනය කිරීම<br>• වාර්ෂික පදනමක් මත බාහිර විගනන පැවැත්වීම සහ ඒවායින් අවධාරණය කරනු ලබන කිසියම් විශේෂ කාරණු වේ නම් ඒවා සමීපව සමාලෝචනය කිරීම<br>• ආයතනයේ සියලු දේපළ සම්බන්ධයෙන් පරිපූර්ණ රක්ෂණ ආවරණයක් පවත්වා ගැනීම<br>• සේවකයන්ගේ රෝහල්ගත කිරීම් සහ බරපතල රෝගාබාධ සඳහා රක්ෂණාවරණයක් සැපයීම |


| | |
|---|---|
| මූල්‍ය අවදානම | • මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම එනම්, 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැතිවීමේ තත්ත්වයක් මත පර්යේෂණ ප්‍රදාන සහ පොළී ආදායම ඉහළ නංවාගැනීම<br>• ණය අවදානම අවම කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක් තුළ ආයතනයේ ආයෝජන කළඹ පවත්වා ගෙන යාම<br>• අයවැය පාලන භාවිතා කිරීම වෙනස්වීම් කලින් කලට අධීක්ෂණ කිරීම<br>• බාධාවීමකින් තොරව ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා ද්‍රවශීල අරමුදල්වල ප්‍රමාණවත්භාවය සහතික කරමින් ආයතනයේ මූල්‍යමය ස්ථාවරය අඛණ්ඩවම අධීක්ෂණයට ලක් කිරීම<br>• ආයෝජන තීරණ පිළිබඳ අවසන් තීරණයකට එළඹීමට ප්‍රථම ආයෝජන ඇගයීමේ විවිධ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම |
| අනුකූලතා අවදානම | • අදාළ නියාමන ආයතන වෙත ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ ඒවායේ දී ගොනුගත කිරීමට අවශ්‍ය ලේඛන යනාදිය පිළිබඳව අඛණ්ඩව අධීක්ෂණය කිරීම |
| තරඟකාරිත්ව අවදානම | • අනෙකුත් තරඟකාරී පර්යේෂණ ආයතන සමග සන්සන්දනාත්මකව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මාධ්‍ය දෘශ්‍යතාවය අධීක්ෂණය කිරීම සහ වැඩි දියුණු කිරීම. |
| මානව සම්පත් ආශ්‍රිත අවදානම | • යෝග්‍ය සුදුසුකම් සහිත කාර්යමණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා ගැනීම<br>• අපගේ සේවක අගය ප්‍රස්තුතය සවිමත් කිරීම<br>• පුහුණු සහ සංවර්ධන කටයුතු සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම<br>• උසස් අධ්‍යාපනය සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම වැනි ආකාරයෙන් වෘත්තීයමය අභිවෘද්ධිය අත්කර ගැනීම සඳහා අවස්ථා සැලසීම<br>• සේවක නියුක්ත වීම ඉහළ මට්ටමෙන් පවත්වා ගැනීම<br>• වාර්ෂික කාර්යසාධන සංවර්ධන සමාලෝචන සිදු කිරීම<br>• පැමිණීම සහ නිවාඩු මෙන්ම පර්යේෂණ සහ සහාය කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම් සඳ හා කාලය වෙන් කිරීම කලමනාකරණය කිරීම සඳහා HRIS පද්ධතියක් භාවිතා කිරීම |
| තොරතුරු තාක්ෂණ අවදානම | • ක්‍රියාත්මක කිරීම<br>• තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදිම සහ ක්‍රියාත්මක කිරීම<br>• ආයතනය තුළ පවත්නා මධ්‍යගත තොරතුරු ගබඩා කළමනාකරණ පද්ධතියක් සහ ආයතනයෙන් බාහිර ක්ලවුඩ් අවකාශ කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම<br>• වාර්ෂික තොරතුරු තාක්ෂණ ආරක්ෂක විගණන හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම |

## මූල්‍ය විශේෂ අවස්ථා - 2015 - 2025

### ආදායම, වියදම සහ අතිරික්තය




### ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආදායමෙහි සංයුතිය



## සන්නිවේදන සහ මහජන සම්බන්ධතා

සන්නිවේදන මාර්ග සාධනීය අයුරින් භාවිතා කිරීම ඔස්සේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීම සහ ජනවිහිදුම්කරණ වැඩසටහන් පුළුල් කිරීම ආයතනයේ එක් ප්‍රධාන අභිමතාර්ථයක් වේ. ප්‍රකාශන, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, විශේෂ අවස්ථා සහ සංවාද වැනි විවිධ මාධ්‍ය ඔස්සේ දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මහජනතාව වෙත ස්වකීය බහුමාන පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු බෙදා හැරීම මෙයට ඇතුළත් වේ. තවද, විවිධ ඉලක්කගත ප්‍රේක්ෂකයන් වෙත ළඟාවීම අරමුණු කරගනිමින් විවිධ මාධ්‍ය වේදිකා ඔස්සේ පුවත්පත් නිවේදන, ලිපි සහ සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණ වලින් අනාවරණය කරගනු ලබන කරුණු සහ තොරතුරු ප්‍රචාරණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

2024 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ප්‍රකාශන 3 ක් නිකුත් කරන ලද අතර, ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන '**ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024**' වාර්තාව ද එයට ඇතුළත් විය. 2024 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වකීය නිල බ්ලොග් අඩවිය වන 'ටෝකිං ඉකොනොමික්ස්' බ්ලොග් අඩවිය සඳහා බ්ලොග් ලිපි 20 ක් නිෂ්පාදනය කළ අතර ඒවා පුළුල් ලෙස කියවනු ලබන පුවත්පත් සහ මාර්ගගත ප්‍රවෘත්ති ආයතන මගින් ප්‍රකාශයට පත් කරන ලදී. එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ගෝලීය වේදිකාවල පළ වූ ලිපි 13 ක් සහ සැලකිය යුතු '@ සඳහන් කිරීම්' සංඛ්‍යාවක් සමග ජාත්‍යන්තරව ස්වකීය පෙනීසිටීම අඛණ්ඩව පවත්වාගෙන ගියේය. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති විවාද සඳහා දායක වීම පිණිස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලය මුද්‍රිත, විකාශන සහ විද්‍යුත් මාධ්‍ය සමග සම්මුඛ සාකච්ඡා දොළහකට (12) ද සහභාගී වූහ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආකාර්ෂණීය අන්තර්ගතයන් සමගින් ස්වකීය ෆේස්බුක්, X (ට්විටර් ලෙස කලින් හඳුන්වන ලද), ඉන්ස්ටග්‍රෑම්, ලින්ක්ඩ්ඉන් සහ යූටියුබ් පිටු නිතිපතා යාවත් කාලීන කරමින් සමාජ මාධ්‍යවල ස්වකීය පෙනීසිටීම 2024 වර්ෂයේ දී සැලකිය යුතු ලෙස පුළුල් කළේ ය. ආයතනය විශේෂයෙන් ම ට්විටර් සහ ලින්ක්ඩ්ඉන් ඔස්සේ ක්‍රියාකාරී වෙමින්, එම සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ විශේෂ අවස්ථා සජීවීව යාවත්කාලීන කරමින් සැලකිය යුතු ආකර්ෂණයක් දිනාගෙන ඇත.

2024 වර්ෂයේ දී, ශ්‍රී ලංකාව පශ්චාත් මැතිවරණ ආර්ථික ප්‍රමුඛතා කරා ගමන් කරන විට, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන '**ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2024**' මගින් ස්ථාවරත්වයේ සිට තිරසාර වර්ධනයක් සහ සමෘද්ධියක් කරා රට මෙහෙයවීමේ උපාය මාර්ගයක් සඳහා සම්මුතියක් ගොඩනැගීම පිණිස අවශ්‍ය කරන අතිශය වැදගත් ගැඹුරු අවබෝධයන් සපයා දුන්නේය. '**බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට**' යන තේමාව යටතේ පළ කරන ලද මෙම වාර්තාව මගින් රට ප්‍රකෘතිමත් කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රධාන ප්‍රතිපත්ති නිර්දේශ කෙරෙහි අවධානය යොමු කරන ලදී. තවද, රාජ්‍ය ප්‍රතිපත්ති සාකච්ඡාවල වඩාත් ශක්තිමත්ව නිරත වීම පිණිස අප විසින් ප්‍රකාශයට පත් කරන ලද පුළුල් පර්යේෂණ සමූහය උපයෝගී කරගනිමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ සහ සාකච්ඡා දහයකට අධික සංඛ්‍යාවක් පැවැත්වූයේ ය. මේ අනුව, මෙම ආයතනය ස්වකීය ප්‍රමුඛ පර්යේෂණ සමගින් පාර්ශ්වකරුවන් පුළුල් පරාසයක් වෙත ළඟා වීමට සමත් වී තිබේ.

## තොරතුරු පද්ධති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති ඒකකය මෘදුකාංග, සන්නිවේදනය, දෘඩාංග, ජාලකරණය සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් සංවර්ධනය, තොරතුරු ප්‍රචාරණය සහ දත්ත සංචිත සකස් කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම මගින් ආයතනයට විශිෂ්ඨත්වයේ කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස තරඟකාරීව සිටීමට සහාය වෙයි. අපගේ නව සේවාදායක පද්ධතිය හරහා නිවසේ සිට වැඩ කිරීමේ පහසු ක්‍රම, ඊඡහ පද්ධතිය, විද්‍යුත් තැපැල් පද්ධතිය, 'දදප රැස්වීම් සහ අනෙකුත් මාර්ගගත ක්‍රියාකාරකම් පහසු කරමින් මාර්ගගත තොරතුරු පද්ධතිය හරහා වැඩි පහසුකම් සපයා දීම සාර්ථකව සිදු කරන ලදී.

## පුස්තකාලය

### 2024 වර්ෂයේ ජයග්‍රහණ

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය එහි පර්යේෂණ සහ සහායක කාර්ය මණ්ඩලයට මෙන්ම බාහිර පරිශීලකයින්ට ද පරිපූර්ණ තොරතුරු සම්පත් සපයා දෙමින් අඛණ්ඩව විශිෂ්ඨත්වයෙන් කටයුතු කළේ ය. මෙහිදී ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කරන ලදී: තාක්ෂණික වැඩිදියුණුකිරීම්, පරිශීලක සහභාගීත්වය සහ සම්පත් පුළුල් කිරීම.

### තාක්ෂණික දියුණුව

KOHA සහ Dspace වැඩසටහන්වල නවතම අනුවාදයන් වෙත මාරුවීම ඇතුළුව පුස්තකාලයේ තාක්ෂණික යටිතල පහසුකම්වල සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම් හරහා නාමාවලිකරණය, සංසරණය සහ ඩිජිටල් සම්පත් කළමනාකරණය විධිමත් කිරීම තුළින් පුස්තකාල කළමනාකරණ පද්ධතිවල කාර්යක්ෂමතාවය සහ පරිශීලක-හිතකාමීත්වය වැඩිදියුණු කරන ලදී.

### පරිශීලක සහභාගීත්වය

පරිශීලක සහභාගීත්වය ප්‍රමුඛත්වය ලබා දී ඇති අංගයක් ලෙස පැවතුණි. පුස්තකාලය නව පරිශීලකයින් සඳහා හඳුන්වාදීමේ පුහුණුවක් පැවැත්වූ අතර, එහිදී OPAC පද්ධතියෙහි තොරතුරු සෙවීම සහ පුස්තකාල අන්තඃජාලය සහ ඩිජිටල් පුස්තකාලයේ වැඩිදියුණු කළ විශේෂාංග භාවිතා කිරීම වැනි මාතෘකා ආවරණය කරක ලදී. සන්නිවේදන අංශයේ කණ්ඩායම සමග එක්ව උපදෙස් වීඩියෝ තුනක් නිෂ්පාදනය කර පුස්තකාල අන්තඃජාලයට උඩුගත කරන ලදී:

1. පුස්තකාල OPAC: මාර්ගගත නාමාවලිය මගින් තොරතුරු සොයාගැනීම පිළිබඳ මාර්ගෝපදේශයක්.
2. පුස්තකාල අන්තඃජාලය: අභ්‍යන්තර සම්පත් සහ සේවාවන් පිළිබඳ දළ විශ්ලේෂණයක්.
3. ඩිජිටල් පුස්තකාලය "Econsapce": ඩිජිටල් පුස්තකාල සම්පත් භාවිතා කිරීම පිළිබඳ නිබන්ධනයක්.ජ

**සම්පත් පුළුල් කිරීම**

JSTOR සහ e-journals වැනි අධ්‍යයන දත්ත සංචිත සඳහා දායකත්වය එකතු කරමින් පුස්තකාලය ස්වකීය ඩිජිටල් සම්පත් පුළුල් කළේය. එමෙන්ම කාලීන සිදුවීම් පිළිබඳව පරිශීලකයින් දැනුවත් කර තැබීම සඳහා දිනපතා පුවත්පත් වල විද්‍යුත් පුවත්පත් ද මිලදී ගන්නා ලදී.

**අන්තර්-පුස්තකාල ණය සහ ලේඛන බෙදාහැරීම**

පුස්තකාලය විශේෂීකරණය සහිත ද්‍රව්‍ය අවශ්‍ය පර්යේෂකයන්ට අමිල සේවයක් ඉටුකරමින්, ඔවුන්ට පුස්කාලයේ එකතුවෙන් ඔබ්බෙහි වූ සම්පත් වෙත ද ප්‍රවේශය ලබා දෙමින්, අන්තර් පුස්තකාල ණය සහ ලේඛන බෙදාහැරීමේ ඉල්ලීම් කාර්යක්ෂමව කළමනාකරණය කළේ ය.


**අනාගත සැලසුම්**


ඉදිරිය දෙස අවධානය යොමු කරමින්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය පහත සඳහන් දෑ අරමුණු කරයි:

- තව තවත් විද්‍යුත් පොත් සහ විද්‍යුත් සඟරා ලබා ගනිමින් ඩිජිටල් පුස්තකාල එකතුව පුළුල් කිරීම.
- වසර 5 ක කාලයකට පසු සිදුකරනු ලබන තොග සත්‍යාපනය සිදු කිරීම.
- පුස්තකාලයේ අවකාශය නැවත සකස් කිරීම මගින් අලුතින් කියවීමේ අවකාශයන් නිර්මාණය කිරීම.
- පරිශීලකයින්ව නවතම තොරතුරු සමගින් යාවත්කාලීන කර තබා ගැනීම සඳහා වඩාත් අන්තර්ක්‍රියාකාරී වැඩමුළු සහ පුහුණු සැසි සංවිධානය කිරීම.

උසස් තත්ත්වයේ තොරතුරු සම්පත් සහ සේවාවන් ලබා දීම මගින් සහ අඛණ්ඩ ඉගෙනුම් සහ නව්‍යකරණ පරිසරයක් පෝෂණය කිරීම මගින් පර්යේෂණ ප්‍රජාවට සහාය වීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලය කැපවී සිටියි.

## 2024 වර්ෂයේ ප්‍රකාශන







- **"විදුලි වාහන සැපයුම් දාමවල වෙළඳ යුද්ධ: ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වාසියක්ද?"**, ජාත්‍යන්තර පර්යේෂණ මාලා අංක 17, අසංක විජේසිංහ, මලීෂා වීරසිංහ සහ චායා දිසානායක විසිනි, මාර්තු.

- **"ශ්‍රී ලංකාවේ බීඩි සහ දුම් රහිත දුම්කොළ පරිභෝජනය මැඩපැවැත්වීමේ උපාය මාර්ග"**, සෞඛ්‍ය සහ අධ්‍යාපන පර්යේෂණ මාලා අංක 22, ප්‍රියංකා ජයවර්ධන, එරන්දතී පතිරාජ සහ නිමේෂා දිසානායක විසිනි, ජූනි.

- **"ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්ත්වය 2024"** **"බහුවිධ අර්බුදවල ආර්ථික කැළැල්: දත්ත වලින් ප්‍රතිපත්තියට"** පිළිබඳ වාර්තාව, ඔක්තෝබර් (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පර්යේෂණ කණ්ඩායම විසිනි).

# අභ්‍යන්තර සම්මන්ත්‍රණ



"ශ්‍රී ලංකාවේ දුම්කොළ ගොවීන් විකල්ප බෝග ගොවීන් බවට පරිවර්තනය කිරීම: ක්‍රියාකාරී සැලැස්මක්", ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සහකාර චන්දුල ඉදිරිසිංහ විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, ජනවාරි 31.



"ශ්‍රී ලංකාවේ සොබාදහම සඳහා මූල්‍යකරණය", එක්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර ආයතනයේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ පෝල් ස්ටීල් මහතා විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, පෙබරවාරි 28.



"ශ්‍රී ලංකාවේ ඔබින රැකියා සඳහා කාන්තාවන්ට තිබෙන ප්‍රවේශය: සන්දර්භ-විශේෂිත බාධක ආමන්ත්‍රණය කිරීම", ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය ලක්මිණී ප්‍රනාන්දු විසින් ඉදිරිපත් කරන ලදී, මාර්තු 28.



"ග්‍රාමීය ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස, අනුවර්තනයවීම් සහ ජීවනෝපායන්", ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ආචාර්ය පුලස්ති අමරසිංහ විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, මැයි 2.




"වර්තමාන බදු සහ සුභසාධන වියදම් දුප්පත් පවුල්වලට සහ ධනවත් පවුල්වලට බලපාන්නේ කෙසේද?", ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියංකා ජයවර්ධන විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, මැයි 30.



"ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය, සංවර්ධනය සහ ස්ථාවරත්වය", අයෝවා විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය, ආචාර්ය එන්. ටී. තේනුවර විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාවේදී ඉදිරිපත් කරන ලදී, ජුනි 18.



“18 වන SANDEE ගිම්හාන පාසලෙන් උගත් කරුණු: වරණ අත්හදා බැලීම් සහ සිද්ධි අධ්‍යයනයක්”, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික සුලෝචනා සිල්වා විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, ජුනි 27.



“ශ්‍රී ලංකාවේ නිවසේ සිට රාජකාරි කිරීමේ ප්‍රතිපත්තිය: ප්‍රතිලාභ ලැබුණේ කාටද සහ නොලැබුණේ කාටද? පූර්ව දත්ත විශ්ලේෂණය සහ වර්තමානයට අදාළත්වය”, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිලධාරී සුරේෂ් රණසිංහ විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, අගෝස්තු 6.



“ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය: ක්‍රම සහ යෙදුම්”, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සහකාර චන්දුල ඉදිරිසිංහ විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, සැප්තැම්බර් 26.



“බාධක ජය ගැනීම: සංවර්ධන පර්යේෂණ වලදී සංවර්ධනය වෙමින් පවතින රටවල පර්යේෂකයින්ගේ ඌන නියෝජනය ආමන්ත්‍රණය කිරීම”, බ්‍රසීලයේ සාඕ පවුලෝ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්ය සහ ආර්ථික ප්‍රතිපත්ති සඳහා හවුල්කාරිත්වයෙහි පර්යේෂණ සාමාජික මහාචාර්ය කසුෆ් විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ දී ඉදිරිපත් කරන ලදී, ඔක්තෝබර් 29.



“ගෝලීය දේශපාලන වර්ධනයන්ට ශ්‍රී ලංකාවේ නිරාවරණයවීම”, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය අසංක විජේසිංහ විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේදී ඉදිරිපත් කරන ලදී, නොවැම්බර් 28.



“වර්ධනය සඳහා ආයෝජනය කිරීම හෝ පසුබෑම? ශ්‍රී ලංකීය කෘෂිකර්මාන්තයේ රාජ්‍ය වියදම්”, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ආචාර්ය මනෝජ් තිබ්බොටුවාව විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේදී ඉදිරිපත් කරන ලදී, දෙසැම්බර් 30.

# ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සීමාවාසික වැඩසටහන 2024

| | නම | තනතුර | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| 1 | විහාත් ජයසිංහ | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | කොළඹ විශ්වවිද්‍යාලය |
| 2 | අප්සරා නයනකාන්ති | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | යාපනය විශ්වවිද්‍යාලය |
| 3 | පසිඳු ධර්මසිරි | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | කැලණිය විශ්වවිද්‍යාලය |
| 4 | මජිතා සෙල්වලිංගම් | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 5 | මේනකා විමලරත්න | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | කොළඹ විශ්වවිද්‍යාලය |
| 6 | චමෝදි ගමගේ | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | රුහුණු විශ්වවිද්‍යාලය |
| 7 | නිෂ්කා සමරසිංහ | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය |
| 8 | පවීර දෙහෙරගොඩ | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | නොටින්හැම් විශ්වවිද්‍යාලය, මැලේසියාව |
| 9 | දක්ෂිණී මවීෂා | ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී | සබරගමුව විශ්වවිද්‍යාලය |

# ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

## මූල්‍ය ප්‍රකාශන

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන | 2 | - | - |
| ව්‍යාපෘති ආදායම | 3 | 153,581,469 | 277,798,785 |
| පොළී ආදායම | 4 | 112,931,147 | 130,718,970 |
| ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය | 22 | 99,034,005 | 122,809,517 |
| ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම | | 282,040 | 606,025 |
| විවිධ ආදායම් | 5 | 1,388,657 | 3,234,129 |
| **මුළු ආදායම** | | 3 67,217,318 | 535,167,426 |
| **වියදම්** | | | |
| සේවක පිරිවැය | 6 | 131,531,937 | 124,237,361 |
| පර්යේෂණ පිරිවැය | 7 | 87,619,431 | 86,881,629 |
| උපයෝගිතා වියදම් | | 23,781,586 | 22,568,285 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8 | 22,385,162 | 17,477,967 |
| ගමන් වියදම් | | 319,526 | 340,244 |
| ශ්‍රවණාගාරය කුලියට දීම | | 153,219 | 124,655 |
| **මුළු වියදම** | | 2 65,790,861 | 251,630,141 |
| **වර්ෂය සඳහා ජංගම අතිරික්තය** | | 1 01,426,457 | 283,537,285 |
| දේපළ, පිරියත සහ උපකරණ මත අගය ක්ෂය වීම | 16 | 18,934,877 | 17,986,566 |
| **වර්ෂය සඳහා අගය ක්ෂය කිරීමෙන් පසු අතිරික්තය** | | 82,491,580 | 265,550,719 |
| ආදායම් බදු වියදම් | 9 | 29,678,889 | 35,558,147 |
| **බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය** | | 52,812,691 | 229,992,572 |

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| *දෙසැම්බර් 31 වැනි දිනට* | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 10 | 63,334,730 | 125,508,414 |
| ආයෝජන | 11 | 39,880,441 | 27,098,309 |
| ලැබිය යුතු වෙළඳ | 12 | 16,279,447 | 6,057,963 |
| තොග - ප්‍රකාශන | | 1,805,716 | 1,798,598 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 13 | 21,581,400 | 10,022,799 |
| ලැබිය යුතු පොළී | 14 | 45,442,803 | 39,281,367 |
| වෙනත් ලැබිය යුතු දෑ | 15 | 104,254,383 | 128,817,969 |
| **මුළු ජංගම වත්කම්** | | 292,578,920 | 338,585,419 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 16 | 463,522,873 | 466,170,232 |
| දීර්ඝ කාලීන ආයෝජන | 11 | 68,132,786 | 591,212,390 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 13 | 7 131 972 | 119 157 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,134,808,595 | 1,057,501?79 |
| **මුළු වත්කම්** | | 1,427,387,515 | 1,396,087,198 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 17 | 36,411,968 | 48,361,749 |
| ව්‍යාපෘති මත අත්තිකාරම් ලැබීම් | 18 | 43 995 743 | 60,231,081 |
| **මුළු ජංගම වගකීම්** | | 80,407,711 | 108,592,830 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 19 | 45,140,157 | 40,357,628 |
| කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල | | 8 934 258 | 7 044 042 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 54,074,415 | 47 401 670 |
| **මුළු වගකීම්** | | 134,482,126 | 155,994,500 |
| **ශුද්ධ වත්කම්** | | 1,292,905,389 | 1,240,092,698 |
| **හිමිකම්** | | | |
| සමුච්චිත අතිරික්තය | | 1,292,905,389 | 1,292,905,389 |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇත.

..............................
සැකසීම: මූල්‍ය සහ පරිපාලන අධ්‍යක්ෂ
ගයනි කල්දේරා

..............................
අනුමැතිය: විධායක අධ්‍යක්ෂ
ආචාර්ය. දුෂ්නි වීරකෝන්

අනුමැතිය:

.................................. සභාපති

.................................. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

.................................. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙහි 5 වැනි පිටුවේ සිට 8 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 9 වැනි පිටුවේ සිට 16 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම දරයි.

.......................................
කොළඹදී ය

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය**
**මදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය**

***දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා***

| | සමුච්චිත අතිරික්තය |
|---|---|
| | රු. |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,010,100,126 |
| වර්ෂය සඳහා ආදායම් අතිරික්තය | 229,992,572 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,240,092,698 |
| **වර්ෂය සඳහා ආදායම් අතිරික්තය** | 52,812,691 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,292,905,389 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| *දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය** | **සටහන්** | | |
| බදු ගෙවීමෙන් පසු අතිරික්තය/(ඌනතාවය) | | 82,491,580 | 265,550,719 |
| **ගැළපීම්** | | | |
| සේවක සුභසාධක අරමුදලෙහි මාරු කිරීම් | | 1,890,216 | 1,615,273 |
| දේපළ, පිරියත හා උපකරණ මත අගය ක්ෂයවීම් | 16 | 18,934,877 | 17,986,566 |
| පාර්තෝෂික ප්‍රාතිපාදන / (ප්‍රතිවර්තන) | 19 | 6 ,470,029 | 11,529,290 |
| පොළී ආදායම | | (112,931,147) | (130,718,970) |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන (වැඩිවීම)/අඩුවීම | | - | (116,456) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)** | | (3,144,445) | 165,846,422 |
| ලැබිය යුතු වෙළඳ (වැඩිවීම)/අඩුවීම | | (10,221,484) | 1 7,214,808 |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (7,118) | (10,421) |
| තැන්පතු සහ ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | | (18,571,416) | 5,336,361 |
| වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 24,563,586 | (52,727,824) |
| අත්තිකාරම් ලැබීම් (වැඩිවීම)/අඩුවීම | | (16,235,338) | (47,182,140) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (10,632,296) | 20,005,355 |
| **මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)** | | (34,248,511) | 108,482,561 |
| පාර්තෝෂික ගෙවීම් | 19 | (1,687,500) | - |
| ආදායම් බදු ගෙවීම් | | (30,996,374) | (31,486,972 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)** | | (66,932,385) | 76,995,589 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ගලනය** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | 16 | (16,287,519) | (27,357,593 |
| ලැබුණු පොළිය | | 1 06,769,710 | 113,223,651 |
| ආයෝජන මිලදී ගැනීම | | (27,341,189) | (321,203,553 |
| ආයෝජන විකිණීමෙන් ලැබුණු මුදල් | | 3,598,894 | 1 58,465,113 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)** | | 66,739,896 | (76,872,383) |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම** | | (192,488) | 1 23,205 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 10)** | | 1,669,649 | 1,546,444 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | | 1,477,161 | 1,669,649 |
| **(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම** | | | |
| **බැංකුවේ ඇති මුදල්** | | 1,347,161 | 1,539,649 |
| **අත ඇති මුදල්** | | 1 30,000 | 1 30,000 |
| | | 1,477,161 | 1,669,649 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

1. **පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය**
ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් එය නීත්‍යානුකූල ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යනයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංක 100/22, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1 **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය**
ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2 **සකස් කිරීමේ පදනම**

1.2.1 **අනුකූලතා ප්‍රකාශය**
ශ්‍රී. ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රාකාශන සකස් කර ඇත.

1.2.2 **මිනුම් කිරීමේ පදනම**
මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස ඓතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3 **අඛණ්ඩභාවය**
ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3 **වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**
අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

**(අ) විදේශ මුදල් ගණු ගනුදෙනු**
මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකව ම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

**(ආ) දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

***ඉන් පසුව කරනු ලබන වියදම්***
ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනිත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මගින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි දියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

## *2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

***දේපළ, පිරියත සහ උපකරණ (තව දුරටත් .......)***

වත්කමෙහි ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| පරිගණක උපකරණ සිට | 16% සිට 33 % දක්වා |
| වෙබ් පිටු සැලසුම් | 33 % |
| මෝටර් සයිකල් | 10% |
| ලීබඩු | 9 % සිට 32 % දක්වා |
| කාර්යාල උපකරණ | 10% |
| මෝටර් වාහන | 8% සිට 10% දක්වා |
| පුස්තකාල පොත් | 25% |
| ගොඩනැගිලි | 2% සිට 5% දක්වා |

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

***හානිකරණය***
සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

**(ඇ) කල්බදු**
වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරීත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සඵල ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ

**(ඈ) ආයෝජන**
මෙම ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරවලින් සමන්විත වේ.

i. **ස්ථාවර තැන්පතු**
ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රාකාශනයෙහි දිනට උපචිත වන පොළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ

ii. **භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්**
භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### *2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

**ආයෝජන (තවදුරටත් ...)**

iii. **භාණ්ඩාගාර බැඳුම්කර**

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ.

iv. **සාංගමික ණයකර**

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් දක්වා කල් තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලැබේ

**(ඉ) තොග**

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රයකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

**(ඊ) අය විය යුතු දෑ**

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩව සිදු කෙරන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

**(උ) මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු, සාංගමික ණයකර සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹ ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

**(ඌ) බැරකම් සහ ප්‍රතිපාදන**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධීවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

*2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

**(එ) සේවක ප්‍රතිලාභ**

i. **නිර්වචිත දායක සැලසුම්**
ආයතනයෙහි සියලු ම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. **නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**
ආයතනය විසින් ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාර්තෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

**(ඒ) ආදායම් හඳුනාගැනීම**

i. **ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය**
ශ්‍රී. ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. **ව්‍යාපෘති ආදායම**
ව්‍යාපෘති ආදායම ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් ගිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. **සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම**
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv. **පොළී ආදායම**
පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

**(ඔ)**

i. **ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම**
ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. **පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම**
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

2 **ශ්‍රී ලංකා රජයයෙන් ලැබුණු ප්‍රදාන**

වර්ෂ 2022ට පෙර ආයතනයෙහි උපයෝගීතා, නඩත්තු සහ ආදයම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයයෙන් ප්‍රදාන ලැබුණි. මෙම වසරේ සහ මීට පෙර වසරේදී කිසිම ප්‍රදානයක් නොලැබුණි.

| | | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 3 | **ව්‍යාපෘති ආදායම** | | |
| | ආයතන වලින් ලැබුණු ආදායම | 153,581.469 | 277,798.785 |

4 **ආයෝජන ආදායම**

| | 2024 | 2023 |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලැබුණු පොලී ආදායම | 87,296,971 | 73,192,868 |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබුණු පොලී ආදායම සහ REPO | 12,351,836 | 48,148,178 |
| ස්ථාවර තැන්පතු වලින් ලැබුණු පොලී ආදායම | 9,571,562 | 7,154,733 |
| සාංගමික ණයකරවලින් ලැබුණු පොලී ආදායම | 3,230,884 | 1,616,281 |
| පොලී ආදායම - වෙනත් | 479,894 | 606,910 |
| | 112,931,147 | 130,718,970 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 5 | **විවිධ ආදායම්** | රු. | රු. |
| | ප්‍රකාශන අලෙවි කිරීම | 690,330 | 708,373 |
| | තැපැල් ගාස්තු | 800 | 18,530 |
| | සම්මන්ත්‍රණ ශාලා වෙන්කිරීම්වලින් ලැබුණු ආදායම | 276,327 | 802,875 |
| | විනිමය වෙනස්කම්වලින් ලැබුණු ආදායම / (පාඩුව) | (412,554) | (64,343) |
| | වෙනත් ආදායම් | 833,754 | 1,768,694 |
| | | 1,388,657 | 3,234,129 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 6 | **සේවක පිරිවැය** | රු. | රු. |
| | ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප් | 99,880,887 | 89,418,864 |
| | සේ.අ.අ. | 11,929,885 | 10,662,644 |
| | සේ.නි.භා.අ. | 2,982,471 | 2,665,661 |
| | කෙටි කාලීන සේවක පිරිවැය | 5,840,307 | 5,177,166 |
| | අධ්‍යක්ෂ ගාස්තු සහ දීමනා | 601,000 | 744,667 |
| | සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු | 3,060,138 | 2,896,340 |
| | වෙනත් ප්‍රතිලාභ | 767,220 | 1,142,729 |
| | පාරිතෝෂික සඳහා වෙන් කිරීම් (සටහන 19) | 6,470,029 | 11,529,290 |
| | | 131,531,937 | 124,237,361 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 7 | **පර්යේෂණ පිරිවැය** | රු. | රු. |
| | මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු | 167,386 | 4,879,196 |
| | අන්තර්ජාල ගාස්තු සහ මෘදුකාංග | 4,377,776 | 5,650,674 |
| | උපදේශක ගාස්තු | 1,648,166 | 20,596,649 |
| | කාර්ය මණ්ඩල දිරි දීමනා | 29,597,875 | 20,650,189 |
| | ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය | 33,945,270 | 13,694,962 |
| | ජාත්‍යන්තර ගමන් | 4,529,789 | 4,239,335 |
| | ජාලගතකිරීම සහ උපකරණ | 5,810,524 | 9,751,569 |
| | වෙනත් පර්යේෂණ පිරිවැය | 7,542,645 | 7,419,055 |
| | | 87,619,431 | 86,881,629 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 8 | **වෙනත් මෙහෙයුම් වියදම්** | re' | re' |
| | ලියාපදිංචි සහ සාමාජික ගාස්තු | 810,977 | 724,800 |
| | කාර්යාල පිරිවැය | 1,532,136 | 1,580,344 |
| | සාමාන්‍ය කාර්යාල පිරිවැය | 2,099,974 | 1,575,982 |
| | වෘත්තීයවේදී සහ නීති ගාස්තු | 3,693,206 | 4,307,798 |
| | ජාල සහ සර්වර් නඩත්තු කිරීම (සටහන 8.1) | 12,424,346 | 7,374,673 |
| | බාහිර විගණන ගාස්තු | 329,520 | 322,800 |
| | වෙළඳ දැන්වීම් | 28,350 | 4,800 |
| | බැංකු ගාස්තු / කොමිස් | 167,610 | 216,329 |
| | අඩමාන ණය සදහා ප්‍රතිපාදන | (116,45 | 116,456 |
| | වෙනත් පරිපාලන සම්බන්ධ වියදම් | 1,059,613 | 769,957 |
| | රැස්වීම් වියදම් - සේ.නි.හා.අ. | 355,886 | 484,028 |
| | | 22,385,162 | 17,477,967 |

8.1 ජාල සහ සර්වර් නඩත්තු වියදම්වලට සේවා පද්ධති නඩත්තු ගිවිසුමෙහි ක්‍රමක්ෂය කළ පිරිවැය ඇතුළත් වේ. සටහන් කර ඇති පිරිවැය තුළ නව ගිවිසුම යටතේ 2023 ඔක්තෝම්බර් සිට 2025 දක්වා වූ ගාස්තු අන්තර්ගත වේ. (2023: 2021 ඔක්තෝබර් සිට 2023 ඔක්තෝබර් දක්වා සහ නව ගිවිසුම 2025 දක්වා වලංගු වේ).

**9. ආදායම් බදු වියදම**

**ප්‍රවර්තන බදු වියදම**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුව, ආයෝජන වලින් ලැබෙන ආදායම 14% ක ආදායම් බද්දකට යටත් වේ. ඒ අනුව 2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂයෙහි ආදායම් බදු සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත:

| | *2024* |
|---|---|
| | *රු.* |
| ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය (පොළී ආදායම) | 99,034,005 |
| වෙනත් පොළී ආදායම් | 112,931,147 |
| ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන ලාභ මත බද්ධ - සේ.නි.හා.අ | 37,679 |
| | 212,002,831 |
| 2024 ආයෝජනයෙන් ලැබුණු ආදායම 14% | 29,675,121 |
| ප්‍රාග්ධන ලාභ බද්ධ 10% | 3,768 |
| | 29,678,889 |
| මුළු ආදායම් බදු පිරිවැය | 29,678,889 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 10 | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | රු. | රු. |
| | බැංකුවේ ඇති මුදල් | 1.347.161 | 1,539,649 |
| | සුළු මුදල් | 130,000 | 130,000 |
| | ආයතනික ණය කාඩ්පත | - | - |
| | බැංකුවේ ඇති මුදල - අරමුදල් කළමනාකරු සතුව | 1,114,882 | 53,052 |
| | **<u>මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන</u>** | | |
| | ස්ථාවර තැන්පතු සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම | 3,000,000 | - |
| | ප්‍රතිමිලදී ගැනීම් - කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල | - | 44.662.00 |
| | ස්ථාවර තැන්පතු | 7,500,000 | |
| | භාණ්ඩාගාර බිල්පත් | 47,677,986 | 79,123,713 |
| | ස්ථාවර තැන්පතු - SK ප්‍රදාන | 2,564,701 | |
| | | 63,334,730 | 125,508,414 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 11 | **ආයෝජන - කෙටි කාලීන** | රු. | රු. |
| | භාණ්ඩාගාර බිල්පත් | 34,630,411 | 21,848,309 |
| | ස්ථාවර තැන්පත් | 5,250,000 | 250,000 |
| | සාංගමික ණයකර | - | 5,000,000 |
| | | 39,880,441 | 27,098,309 |

**ආයෝජන - දීර්ඝ කාලීන**

දීර්ඝ කාලීන ආයෝජන කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලබන පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ:

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| භාණ්ඩාගාර බැඳුම්කර | 573,903,750 | 534,212,390 |
| භාණ්ඩාගාර බැඳුම්කර - කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල | 10,000,000 | 5,000,000 |
| සාංගමික ණයකර | 48,250,000 | 20,000,000 |
| ස්ථාවර තැන්පතු - පාරිතෝෂික අරමුදල | 32,000,000 | 32,000,000 |
| | 664,153,750 | 591,212,390 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 12 | **වෙළඳ ලැබිය යුතු දෑ** | රු. | රු. |
| | වෙළඳ ලැබිය යුතු ව්‍යාපෘති | 7,180,132 | 4,088,401 |
| | බොල් ණය සඳහා වෙන් කිරීම් | - | (116,456) |
| | බිල්පත් සකස් කරමින් පවතින | 9,099,315 | 2,086,018 |
| | | 16,279,447 | 6,057,963 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 13 | **තැන්පතු සහ පූර්ව ගෙවීම් - කෙටි කාලීන** | රු. | රු. |
| | පූර්ව ගෙවීම් (සටහන 13.1) | 18,927,443 | 8,789,599 |
| | තැන්පතු | 1,214,950 | 1,211,950 |
| | අත්තිකාරම්- සේවකයින් (ගමන් ආශ්‍රිත) | 131,951 | - |
| | වෙනත් සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | 1,307,056 | 21,250 |
| | | 21,581,400 | 10,022,799 |

| | 2024 | 2023 |
|---|---|---|
| **තැන්පතු සහ පූර්ව ගෙවීම් - දීර්ඝ කාලීන** | රු. | රු. |
| පූර්ව ගෙවීම් - සර්වර් නඩත්තුව | 4,567,130 | - |
| පූර්ව ගෙවීම් - මෘදුකාංග බලපත්‍ර ගාස්තු | 2,564,842 | 119,157 |
| | 7,137,972 | 119,157 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 13.1 | **පූර්ව ගෙවීම්** | රු. | රු. |
| | වෛද්‍ය රක්ෂණය | - | 1,038,577 |
| | වෙනත් රක්ෂණ | 697,555 | 966,639 |
| | වෙනත් පූර්ව ගෙවීම් | 1,402,281 | 1,227,530 |
| | නඩත්තු කිරීම් - **කෙටිකාලීන** | 1,363,443 | 1,630,780 |
| | මෘදුකාංග බලපත්‍ර ගාස්තු - කෙටි කාලීන | 6,304,692 | 3,926,042 |
| | සර්වර් නඩත්තුව - කෙටි කාලීන | 9,159,472 | - |
| | | 18,927,443 | 8,908,756 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 14 | **ලැබිය යුතු පොලී** | රු. | රු |
| | ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම | 178,415 | - |
| | ස්ථාවර තැන්පතු | 16,761,425 | 7,149,699 |
| | ස්ථාවර තැන්පතු | 669,150 | 6,703,572 |
| | භාණ්ඩාගාර බිල්පත් | 24,755,426 | 23,201,016 |
| | ආයතනික ණයකර | 3,256,225 | 2,048,664 |
| | | 45,442,803 | 39,281,367 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 15 | **වෙනත් ලැබිය යුතු** | | |
| | කාර්ය මණ්ඩල ණය ගැතියෝ | 5,325,667 | 5,771,741 |
| | අය විය යුතු වෙනත් මුදල් (සටහන (15.1) | 98,928,716 | 122,794,228 |
| | | 104,254,383 | 128,817,969 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 15.1 | **අය විය යුතු වෙනත් මුදල්** | රු. | රු. |
| | ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු මුදල් | 98,928,716 | 122,794,228 |

# ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 16 දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් | ගොඩනැගිලි | පරිගණක උපකරණ | මෝටර් වාහන | ලීබඩු සහ සවිකිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 156,000,000 | 350,830,706 | 139,063,379 | 29,615,195 | 20,021,741 | 29,836,697 | 1,733,679 | 727,101,397 |
| එකතු කිරීම් | - | 12,220,309 | 2,781,000 | - | 216,176 | 1,067,034 | 3,000 | 16,287,519 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 156,000,000 | 363,051,015 | 98,697,923 | 29,615,195 | 19,965,411 | 25,404,287 | 1,730,529 | 656,272,081 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | - | 83,976,598 | 112,818,454 | 18,636,743 | 19,643,142 | 24,124,572 | 1,731,657 | 260,931,166 |
| අගය ක්ෂය කිරීම් ගාස්තු | - | 7,856,354 | 7,257,299 | 2,814,094 | 106,202 | 899,594 | 1,334 | 18,934,877 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 91,832,952 | 120,075,753 | 21,450,837 | 19,749,344 | 25,024,166 | 1,732,991 | 279,866,043 |
| 2024 දෙසැම්බර් 31 වැනි දිනට | 156,000,000 | 271,218,063 | 21,768,626 | 8,164,358 | 488,573 | 5,879,565 | 3,688 | 463,522,873 |

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

16 දේපළ, පිරියත සහ උපකරණ (තවදුරටත් ...)

| | ඉඩම් | ගොඩනැගිලි | පරිගණක උපකරණ | මෝටර් වාහන | ලීබඩු සහ සවිකිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 156,000,000 | 324,858,736 | 137,916,389 | 29,615,195 | 19,965,411 | 29,799,063 | 1,731,829 | 699,886,623 |
| එකතු කිරීම් | - | 25,971,970 | 1,146,990 | - | 73,600 | 163,183 | 1,850 | 27,357,593 |
| අඩුකළා - බැහැර කිරීම් | - | - | - | - | - | (484,510) | - | (142,820) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 156,000,000 | 350,830,706 | 139,063,379 | 29,615,195 | 20,021,741 | 29,836,696 | 1,733,679 | 727,101,397 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | - | 77,093,305 | 105,540,052 | 6,938,900 | 19,236,674 | 22,113,946 | 1,714,158 | 176,231,934 |
| අගය ක්ෂය කිරීම් ගාස්තු | - | 6,883,293 | 7,278,402 | 2,873,140 | 83,904 | 866,231 | 1,596 | 17,986,566 |
| අඩුකළා - බැහැර කිරීම් | - | - | - | - | (17,270) | (125,550) | - | (142,820)) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 83,976,598 | 112,818,454 | 18,636,743 | 19,643,142 | 24,124,572 | 1,731,657 | 260,931,166 |
| **2023 දෙසැම්බර් 31 වැනි දිනට** | 156,000,000 | 266,854,108 | 26,244,925 | 10,978,452 | 378,599 | 5,712,124 | 2,022 | 466,170,231 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 17 | **ලැබිය යුතු වෙළඳ හා වෙනත් දෑ** | රු. | රු. |
| | උපචිත (සටහන 17.1) | 18,001,053 | 31,451,197 |
| | සේ.භා.අ. සහ සේ.නි.භා.අ. ගෙවිය යුතු | 1,925,847 | 1,768,828 |
| | ගෙවිය යුතු උපයන විට බදු | 5,487,025 | 2,862,130 |
| | ගෙවිය යුතු මුද්දර බදු | 4,075 | 4,100 |
| | ගෙවිය යුතු ආදායම් බදු | 10,772,351 | 12,089,836 |
| | ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බද්ද | 2,560 | 64,160 |
| | ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත | 219,057 | 121,498 |
| | | 17,169,606 | 6,709,020 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 17.1 | **උපචිත** | රු. | රු. |
| | කාර්යාල පිරිවැය | 4,831,639 | 6,660,667 |
| | බාහිර විගණන ගාස්තු - IPS | 252,000 | 612,840 |
| | වෘත්තීය සහ නීති ගාස්තු - IPS | 527,844 | 598,258 |
| | වෘත්තීය සහ නීති ගාස්තු - ETF | 185,000 | 212,889 |
| | විදුලිය ගාස්තු | 408,143 | 564,767 |
| | දුරකථන / අන්තර්ජාල ගාස්තු | 429,210 | 501,407 |
| | ඉන්ධන | 60,671 | 71,677 |
| | පර්යේෂණ ව්‍යාපෘති වියදම් | 11,306,546 | 22,231,039 |
| | | 18,001,053 | 31,451,197 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 18 | **ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම්** | රු. | රු. |
| | ජනවාරි 01 දිනට ශේෂය | 60,231,081 | 107,413,221 |
| | වර්ෂය තුළ ලැබීම් | 180,009,297 | 239,104,657 |
| | වර්ෂය තුළ ගෙවීම් | (69,582,961) | (23,705,220) |
| | හඳුනාගත් ආදායම් | (126,661,674) | (262,581,577) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 43,995,743 | 60,231,081 |

| | | 2024 | 2023 |
|---|---|---|---|
| 19 | **සේවක ප්‍රතිලාභ** | රු. | රු. |
| | ජනවාරි 01 දිනට ශේෂය | 40,357,628 | 28,828,338 |
| | වර්ෂය තුළ හඳුනාගත් වියදම් (සටහන 19.1) | 6,470,029 | 11,529,290 |
| | වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | (1,687,500) | - |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 45,140,157 | 40,357,628 |

2024 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 45 ක් වේ (2023:48).
2024 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 45 ක් වේ (2023:48).
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

| | |
|---|---|
| වට්ටම් අනුපාතිකය | 11% (2023: 13%) |
| වැටුප් අනුපාතිකයෙහි වර්ධනය | 8% (2023: 10%) |
| කාර්ය මණ්ඩල ඉවත්වීමේ අනුපාතය | 17% (2023: 18%) |

| 19.1 **වර්ෂය තුළ හඳුනාගත් වියදම්** | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 3,110,837 | 2,826,296 |
| පොලී පිරිවැය | 5,246,492 | 5,189,101 |
| ආයුගණක (ලාභය)/පාඩුව | (1,887,300) | 3,513,893 |
| | 6,470,029 | 11,529,290 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

20 **කල් බදු වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2023:නැත)

21 **ප්‍රාග්ධන වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2023:නැත)

22 **සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**

ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2024 දෙසැම්බර් 31 දිනට රු. 510,339,323/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2023 රු. 510,340,323/-). භාර අරමුදලේ මුළු ආදායම IPS වෙත ලබා දෙන අතර භාර අරමුදලේ කළමනාකරණ වියදම් IPS විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ. ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර එය වෙන වෙනම විගණනය කරනු ලැබේ. ආයෝජන භාර අරමුදල සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් දෙදෙනෙකු නිල බලයෙන් සාමාජිකයින් වේ (IPS හි සභාපති සහ විධායක අධ්‍යක්ෂ)

**ප්‍රධාන කළමනාකරණ පිරිස් ("KMP")**

"ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්" පිළිබඳ SLPSAS 14 ට අනුව, KMP යනු ආයතනයේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරී බලය සහ වගකීම දරන පුද්ගලයින් වේ.

IPS කාර්ය මණ්ඩල පිරිවැයට (සටහන 6) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන ලද වැටුප් රු. 40,935,288/- (2023: රු. 37,771,128/-) ඇතුළත් වේ.

**22.3** **අනෙකුත් අදාළ පාර්ශවයන්**

2022 ට පෙර, ආයතනයේ උපයෝගිතා, නඩත්තු සහ ආදායම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයෙන් ආයතනයට ප්‍රදානයක් ලැබුණි. වත්මන් වර්ෂයේ සහ පෙර වර්ෂයේ දී කිසිදු ප්‍රදානයක් නිකුත් කර නොමැත. මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති හෝ ඔවුන් විසින් නම් කරන ලද නිලධාරියෙකු සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා IPS මණ්ඩලයේ නිල බලයෙන් පත් කරන ලද සාමාජිකයින් වේ.

23 **අවිනිශ්චිත වගකීම්**

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

24 **මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

25 **පාලක මණ්ලයේ වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

6 7 මුළු වියදම්

8
ශ්‍රවණාගාරය කුලියට ගැනීම
දේපල, කම්හල් සහ උපකරණ ක්ෂය වීම 16 වර්ෂය සඳහා ක්ෂය වීමෙන් පසු අතිරික්තය

ආදායම් බදු වියදම 9

බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*දෙසැම්බර් 31 වැනි දිනට*

26. S ***ඇස්තමේන්තුව සහ තත්‍ය සංඛ්‍යාලේඛණ සංසන්දනය කිරීමේ ප්‍රකාශය***

| සංශෝධිත අයවැය **2024** | | සටහන් | තථ්‍ය **2024** | **2023** |
|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | - | - |
| 142,534,239 | ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන | 2 | 153,581,469 | 277,798,785 |
| 113,115,434 | ව්‍යාපෘති ආදායම | 3 | 112,931,147 | 130,718,970 |
| 93,182,383 | පොදු ආදායම | 4 | 99,034,005 | 122,809,517 |
| 600,000 | ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය | 22 | 282,040 | 606,025 |
| 3,134,481 | ලැබුණු ශුවණාගාර කුලියට දීමෙන් ලැබුණු ආදායම | | 1,388,657 | 3,234,129 |
| **352,566,537** | විවිධ ආදායම | 5 | **367,217,318** | 535,167,426 |
| | **මුළු ආදායම** | | | |
| 128,978,819 | | | 131,531,937 | 124,237,361 |
| 68,416,435 | **වියදම්** | | 87,619,431 | 86,881,629 |
| 22,014,680 | සේවක පිරිවැය | 6 | 23,781,586 | 22,568,285 |
| 21,823,948 | පර්යේෂණ පිරිවැය | 7 | 22,385,162 | 17,477,967 |
| 750,000 | උපයෝගිතා වියදම් | | 319,526 | 340,244 |
| 270,000 | ශුවනක් මෙහෙයුම් වියදම් | 8 | 153,219 | 124,655 |
| | ගමන් වියදම් | | | |
| | ශුවණාගාර කුලියට දීම | | | |
| **242,253,882** | මුළු වියදම් | | **265,790,861** | 251,630,141 |
| **110,312,655** | **වර්ෂය සඳහා වත්මන් අතිරික්තය** | | **101,426,457** | 283,537,285 |
| 17,394,669 | දේපළ, පිරියත සහ උපකරණ | 16 | 18,934,877 | 17,986,566 |
| **92,917,986** | වර්ෂය සඳහා ක්ෂය වීමෙන් පසු අතිරික්තය | | **82,491,580** | 265,550,719 |
| 28,881,694 | ආදායම් බදු වියදම | 9 | 29,678,889 | 35,558,147 |
| **64,036,292** | බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය | | **52,812,691** | 229,992,572 |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ/ඩී/අයිපීඑස්/එෆ්එස්/2024 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩී.එච්.ඩී ධර්මපාල

විගණකාධිපති (වැ.බ)

පිටපත - 01.ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. එල්එස්ඩබ්/ඩී/අයිපීඑස්/එෆ්එස්/2024 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 30 දින |

සභාපති,
ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

**ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මූල්‍ය උපකරණ(financial Instruments) වර්ගීකරණය කිරීම( classification) ,ඉදිරිපත් කිරීම (presentation) , මිනුම්කරණය ( measurement) , හෙළිදරව් කිරීම ( disclosure) සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති බැවින්, ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරමින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ( accounting policy) ගොඩනඟා තම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවද , ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ලබා ගත් බැංකු සනාථන ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.50,000 ක් වී තිබුණු අතර ඉතුරුම් ගිණුමේ ශේෂය රු.3,595,838 ක් විය.නමුත් බැංකු සැසඳුම සකස් කිරීමේදී 2024 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.3,645,838 ක් ලෙස ගෙන තිබුණත්,බැංකුව විසින් ලබා දී තිබූ බැංකු සනාථන අනුව ශේෂය රු.50,000 ක් වී තිබුණි. ඉතුරුම් ගිණුමේ රු.3,595,837 ක් වූ ශේෂය අතේ ඇති මුදල් ශේෂය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

යටතේ (Cash and cash equivalents ) ගිණුම් ඉදිරිපත් කිරීමේ දී දක්වා නොතිබුණු අතර, ඉතුරුම් ගිණුමෙන් ලද පොළී මුදල වූ රු.179,823 ක් පමණක් වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමහ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල,පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීති, රිති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/1 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතෙහි 3.1 ඡේදය | ආයතනය සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් නොමැති අතර ආයතනය විසින් සකසා ඇති මෙහෙයුම් අත්පොතට අනුකූලව අවුරුද්දක හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලයක් සේවයේ යොදවා ගෙන තිබුණි. |

ජී.එච්.ඩී ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

4

**ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය**
**විගණන වාර්තාව සඳහා ප්‍රතිචාර**
**LSW/D/IPS/FS/2024**

**මූල්‍ය ප්‍රකාශන විගණනය 2024**

1.2

**(අ)** මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති නොමැතිකම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මූල්‍ය උපකරණ පිළිබඳ ස්වකීය ගිණුම්කරණ ප්‍රතිපත්තිය සඳහන් කර ඇති '1.3(ඈ) වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය' කොටස බලන්න. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය මගින් මූල්‍ය උපකරණ වර්ගීකරණය, ඉදිරිපත් කිරීම, මිනුම්කරණය සහ හෙළිදරව් කිරීම සිදු කරන ආකාරය මූල්‍ය ප්‍රකාශනයෙහි පැහැදිලි කර ඇත.

**(ආ)** පොදු ලෙජරයේ සහ බැංකු සනාථනවල සටහන් කර ඇති බැංකු ගිණුම් ශේෂය අතර විෂමතාවය.

අංක 1100651701 දරන ජංගම ගිණුමෙහි සහ අංක 8110035963 දරන ඉතුරුම් ගිණුමෙහි ශේෂයන් අංක 2515 පොදු ලෙජර ගිණුමෙහි සටහන් කර ඇත. ගනුදෙනු ක්‍රියාවලිගත කිරීමේ කාල වෙනස්කම් හේතුවෙන් බැංකු ප්‍රකාශනයට අනුව පොදු ලෙජරයෙහි ශේෂය සහ බංකු ප්‍රකාශනයෙහි ශේෂය අතර වෙනස්කම් තිබිය හැකි ය. එවැනි වෙනස්කම් මාසිකව සසඳනු ලබන අතර, එම බැංකු සැසඳුම් සමාලෝචනය සඳහා විගණකවරුන්ට ලබා දෙන ලදී. වසර අවසාන ගිණුමෙහි පොදු ලෙජරය අනුව ශේෂයන් ඇතුළත් වන අතර, ඒ අනුව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් '10 වෙනි සටහන' යටතේ 'මුදල් සහ මුදල් හා සමාන දෑ' සහ 'බැංකුවේ ඇති මුදල්' ලෙස ජංගම සහ ඉතුරුම් ගිණුම්වල ශේෂයන් ඉදිරිපත් කර ඇත. අවසාන ගිණුම් සකස් කිරීමේදී ඉතිරිකිරීමේ ගිණුම් ශේෂය මගහැරී නොමැති බව කරුණාවෙන් සලකන්න.

**2. අනෙකුත් නීති, රීති, රෙගුලාසි වලට අනුකූල වීම**

**2.2.2 කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව කළමනාකරණය කිරීම**

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හේතු දෙකක් නිසා අනුමත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන නොයයි. පර්යේෂණ ව්‍යාපෘති ආදායම් ඉපැයීම මත බෙහෙවින් රඳා පවතින එහි අරමුදල්වල ස්වභාවය ඉන් පළමුවැන්නයි. ප්‍රතිපත්ති පරිසරය සහ පරිත්‍යාගශීලීන්ගේ උනන්දුව ඇතුළු හේතු ගණනාවක් නිසා ව්‍යාපෘති ආදායම් අස්ථාවර තත්ත්වයක පවතියි. රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා වෙනස් වන විට පර්යේෂණ ක්ෂේත්‍ර ද වෙනස් වීම ඉන් දෙවැන්නයි. මෙම සාධක දෙක නිසා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ස්වකීය කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඵලදායී හා පිරිවැය-ඵලදායී වන පරිදි ගළපා ගැනීම පිණිස නම්‍යශීලීභාවයක් රඳවා ගැනීමට අවශ්‍ය වේ. මෙම කරුණු දෙකම වසර ගණනාවක් පුරා පුළුල් ලෙස සාකච්ඡා කර ඇති අතර, 2015 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශ විගණන කමිටුවේදී එය සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට අනුමත සේවක සංඛ්‍යාවක් තිබීම අවශ්‍ය නොවන බවට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පසුව එකඟ වූහ.

IPS ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
ටෙලි: +94 11 2143100 • ෆැක්ස්: +94 11 2665065
ඊමේල්: ips@ips.lk • වෙබ් පිටුව: www.ips.lk
බ්ලොග්: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
ට්විටර්: www.twitter.com/TalkEconomicsSL
ෆේස්බුක්: www.facebook.lk/instituteofpolicystudies